2022

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT



ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்
SRI LANKA SURVEY DEPARTMENT

2022 වසර සඳහා සර්වේයර් ජනරාල්ගේ කාර්යසාධන වාර්තාව
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංක - 288

පටුන

පිටුව

1.0 ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම **1**
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු **3**
1.3 මූලික කාර්යයන් **4**
1.4 සංවිධාන සටහන **6**
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ **7**

2.0 ප්‍රගතිය සහ අනාගත දැක්ම **8**

3.0 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය **9**

4.0 කාර්යසාධන දර්ශක **16**

5.0 තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **18**

6.0 මානව සම්පත් පැතිකඩ **19**

7.0 අනුකූලතා වාර්තාව **24**

8.0 සමාප්තිය 28

9.0 ඇමුණුම්

i සර්වේයර් ජනරාල් කාර්යාලයේ ශාඛාවන් මගින් ඉටුකළ කාර්යයන් (පිටු i - xx)

ii ක්ෂේත්‍ර කාර්යාල මගින් ඉටුකළ කාර්යයන් **(පිටු i - ix)**

iii මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් ඉටුකළ කාර්යයන් **(පිටු i - ii)**

iv විගණකාධිපති වාර්තාව (පිටු **1-10**)

1.0 ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ග්‍රීක ජාතික ක්ලෝඩියස් ටොලමි විසින් ක්‍රි.ව.139 හෝ ඊට ආසන්න කාලයේ සිතියමක් ලෙස නිරූපණය කර ඇති ශ්‍රී ලංකාව අතීතයේ තැප්‍රොබේන්, සෙරන්ඩිබ් යන විවිධ නම් වලින් හැඳින්වූ අතර, මෙරටට ආවේණික වූ මුතු මැණික්, කුළු බඩු ආදිය සහ ජෛව විවිධත්වය හේතුවෙන් ලෝක සිතියමේ ඉස්මතු කර පෙන්වීමෙන්ම එවකට ලංකාවේ පිහිටීමේ වැදගත්කම මොනවට පැහැදිලි වේ. කෘෂිකාර්මික සශ්‍රීක බව නිසා පෙරදිග ධාන්‍යාගාරය, ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙසද හැඳින්වූ අප මාතෘ භූමියේ ප්‍රථම රාජ්‍ය දෙපාර්තමේන්තුව ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුව ක්‍රි.ව.1800 අගෝස්තු 02 දින ගාල්ලේදී පිහිටවූ අතර ජෝශප් ජොන්විල් මහතා එහි ප්‍රථම සර්වේයර් ජනරාල්වරයා විය. මෙරට ප්‍රවාහනය, පරිපාලනය හා ඉඩම් පරිහරණය සඳහා අවශ්‍ය වූ මැනුම් කටයුතු සිදු කර ගැනීම ඉංග්‍රීසි ආධිපත්‍යය යටතේ මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්යභාරය වූ අතර එවකට තිබුණු අවම පහසුකම් යටතේ වුවද වඩාත් නිවැරදිව මැනුම් කටයුතු සිදු කර ඇති බව පැරණි ලේඛන පරිශීලනය කිරීමෙන් තහවුරු වේ.

වසර 222ක් පුරාවට කලින් කලට වෙනස් වූ තාක්ෂණික ක්‍රියාවලීන් තුළින් පරිපූර්ණ වූ මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ජාතික මැනුම් සහ සිතියම් නියෝජිත ආයතනය ලෙස ක්‍රියා කරමින් ශ්‍රී ලංකාවේ සියලුම මැනුම් සහ සිතියම් ප්‍රමිතිකරණය හා නිෂ්පාදන වගකීම දරයි. මේ වන විට අධි තාක්ෂණික උපකරණ භාවිතා කර ඉහළ නිවැරදිතාවයෙන් යුත් දත්ත භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය වෙනුවෙන් ඉටු කරන කාර්යභාරය හේතුවෙන් ‘‘සංවර්ධනයේ නිහඬ පෙරගමන්කරු’’ බවට පත්වී සිටින අතර රජයේ සංවර්ධන කටයුතුවලට අවශ්‍ය මැනුම් හා සිතියම්කරණ කාර්යයන් වඩා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදු කරමින් සිටී. එමෙන්ම, ශ්‍රී ලංකාවේ බොහෝ සංවර්ධන කටයුතු වලදී අවශ්‍ය වන භූගෝලීය තොරතුරු සැපයීමේ පුරෝගාමියා බවටද පත් වී ඇත.

දේශීය - විදේශීය පුහුණුව ලත් විවිධ සේවාවන්ට අයත් නිලධාරීන්ද ඇතුළු හයදහසකට ආසන්න නිලධාරීන් පිරිසක් සර්වේයර් ජනරාල් කාර්යාලය ඇතුළු පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල සේවය කරමින් රජයේ හා මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන අතර, දියතලාවේ පිහිටුවා ඇති මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මඟින්, දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ආධුනිකයින් පුහුණු කිරීම මෙන්ම දැනට සේවය කරනු ලබන නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කරමින් වෘත්තීය නිපුණත්වයෙන් යුත් නිලධාරීන් පිරිසක් බිහි කිරීම ඉටුකරන අතරම විවිධ ආයතන වල නිලධාරීන් සඳහා දිශානු ගත කිරීමේ පුහුණු පාඨමාලා පවත්වනු ලබයි.

මැනුම් පනත යටතේ, සර්වේයර් ජනරාල් වෙත පැවරී තිබෙන බලතල අනුව රජයේ සංවර්ධන යෝජනා ක්‍රම සඳහා සැලසුම් සකස් කිරීමට අදාල විශ්ලේෂණ කටයුතු සඳහා දත්ත රැස් කිරීම හා අදාල පාර්ශවයන් වෙත සැපයීම සිදු කරනු ලැබේ. ඒ අනුව, මෙරට අවශ්‍යතාවයන්ට අනුව සැලසුම් කළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් මැනීම විශේෂ ව්‍යාපෘති මැනුම් යටතේ සිදු කරනු ලබන අතර ඊට අමතරව, මහජනතාවට හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ‘‘බිම්සවිය’’ වැඩසටහන යටතේ සිදු කරනු ලබන මැනුම්, ඉඩම් ප්‍රදානය කිරීම සඳහා මැනුම්, පුරාවිද්‍යාත්මක භූමි වල ආරක්ෂාව සඳහා අවශ්‍ය වන මැනුම්, ආපදා කළමනාකරණය, අපරාධ පරීක්ෂණ කටයුතු සඳහා සිදු කරනු ලබන මැනුම්, උසාවි කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් මැනුම් යනාදී වශයෙන් විවිධ මැනුම් කටයුතු සඳහා දායකත්වය සපයමින් එම මැනුම්වල නිරවද්‍යතාවය පවත්වා ගැනීමටද ක්‍රියාකරයි. එමෙන්ම, භූමි පාලන ලක්ෂ්‍ය පිහිටුවීම සඳහා මැනුම් කිරීමද ශ්‍රී ලාංකීය ජනතාවගේ සංස්කෘතික උරුමය හා බැඳුණු ජාතික සමගියට අනුබලයක් වන නිවැරදි වූත්, නිශ්චිත වූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතිකරණය තුළින් පවත්වා ගෙන යාමද සිදු කරයි.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන තවත් ප්‍රමුඛතම කාර්යයක් වන්නේ ජාතික සිතියම් අවශ්‍යතාව අනුව සිතියම් සැකසීමයි. ජාතික සිතියම් සංග්‍රහය, පාසල් සිතියම් සංග්‍රහය, 1:50,000 හා 1:10,000 පරිමාණයේ භූ ලක්ෂණාත්මක සිතියම්, තේමා සිතියම් හා මහජනතාවගේ අවශ්‍යතාවලට සරිලන ආකාරයට සිතියම් සකස් කිරීම, ආරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය වන සිතියම් සැකසීම ද මේ අනුව සිදු කරනු ලබයි. මේ වන විට චන්ද්‍රිකා ඡායාරූප හා අනෙක් දත්ත මූලාශ්‍ර භාවිතා කරමින් 1:50,000 හා 1:10,000 පරිමාණයේ භූගෝලීය දත්ත පද්ධති නිර්මාණය කර යාවත්කාලීනව පවත්වාගෙන යයි. එසේම මහජනයාගේ විවිධ අවශ්‍යතා සඳහා මුද්‍රිත සිතියම් හා අංකිත දත්ත වශයෙන් ද භූගෝලීය තොරතුරු සැපයීම සිදු කරන අතර ඒවා ලබා ගත හැකි වන පරිදි පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ඇත. එමෙන්ම, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ පරීක්ෂා කොට තමන්ගේ අවශ්‍යතාව අනුව සිතියම් සකස්කරවා ගැනීමට සහ නිවසේ සිටම ඇණවුම් කොට කුරියර් සේවා යටතේ දෙපාර්තමේන්තු නිෂ්පාදන නිවසටම ගෙන්වා ගැනීමේ පහසුකම් ද සලසා ඇත.

දෙපාර්තමේන්තුව ආරම්භයේදී අඩු පහසුකම්වලින් යුතු උපකරණ භාවිතා කරමින් අවශ්‍ය මැනුම් කටයුතු සිදු කළද වර්තමානයේදී දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට ඉවහල්වන නවීන තාක්ෂණික දැනුම හා නවීන උපකරණ භාවිතා කරමින් හා ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ දත්ත පද්ධති, වෙබ් අඩවි නිර්මාණය කරමින් දෙපාර්තමේන්තුවේ සියලුම කටයුතු සම්බන්ධීකරණ හා පරිපාලන කටයුතු කාර්යක්ෂමව ඉටු කරමින් සිටී. ඒ අතරම නිලධාරීන්ගේ සුබ සාධනය සඳහාද විවිධ අන්දමින් ක්‍රියාකරමින් ආගමික කටයුතු, වෘත්තීය සමිති සහ අන්‍යෝන්‍යාධාර සමිති සඳහා කාර්යාල ඉඩ පහසුකම් ලබා දීමත්, පුස්තකාල පහසුකම් හා ක්‍රීඩා සමාජය මඟින් නිලධාරීන්ගේ හැකියාවන් දියුණු කර ගැනීමට අවස්ථාවන් ලබාදීමත් සිදුකර ඇති අතර දෙපාර්තමේන්තුවේ සංගීත කවය මගින් පසුගිය වසරේදී සංවිධානය කරන ලද “ මැනුම් ගී සර ” සංගීත ප්‍රසංගය නිලධාරීන්ගේ සංගීත හැකියාවන් එළිදැක්වීම, රසඥතාව වර්ධනය කිරීම මෙන්ම මානසික සැනසුමක් ලබාදීමටද බෙහෙවින් ඉවහල් විය.

දෙපාර්තමේන්තුවේ යහපැවැත්ම හා අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන විවිධ සේවාවන්ට අයත් නිලධාරීන් 6,000 කට ආසන්න පිරිසකට මහ පෙන්වමින් දැනට කටයුතු කරනු ලබන්නේ 53 වන සර්වේයර් ජනරාල්වරයායි.

1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

ඉඩම් තොරතුරු සැපයීමේ සදා ප්‍රමුඛයා වීම

මෙහෙවර

වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම

අරමුණු

කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල සහ දියතලාවේ මැනුම් සහ සිතියම්ගත කිරීමේ ආයතනයෙන් සමන්විත දිවයින පුරා විසිරුණු කාර්යාල ජාලයක් මගින් දෙපාර්තමේන්තුවේ සේවාව පොදු මහජනයා වෙත ලබා දීමට කටයුතු සලසා ඇත. සමාලෝචනයට භාජනය වූ වසර තුළ මෙම කාර්යාල වල ක්‍රියාකාරීත්වය පහත සඳහන් අරමුණු කරා ඉලක්ක කරන ලදී.

- වාර්ෂික මැනුම් වැඩ සටහන, සිතියම්කරණ වැඩ සටහන සහ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පුහුණු වැඩ සටහන සම්පූර්ණ කිරීම
- කාර්ය මණ්ඩල පුහුණු කිරීම
- වර්ෂය තුළ නිම කිරීමට බලාපොරොත්තු වූ වැඩ සටහන් සඳහා අවශ්‍ය වූ නිශ්චල සහ චංචල වත්කම් ගොඩනගා පවත්වා ගෙන යාම
- මැනුම් වෘත්තියේ ප්‍රමිතීන් පාලනය හා පවත්වාගෙන යාම
- ලබාදෙන ලද රජයේ අරමුදල් වර්ෂය තුළ නිම කළ යුතුව තිබූ ඒ ඒ පරමාර්ථයන් සඳහා යෙදවීම
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විනය පවත්වා ගෙන යාම සහ සුභසාධනය පිළිබඳ කටයුතු කිරීම

1.3 මූලික කාර්යයන්

1. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ හා රජයේ ඉඩම් ආඥා පනත යටතේ ව්‍යවස්ථාපිත මැනුම් කර දීමනා පත්‍ර ලබා දීමට රේඛා චිත්‍ර නිකුත් කිරීමේ කටයුතු සිදුකිරීම
2. අධිවේගී මාර්ග, මාර්ග පුළුල් කිරීම, ගුවන් තොටුපලවල්, වරායවල් ආරම්භ කිරීම, සංචාරක ව්‍යාපෘති, බල ශක්ති ව්‍යාපෘති වැනි අතිවිශාල සංවර්ධන යෝජනා ක්‍රම සඳහා මූලික අවශ්‍යතාවයන් වන ඉඩම් මැනීම සහ අත්කරගැනීමේ මැනුම් කටයුතු සිදුකිරීම
3. ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් විවිධ අවශ්‍යතා යටතේ ලැබෙන මැනුම් ඉල්ලීම් අනුව මැනුම් සිදු කර අදාළ පිඹුරුපත් ඉදිරිපත් කිරීම
4. අධිකරණ අවශ්‍යතා අනුව උසාවි කොමිෂන් මැනුම් සිදු කිරීම, අදාළ අනුරේඛණ උසාවි වෙත ඉදිරිපත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී අධිකරණයේ පෙනී සිට සාක්ෂි ලබාදීම
5. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව දිවයිනේ පිහිටි සියලුම රජයේ හා පෞද්ගලික ඉඩම් මුදල් අය කිරීමකින් තොරව මැනීම් කර හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම අනුව කැඩැස්තර සිතියම් සකස් කර හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම
6. දෙපාර්තමේන්තුව ආරම්භයේ පැවති අහලට සැතපුමේ භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව ප්‍රතිස්ථාපනය කරමින් 1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, යාවත්කාලීන කිරීම, දිවයින සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි 1:10,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, තේමා හා විශේෂ කාර්යයන් සඳහා වූ සිතියම් සැකසීම සහ ප්‍රකාශයට පත් කිරීම
7. භාෂාත්‍රයෙන්ම ජාතික සිතියම් සංග්‍රහය සැකසීම
8. දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට සකසන ලද පැරණි පිඹුරු සුරක්ෂිතව තබා ගැනීම සහ මහජන අවශ්‍යතා සඳහා තමාගේ ඉඩමේ හිමිකම් පිඹුරුපතක් කඩිනමින් හා පහසුවෙන් ලබා ගැනීමේ පහසුකම් සැපයීම
9. ඉඩම් නිරවුල් කිරීමේ පනත යටතේ අවසාන ගම් පිඹුරු සහ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සකස් කිරීම
10. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට අදාල විභාග පැවැත්වීම
11. මුළු රටම ආවරණය වන පරිදි ක්‍රමානුකූලව ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම
12. ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා ඡායාරූප භාවිත කර මුළු රටම ආවරණය වන පරිදි භූගෝලීය දත්ත පද්ධතියක් සකසා යථාවත් කිරීම
13. 1952-2014 කාලය තුළ දෙපාර්තමේන්තුව මගින් ලබා ගත් ගුවන් ඡායාරූප සිතියම්කරණය, සංවර්ධන සැලසුම්, පාරිභෝගික අවශ්‍යතා ආදිය සඳහා භාවිතා කිරීමට හැකිවන පරිදි නිකුත් කිරීම
14. ආලෝක අනාවරණ හා පරාස තාක්ෂණය (LiDAR) ශ්‍රී ලංකාවට හඳුන්වා දීම හා එමගින් අවශ්‍ය දත්ත ලබා ගැනීමේ පහසුකම් සලසා දීම
15. ශ්‍රී ලාංකීය ජනතාවගේ උරුමය හා බැඳුණ ජාතික සමගියට අනුබලයක් වන නිවැරදිවූත්, නිශ්චිතවූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතිකරණය තුළින් හඳුන්වා දීම
16. අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිත කිරීම හා හුවමාරු කිරීම සඳහා විධිමත් ජාතික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය හා ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය සහාය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට ලබා දීම

17. භූමිතික පාලන ජාලය පිහිටුවීම සහ මිහි සැරිසරු සහසරු පද්ධති (GNSS) තාක්ෂණය හඳුන්වා දෙමින් ඉහළ නිරවද්‍යතාවයකින් මැනුම් කිරීම සහ මිහි සැරිසරු සහසරු පද්ධති (GNSS) තාක්ෂණය මගින් ශ්‍රී ලංකා සන්තතික මෙහෙයුම් පාලන පද්ධති (SLCORSnet) ජාලය පිහිටුවීම තුළින් භූමිතික මැනුම් අවශ්‍යතා සපුරා ගැනීම පහසු කිරීම
18. දෙපාර්තමේන්තුව යටතේ ඇති මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් උපාධි පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම මගින් දෙපාර්තමේන්තු අවශ්‍යතා අනුව නිලධාරීන් පුහුණු කිරීම හා අනෙකුත් ආයතනවල ඉල්ලීම් මත නිලධාරීන් සඳහා ප්‍රායෝගික පුහුණු පාඨමාලා පැවැත්වීම
19. නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා විදේශ ශිෂ්‍යත්ව සහ දේශීය ආයතනවලින් පැවැත්වෙන වැඩසටහන් සඳහා යොමු කිරීම
20. ඉඩම් මැනීමට හා සිතියම්කරණයට අදාල කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පර්යේෂණ පැවැත්වීම
21. මැනුම් වෘත්තිය සඳහා අවශ්‍ය ප්‍රමිතීන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම
22. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ රජයේ මිනින්දෝරුවන්ගේ හා ලියාපදිංචි මිනින්දෝරුවන්ගේ කැඩැස්තර මැනුම්කරණය පිළිබඳ මිනින්දෝරුවරයාගේ නිපුණතාව සම්බන්ධයෙන් ප්‍රතීතන සහතික නිකුත් කිරීම
23. රාජ්‍ය ආයතනයන් සඳහා මැනුම් කටයුතු පිළිබඳ උපදෙස් හා සේවා සැපයීම
24. විශ්වවිද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා විවිධ අංශ අධ්‍යයනය සඳහා අධ්‍යයන සැසි පැවැත්වීම

1.4 සංවිධාන ව්‍යුහය

මිනින්දෝරු දෙපාර්තමේන්තුව - 2022



අති.ස.ප. - අතිරේක සර්වේයර් ජනරාල්
ජ්‍යෙ.නි.ස.ප. - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්
පළාත් ස.ප. - පළාත් සර්වේයර් ජනරාල්
නි.ස.ප. - නියෝජ්‍ය සර්වේයර් ජනරාල්
ජ්‍යෙ.මි.ද. - ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි
මි.ද. - මිනින්දෝරු අධිකාරි
නි. අධ්‍යක්ෂ - නියෝජ්‍ය අධ්‍යක්ෂ
කා.ප.නි. - කාර්මික හා පරිපාලන නිලධාරි
ප.නි. - පරිපාලන නිලධාරි

සම්.කළ. - සම්පත් කළමනාකරණ
ලේ.ක. හා වි.ප්‍ර. - ලේඛණ කළමනාකරණ හා වින්‍යාස ප්‍රමිතීන්
ඉකාඩ. හා උප. - ඉකාඩැනැගිලි හා උපකරණ
ප්‍රසම්. හා සැප. - ප්‍රසම්පාදන හා සැපයීම්
පර්. හා සං. - පර්යේෂණ හා සංවර්ධන
ඉ.ඉකා.ප. - ඉඩම් ඉකාරතුරු පද්ධති
භූ.ඉකා.ප. - භූ ඉකාරතුරු පද්ධති
ජා.අ.ද.ය.වියු. - ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය
ඉවින් - ඉවින් මැහුම්

හි.ලි. - හිමිකම් ලියාපදිංචි කිරීම
මු.සි.ආ. - මැහුම් හා සිතියම් ඔත කිරීමේ ආයතනය
ප්‍රා.මි.කා. - ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාල
ඉකා. - ඉකාරතුරු කාන්ෂණ
කළ.සං.හා පු.ඒ. - කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය
වි.මෑ. හා කන්.පා.- විශේෂ මැහුම් හා කන්ත්‍රව් පාලන
ම.ස.ම. - මහජන සම්බන්ධතා මධ්‍යස්ථානය
සි.කා.නි. - සිතියම් කාන්ෂණ නිලධාරි
දූ.ග්‍ර.කා.නි. - දූරස්ථ ග්‍රහණ කාන්ෂණ නිලධාරි

ජ්‍යා.කා.නි. - ජ්‍යායාරේඛණමිතික කාන්ෂණ නිලධාරි
පි.ව.කා.නි. - පිඹුරු වර්ණ කාන්ෂණ නිලධාරි
ගු.ජ්‍යා.කා.නි. - ගුවන් ජ්‍යායාරූප කාන්ෂණ නිලධාරි
ලි.මු.කා.නි. - ලිඛිත් මුද්‍රණ කාන්ෂණ නිලධාරි
කොං.කා.නි. - කොංරතුරු කාන්ෂණ නිලධාරි
කොං.කා.ස. - කොංරතුරු කාන්ෂණ සහකාර
මෑ.උ.කා.ශි. - මැහුම් උපකරණ කාර්මික ශිල්පී
සං. නි. - සංවර්ධන නිලධාරි
ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරි
භා.ප. - භාෂා පරිවර්තක

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

මැනුම්කරණය සහ සිතියම්කරණය ප්‍රධාන කාර්යභාරය වන මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 03ක් පවත්වා ගෙන යනු ලැබේ.

1.5.1. සර්වේයර් ජනරාල් කාර්යාලය
1.5.2. ක්ෂේත්‍ර කාර්යාල
1.5.3. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය

1.5.1. සර්වේයර් ජනරාල් කාර්යාලය

මැනුම් කිරීම දිවයින පුරා ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර රාජකාරියක් වන අතර එහි පූර්ණ අධීක්ෂණය සිදු කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයෙනි. සිතියම්කරණය යටතේ භූ ලක්ෂණාත්මක සිතියම් සැකසීම, තේමා සිතියම් සැකසීම, පාරිභෝගික අවශ්‍යතාවයන් අනුව සිතියම් සැකසීම ප්‍රධාන කාර්යාලයේ සිදු කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය වන භූමි තොරතුරු ගුවන් ඡායාරූප, චන්ද්‍රිකා ඡායාරූප ආදිය භාවිතයෙන් රැස් කිරීම හා එම දත්ත අවශ්‍යතාවයන් අනුව නිකුත් කිරීම සඳහා ගබඩා කිරීම ද සර්වේයර් ජනරාල් කාර්යාලයේ ඇති සිතියම්කරණයට සම්බන්ධ ශාඛාවල සිදු කරනු ලබන කාර්යයන් වේ.

දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය හා භෞතික සම්පත් කළමනාකරණය, දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම ආදී කාර්යයන් සර්වේයර් ජනරාල් කාර්යාලයේ ආයතන, ගබඩා, ගොඩනැගිලි හා උපකරණ යන අංශ මගින් සිදු කරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය හා ක්ෂේත්‍ර කාර්යාලය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන හා අක්මුදල් ලබා දීමද සිදු කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය මගිනි. ඊට අමතරව අංකිත දත්ත පවත්වාගෙන යාම මානව, භෞතික සම්පත් කළමනාකරණයට අවශ්‍ය දත්ත පද්ධති පවත්වාගෙන යාම, මැනුම් ඉල්ලීම් දත්ත පද්ධතිය පවත්වාගෙන යාම ආදී සියලුම තොරතුරු තාක්ෂණ සන්නිවේදන කටයුතු හා වෙබ් අඩවි පවත්වාගෙන යාමද සිදු කෙරෙනුයේ ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය ඇතුළු අනෙකුත් තාක්ෂණ අංශයන් සම්බන්ධීකරණයෙනි. දෙපාර්තමේන්තුවේ සියලුම නීති කටයුතු සඳහා ක්‍රියා කිරීම නීති අංශය මගින් ඉටු කරන අතර විශේෂ මැනුම් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ විශේෂ මැනුම් ඒකකයක් ස්ථාපිත කර ඇත. භූමිතික අංශය මගින් සියලුම තිරස් හා සිරස් පාලන ලක්ෂයන් ස්ථාපිත කිරීම හා පාලන ජාල නඩත්තු කිරීම අධීක්ෂණයද සිදු කරයි.

කාර්යසාධනය පිළිබඳ විස්තර සඳහා කරුණාකර ඇමුණුම i බලන්න.

1.5.2. ක්ෂේත්‍ර කාර්යාල

රජයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් මැනීම, මහජනතාවට ඉඩම් ඔප්පු ලබා දීම සඳහා අවශ්‍ය වන මූලික කාර්යය වශයෙන් ඉඩම් මැනීම, ඉඩම් හිමිකම් නිරවුල් කිරීම සඳහා ‘‘බිම්සවිය’’ ව්‍යාපෘතිය යටතේ ඉඩම් මැනීම, ආරවුල් පවතින අවස්ථාවලදී උසාවි මගින් ලබාදෙන නියෝග මත මැනුම් කිරීම වැනි විවිධ මැනුම් අවශ්‍යතාවයන් ඉටු කර දීම සඳහා පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 09 ක්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 25 ක්, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 87 ක්, භූමිතික මැනුම් සහ විශේෂ මැනුම් සඳහා ඇති කාර්යාල 4 ක්, දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලැබේ.

කාර්යසාධනය පිළිබඳ විස්තර සඳහා කරුණාකර ඇමුණුම ii බලන්න.

1.5.3. මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය - දියතලාව

පැරණි හා නවීන ඉඩම් මැනුම් තාක්ෂණ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික පුහුණුව සඳහා පහසුකම් ඇති, ඒ සඳහා කැපවී සිටින රජය සතු එකම ආයතනය ලෙස ක්‍රියා කරමින්, මැනුම් හා සිතියම්කරණය පිළිබඳව ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු අධ්‍යාපනය හා අත්දැකීම් ලබාදීමේ අරමුණින් පිහිටුවා ඇති මෙම ආයතනය, 1969 අංක 21 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලදුව, 1990.07.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනත යටතේ පිළිගෙන ඇත.

ආයතනික දැක්ම ලෙස ආසියානු කලාපයේ භූ තොරතුරු පිළිබඳ අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වීම පෙරදැරි කොට ක්‍රියාත්මක වන මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් මේ වන විට මැනුම් විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධි පාඨමාලාව සහ සිතියම් විද්‍යාව, දුරස්ථ ග්‍රහණ තාක්ෂණය, ගුවන් ඡායාරේඛණමිතිය, පිඹුරු වර්ණ මුද්‍රණ තාක්ෂණය, ලිතෝ මුද්‍රණ තාක්ෂණය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලා හා මැනුම් ක්ෂේත්‍ර සහායක වරුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම (NVQ මට්ටම 2,3) යන පාඨමාලා පවත්වනු ලැබේ.

එමෙන්ම, දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හැකියාවන් හා දැනුම වැඩිදියුණු කරලීමට අවශ්‍ය වෘත්තීය සංවර්ධන පුහුණු වැඩ සටහන් ද අඛණ්ඩව වාර්ෂිකව මෙහෙයවනු ලබන්නේ මෙම ආයතනය මගිනි .

මෙයට අමතරව අනෙකුත් රජයේ සහ අර්ධ රාජ්‍ය සංවිධානවල ඉල්ලීම් පරිදි, තාක්ෂණික කාර්ය මණ්ඩල සඳහා සහ මැනුම් හා සම්බන්ධ දේශීය විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල විද්‍යායතනවල සිවිල් ඉංජිනේරු සිසුන් සඳහා මැනුම් කඳවුරු නමින් හැඳින්වෙන ප්‍රායෝගික පුහුණු වැඩසටහන් මෙහෙයවීම ද මෙම ආයතනය මඟින් සිදුකරනු ලබයි.

කාර්යසාධනය පිළිබඳ විස්තර සඳහා කරුණාකර ඇමුණුම iii බලන්න.

2.0 ප්‍රගතිය සහ අනාගත දැක්ම

විශේෂ කාර්යයන්

මැනුම් කටයුතු හා සිතියම්කරණය සම්බන්ධව ජාතික අවශ්‍යතාවය ඉටු කිරීමේ වගකීම ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට පැවරී ඇත. 2021 වසර පුරාවටම බලපෑ ගෝලීය වසංගත තත්වයෙන් පසුවද අප රටට මුහුණ දීමට සිදු වූ ආර්ථික අර්බුද හා ප්‍රවාහන අපහසුතා වැනි හේතූන් නිසා 2022 වසරේ දෙවන කාර්තුවේදී කාර්යාල පූර්ණ වශයෙන්ම ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුණද සංශෝධනය කරන ලද වාර්ෂික මැනුම් ඉලක්කයට අනුව 138% ක ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය.

මෙම වර්ෂය තුළ සිදු කරන ලද මැනුම් කටයුතු වලින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර ලබා දීම සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු දීමනා පත්‍ර ලබා දීම සඳහා ඉඩම් කට්ටි 35,066 ක්ද, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් කැබලි 117,321 ක්ද, ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ මහජනතාවගේ අවශ්‍යතා සඳහා බිම් කැබලි 9,194 ක්ද, අධිකරණය මගින් නිකුත් කරන ලද උසාවි අධිකාරි පත්‍ර 525 ක්ද, යෝජිත ව්‍යාපෘතීන් සඳහා වන ඉංජිනේරු මැනුම් හෙක්ටයාර 8,247 ක්ද, විවිධ අවශ්‍යතාවන් සඳහා ඉල්ලීම් කරන ලද මැනුම් සඳහා කැබලි 36,515 ක්ද වශයෙන් ඉටු කිරීමට සමත් වී ඇත.

මීට අමතරව විවිධ ආයතන සඳහා සිතියම් සැපයීම, අංකිත දත්ත සැපයීම, ගුවන් ඡායාරූප සැපයීම ද අවශ්‍ය පරිදි නිකුත් කිරීමට කටයුතු කර ඇත.

අභියෝග

නොයෙකුත් සංවර්ධන කටයුතු හේතුවෙන් ලැබෙන මැනුම් ඉල්ලීම් අදාල සංවර්ධන කටයුතුවලට බලපෑමක් නොවන පරිදි ඉටු කර දීම සඳහා එම මැනුම් කළමනාකරණය කිරීම සහ ඊට අවශ්‍ය තාක්ෂණික උපකරණ සපයා දීම.
භූ තොරතුරු සහ ඉඩම් තොරතුරු කළමනාකරණය සඳහා දත්ත පද්ධතිය කාර්යක්ෂමව භාවිත කිරීම.

අනාගත දැක්ම

රජයේ ඉඩම් කළමනාකරණය සහ වරින්වර රජය මඟින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමට උපකාරීවන පරිදි ඉඩම් තොරතුරු පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යාමත්, අනෙකුත් පාර්ශවයන් සමඟ දත්ත හුවමාරු කර ගැනීමට අවකාශ සැලසීමත් අවම කාලයක් තුළ විවිධ මැනුම් කටයුතු සම්බන්ධව විවිධ ආයතන හා ජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් ඉටුකර දීමත් භූ තොරතුරු හා ඉඩම් කළමනාකරණ ක්ෂේත්‍රවල වර්තමානයේ රටේ පවතින උසස් අධ්‍යාපන ඉල්ලුම සපුරාලීමට මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මඟින් එම උපාධි පාඨමාලා ක්‍රියාත්මක කිරීම තුළින් හැකි උපරිමයෙන් දායක වීමටත් බලාපොරොත්තු වේ.

3.0 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



ඒසිඒ-එෆ්

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කණ්ඩායම 2022 රු.	2,021 රු.	
300,000,000	**ආදායම් ලැබීම්**		**319,289,778**	**408,123,680**	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
300,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	319,289,778	408,123,680	
300,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**319,289,778**	**408,123,680**	
-	**ආදායම් නොවන ලැබීම්**		**4,068,792,145**	**3,793,946,560**	
-	භාණ්ඩාගාර අග්‍රිම		3,877,035,000	3,531,000,000	ඒසිඒ-3
-	නැන්පතු		55,445,538	120,316,209	ඒසිඒ-4
126,000,000	අත්තිකාරම් ගිණුම්		136,311,607	142,630,351	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**4,068,792,145**	**3,793,946,560**	
300,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**4,388,081,922**	**4,202,070,240**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,500,000	-	
300,000,000	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		**4,386,581,922**	**4,202,070,240**	
	අඩු කළා : වියදම්				
4,321,710,000	**පුනරාවර්තන වියදම්**		**4,125,818,821**	**3,712,922,067**	
3,769,795,315	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	3,601,301,122	3,279,682,258	
532,642,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	507,209,908	414,466,243	ඒසිඒ-2(ii)
19,200,000	සභානාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	17,235,106	18,478,599	
-	පොළී ගෙවීම්	8	-	-	
72,685	වෙනත් පුනරාවර්තන වියදම්	9	72,685	294,967	
4,321,710,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**4,125,818,821**	**3,712,922,067**	
273,800,000	**මූලධන වියදම්**		**61,682,020**	**362,168,567**	
70,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	53,076,064	98,128,038	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	259,333,503	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
7,500,000	හැකියා වර්ධනය	14	6,704,456	2,707,026	
195,800,000	වෙනත් මූලධන වියදම්	15	1,901,500	2,000,000	
273,800,000	**මුළු මූලධන වියදම් (උ)**		**61,682,020**	**362,168,567**	
	නැන්පතු ගෙවීම්		124,077,791	48,955,454	ඒසිඒ-4
130,000,000	අත්තිකාරම් ගෙවීම්		114,176,688	124,859,482	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**238,254,479**	**173,814,936**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**4,425,755,320**	**4,248,905,570**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(39,173,398)	(46,835,330)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(39,173,398)	(46,835,330)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			-	-	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	10,600,869,259	8,745,925,865
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	325,303,060	347,437,979
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**10,926,172,318**	**9,093,363,844**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		312,981,141	266,483,807
දේපළ පිරියත හා උපකරණ සංචිතය		10,600,869,259	8,745,925,865
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	12,321,918	80,954,172
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**10,926,172,318**	**9,093,363,844**

පිටු අංක 01 සිට 39 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 40 සිට 69 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 2023/02/21
දිනය : 2023/2/23	දිනය : 2023/02/21	
ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා ලේකම් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය "මිහිකත මැදුර" ඉඩම් මහලේකම් කාර්යාලය, 200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.	එස්. සිවානන්දරාජා සර්වේයර් ජනරාල් සර්වේයර් ජනරාල් කාර්යාලය කොළඹ 05.	පී. පී. එස්. ප්‍රියන්ත අධ්‍යක්ෂ (මුදල්) මිහින්දෝරු දෙපාර්තමේන්තුව කොළඹ 05.

2

3.3 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



දෙමළ-සි

2022 දෙසැම්බර් 31 දිනෙනුත් අවසාන වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය මිදු ලැබීම	-	-
පාසිඳු, අටිකාර, දුඩුකඳුල් සහ තිලපලු	319,289,778	408,123,680
උපහ	-	-
ආදායම් බදු ලැබීම්		-
පවතින් ආදායම් බදුවල ඔවුනුවෙන් දෙනතු කරන ලද ආකාරය	249,347,476	174,247,766
අදිති ලැබීම	3,877,035,000	3,531,000,000
අන්තිකරුවම ආකාර ඇතිවූ	40,861,677	147,400,591
ගැනුම්කරු ලැබීම	55,445,558	120,316,269
එකතු කළ අගය මත බදු ලැබීම්	72,639,017	67,094,478
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	4,714,618,455	4,448,182,724
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුදුමල පරිහරණ හා ශම්පොලුම් වියදම්	4,102,142,250	3,693,535,078
සහනාධාර සහ පිරුණකිරීම්	17,307,791	18,478,599
පරිහාණ වැය කිරීම පරිපූරණවලින් දරන ලද වියදම්	237,750,567	135,015,031
භාණ්ඩාගාරයට ඉපයීම ලබා දෙනු	1,500,000	-
අත්තිකාරම් පහවීම්	133,737,938	126,095,380
ගෙවිය යුතු පාරිශ්‍රමික	124,077,791	48,955,454
එකතු කළ අගය මත බදු ගෙවීම්	63,481,226	72,745,622
මෙහෙයුම් ක්‍රියාවලියේ සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	4,639,997,573	4,094,825,164
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	74,620,883	353,357,560
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ලාභාංශ	-	-
පොළිය	-	-
ස්ථිර වත්කම් අවස්ථිරණ ප්‍රතිලාභ හා අනෙකුත් වත්කම් විකිණීම්	5,993,039	7,160
උපාය ගිණුම් ඇරීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	5,993,039	7,160
අඩුකළා : මුදල් වැය කිරීම්		
ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් සහ නිපදවීම් සහ අවිකාර අයිතිවාසිකම් ආශ්‍රිත වියදම්	60,613,941	353,364,720
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද සුළු මුදල් ප්‍රවාහය (ඉ)	60,613,941	353,364,720
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(54,620,883)	(353,357,560)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(අ) + (ඊ)	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ලැබීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද සුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

පහත සඳහන් සටහන් 2022 මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණා ඇත.

සටහන (i) - පාඩු හා අත්හැරීම පිළිබඳ ප්‍රකාශන (මු.රෙ.106 හා මු.රෙ.113 යටතේ වන පාඩු)

සටහන (ii) - පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශන (වර්ෂය තුළ සිදු වූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය සහ වර්ෂය තුළ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකරගැනීම් පිළිබඳ ප්‍රකාශය)

සටහන (iii) - බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

සටහන (iv) - බැරකම් පිළිබඳ ප්‍රකාශය (i) මු.රෙ.94 (R) සහ (B) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

සටහන (v) - බැරකම් පිළිබඳ ප්‍රකාශය (ii) මු.රෙ. 215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

සටහන (viii) - 2015/10/23 දින නිකුත් කරණ ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස් වලට අනුකූලව ආරම්භ කරණ ලද බැංකු ගිණුම් පිළිබඳ 2022/12/31 දිනට තත්ත්ව වාර්තාව.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		ප්‍රථම	අවසාන	ගණන (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස
2003.02.04	මැනුම්පති ආදායම	450,000,000	300,000,000	319,289,718.	106 %

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය					ප්‍රතිපාදන		තථ්‍ය වියදම	ප්‍රතිපාදන භාවිතය අවසාන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
					ප්‍රථම	අවසාන		
වැඩසටහන 1, ව්‍යාපෘතිය 1								
පුනරාවර්තන වියදම්								
පුද්ගල පඩිනඩි								
288	1	1	1001	වැටුප් හා වේතන	135,000,000	135,000,000	127,230,169	94
288	1	1	1002	අතිකාල සහ නිවාඩු දින වැටුප්	1,500,000	1,500,000	1,182,760	79
288	1	1	1003	වෙනත් දීමනා	50,315,315	50,315,315	48,790,018	97
ගමන් වියදම්								
288	1	1	1101	දේශීය	1,000,000	1,000,000	685,491	69
සැපයීම්								
288	1	1	1201	ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා	6,000,000	6,000,000	4,831,560	81
288	1	1	1202	ඉන්ධන	12,900,000	12,900,000	12,900,000	100
288	1	1	1203	ආහාර සහ නිල ඇඳුම්	100,000	100,000	100,000	100
288	1	1	1205	වෙනත්	500,000	500,000	474,918	95
නඩත්තු වියදම්								
288	1	1	1301	වාහන	3,000,000	3,000,000	1,880,575	63

288	1	1	1302	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	500,000	500,000	484,040	97
288	1	1	1302	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	-	-	-	-
සේවා								
288	1	1	1401	ප්‍රවාහන	9,512,000	9,512,000	9,508,774	100
288	1	1	1402	තැපැල් සහ සන්නිවේදන	6,000,000	6,000,000	5,498,782	92
288	1	1	1403	විදුලිය සහ ජලය	12,000,000	12,000,000	11,563,246	96
288	1	1	1404	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	5,500,000	5,500,000	5,232,700	95
288	1	1	1408	මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම්	-	-	-	-
288	1	1	1409	වෙනත්	13,500,000	13,500,000	12,710,018	94
මාරුකිරීම්								
288	1	1	1506	රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී	19,000,000	19,000,000	17,051,158	90
වෙනත් පුනරාවර්තන වියදම්								
288	1	1	1701	පාඩු සහ අත්හැරීම්	72,685	72,685	72,685	100
මූලධන වියදම්								
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්								
288	1	1	2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5,000,000	5,000,000	2,912,081	58
288	1	1	2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	5,000,000	5,000,000	4,964,522	99
288	1	1	2003	වාහන	5,000,000	5,000,000	2,662,901	53
හැකියා වර්ධනය								
288	1	1	2401	කාර්ය මණ්ඩල පුහුණු	4,000,000	4,000,000	3,571,707	89
වැඩසටහන 2, ව්‍යාපෘතිය 2								
පුනරාවර්තන වියදම්								
පුද්ගල පඩිනඩි								
288	2	2	1001	වැටුප් හා වේතන	2,300,000,000	2,300,000,000	2,184,541,451	95
288	2	2	1002	අතිකාල සහ නිවාඩු දින වැටුප්	8,000,000	8,000,000	7,379,747	92
288	2	2	1003	වෙනත් දීමනා	1,179,500,000	1,179,500,000	1,142,983,183	97
ගමන් වියදම්								
288	2	2	1101	දේශීය	110,000,000	110,000,000	106,476,292	97
සැපයීම්								
288	2	2	1201	ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා	21,000,000	21,000,000	19,382,010	92
288	2	2	1202	ඉන්ධන	78,500,000	78,500,000	78,499,999	100
288	2	2	1203	ආහාර සහ නිල ඇඳුම්	1,250,000	1,250,000	1,116,000	89
288	2	2	1205	වෙනත්	22,000,000	22,000,000	20,161,274	92
නඩත්තු වියදම්								
288	2	2	1301	වාහන	30,000,000	30,000,000	26,784,161	89
288	2	2	1302	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	3,000,000	3,000,000	2,828,154	94
288	2	2	1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,500,000	1,500,000	1,448,856	97

සේවා								
288	2	2	1401	ප්‍රවාහන	34,950,000	34,950,000	34,661,554	99
288	2	2	1402	තැපැල් සහ සන්නිවේදන	33,000,000	33,000,000	30,859,742	94
288	2	2	1403	විදුලිය සහ ජලය	10,500,000	10,500,000	9,366,011	89
288	2	2	1404	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	81,000,000	81,000,000	77,512,988	96
288	2	2	1408	මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම	9,100,000	9,100,000	8,577,049	94
288	2	2	1409	වෙනත්	8,000,000	8,000,000	7,879,892	98
මාරුකිරීම්								
288	2	2	1505	සම්මාදම් සහ දායක මුදල්	200,000	200,000	183,948	92
				මූලධන වියදම්				
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්								
288	2	2	2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	20,000,000	20,000,000	16,611,204	83
288	2	2	2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	10,000,000	10,000,000	9,623,790	96
288	2	2	2003	වාහන	13,000,000	13,000,000	12,010,570	92
හැකියා වර්ධනය								
288	2	2	2401	කාර්ය මණ්ඩල පුහුණු	2,000,000	2,000,000	1,902,606	95
වෙනත් මූලධන වියදම්								
288	2	2-0	2509	වෙනත්	1,000,000	195,800,000	1,000,000	
288	2	2-.0	2509	වෙනත්	174,800,000	-	-	
288	2	2-1	2509	වෙනත්	20,000,000	-	901,500	
				වැඩසටහන 2, ව්‍යාපෘතිය 3				
				පුනරාවර්තන වියදම්				
පුද්ගල පඩිනඩි								
288	2	3	1001	වැටුප් හා වේතන	64,000,000	64,000,000	60,520,560	95
288	2	3	1002	අතිකාල සහ නිවාඩු දින වැටුප්	1,000,000	1,000,000	923,891	92
288	2	3	1003	වෙනත් දීමනා	30,480,000	30,480,000	27,749,342	91
ගමන් වියදම්								
288	2	3	1101	දේශීය	500,000	500,000	421,940	84
සැපයීම්								
288	2	3	1201	ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා	800,000	800,000	604,245	76
288	2	3	1202	ඉන්ධන	4,180,000	4,180,000	4,125,391	99
288	2	3	1203	ආහාර සහ නිල ඇඳුම්	50,000	50,000	40,000	80
නඩත්තු වියදම්								
288	2	3	1301	වාහන	1,000,000	1,000,000	949,066	95
288	2	3	1302	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	100,000	100,000	98,895	99
288	2	3	1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	100,000	100,000	98,542	99

සේවා								
288	2	3	1401	ප්‍රවාහන	2,550,000	2,550,000	2,399,387	94
288	2	3	1402	තැපැල් සහ සන්නිවේදන	2,000,000	2,000,000	1,072,926	54
288	2	3	1403	විදුලිය සහ ජලය	1,500,000	1,500,000	1,292,895	86
288	2	3	1409	වෙනත්	5,550,000	5,550,000	4,682,541	85
මූලධන වියදම්								
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්								
288	2	3	2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	10,000,000	10,000,000	2,780,581	28
288	2	3	2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	1,000,000	1,000,000	993,002	99
288	2	3	2003	වාහන	1,500,000	1,500,000	517,414	34
හැකියා වර්ධනය								
288	2	3	2401	කාර්ය මණ්ඩල පුහුණු	1,500,000	1,500,000	1,230,143	82
එකතුව						**4,595,510,000**	**4,187,500,847**	

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන	තථ්‍ය වියදම	ප්‍රතිපාදන භාවිතය අවසාන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
1.	ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර, ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	බිම්සවිය වැඩසටහන සඳහා	198,900,000.00	181,237,721.63	91.12%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය **2022.12.31**දිනට	මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය **2022.12.31**දිනට	ගිණුම් ගත කළයුතුව පවතින	ප්‍රගතිය % ලෙස
9151	ගොඩනැගිලි සහ ව්‍යුහ	1,685,001,242.73	1,685,001,242.73	-	-
9152	යන්ත්‍රෝපකරණ	1,483,798,515.90	1,483,798,515.90	-	-
9153	ඉඩම්	7,432,069,500.00	7,432,069,500.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කරමින් පවතින කටයුතු	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපති වාර්තාව

කරුණාකර ඇමුණුම iv බලන්න.

4.0 කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම				
	>100%	100% - 90%	89% - 75%	74% - 50%	50%>
දීමනා පත්‍ර ලබාදීම සඳහා සිදු කරන ව්‍යවස්ථාපිත මැනුම්			√		
රජයේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීමේ මැනුම්		√			
ඉංජිනේරු මැනුම්	√				
විවිධ මැනුම්	√				
උසාවි අධිකාරි පත්‍ර මැනුම්	√				
හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සිදුකරනු ලබන මැනුම්	√				
1:50,000 පරිමාණයෙන් සිතියම් සකස්කිරීම සහ මුද්‍රණය		√			
1:50,000 පරිමාණයෙන් සිතියම් විද්‍යාත්මකව වැඩිදියුණු කරන ලද භූලක්ෂණාත්මක සිතියම් සකස් කිරීම			√		
1:10,000 පරිමාණයෙන් සිතියම් නිෂ්පාදනය		√			
1:10,000 පරිමාණයෙන් සිතියම් විද්‍යාත්මකව වැඩි දියුණු කරන ලද භූලක්ෂණාත්මක සිතියම් සකස් කිරීම සහ පරිශීලක ඉල්ලීම පරිදි මුද්‍රණය කිරීම	√				
විවිධ පරිපාලන ඒකක සඳහා සිතියම් නිෂ්පාදනය	√				
තේමා සිතියම් නිෂ්පාදනය	√				
පාරිභෝගික ඉල්ලීම් මත පිළියෙල කරන සිතියම්	√				
අංකිත භූගෝලීය දත්ත නිකුත් කිරීම					√
දෘඩ පිටපත් සිතියම් සහ සිතියම් Flex මාධ්‍යයෙන් නිකුත් කිරීම	√				
පිඹුරු පිටපත් ලබා දීම	√				
දෙපාර්තමේන්තුව තුළ විභාග පැවැත්වීම		√			
ඉඩම් තොරතුරු පද්ධතිය යාවත් කාලීන කිරීම	√				
ඉඩම් තොරතුරු පද්ධතියේ දත්ත මාර්ග ගත සේවාව මගින් ලබා දීම	√				
1:50,000 පරිමාණයේ භූලක්ෂණාත්මක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම	√				
1:50,000 පරිමාණයේ සංතතික භූලක්ෂණාත්මක දත්ත පද්ධතියක් පිළියෙළ කිරීම		√			

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම				
	>100%	**100% - 90%**	**89% - 75%**	**74% - 50%**	**50%>**
1:10,000 පරිමාණයේ භූලක්ෂණාත්මක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම	√				
1:10,000 පරිමාණයේ සංතතික භූලක්ෂණාත්මක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම			√		
නගර සිතියම් සඳහා දත්ත සැකසීම			√		
භූගෝලීය දත්ත ගබඩාවේ දත්ත මාර්ග ගත සේවාව මගින් ලබා දීම		√			
ගුවන් ඡායාරූප පරිලෝකනය කිරීම හා නිකුත් කිරීම	√				
දැනට ඇති භූ නාම මහජන අදහස් අනුව නැවත ප්‍රමිතිගත කිරීම			√		
සිංහල හා දෙමළ භාෂාවලින් භූගෝලීය නාම දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම	√				
නිල භාෂා හැරුණු විට රෝමානුකරණය කරන ලද පිටපත් වල භූගෝලීය නාම පවත්වා ගැනීම	√				
ජාතික උපරිව්‍යුහ පද්ධති ගොඩනැගීම හා ඊට අවශ්‍ය දත්ත ලබාදීම	√				
දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යථාවත් කිරීම			√		
මහජන ඉල්ලීම් සලකා බලා යථාවත් කිරීම				√	
B ගණයේ / C ගණයේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම	√				
CORS Net ජාලය පවත්වාගෙන යෑම		√			
වෙනත් ආයතන වල ඉල්ලීම මත C ගණයේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම		√			
මේ වනවිට පවතින සිරස් පාලන ලක්ෂ්‍ය ක්ෂේත්‍ර විමර්ශන / ආරක්ෂා කිරීම / නැවත පිහිටුවීම					√
ප්‍රාථමික ගණයේ මට්ටම් රේඛා පිහිටුවීම				√	
දෙවන ගණයේ මට්ටම් රේඛා පිහිටුවීම				√	
තෙවන ගණයේ මට්ටම් රේඛා පිහිටුවීම				√	
වෙනත් ආයතන වල ඉල්ලීම මත දෙවන ගණයේ / තෙවන ගණයේ මට්ටම් රේඛා පිහිටුවීම		√			
වෙනත් විශේෂ මැනුම්	√				
මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පනත සංශෝධනය				√	
සිවු වසරේ මිනින්දෝරු විද්‍යා උපාධි පාඨමාලාව පැවැත්වීම	√				
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සකස් කිරීම			√		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය නිමැවුම				
	>100%	100% - 90%	89% - 75%	74% - 50%	50%>
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම					√
මිනින්දෝරු අධිකාරීන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම				√	
මිනින්දෝරුවන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම					√
කාර්මික හා පරිපාලන නිලධාරීන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම					√
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් සඳහා ඩිප්ලෝමා වැඩසටහන් පැවැත්වීම					√
එක් දින පුහුණු වැඩ සටහන් පැවැත්වීම				√	
කෙටි කාලීන පාඨමාලා පැවැත්වීම				√	

5.0 තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) ළඟාකර ගැනීමේ කාර්යසාධනය

සංවර්ධනය, ආයෝජනය හා කෘෂිකාර්මික අරමුණු වෙනුවෙන් දත්ත පිළියෙළ කිරීම, අවකාශීය දත්ත විශ්ලේෂණය සඳහා සිතියම් සකස් කිරීම සහ කාර්ය මණ්ඩල නිසි අයුරින් යොදා ගැනීම වෙනුවෙන් වන පුහුණු කිරීම් ආදිය තිරසාර සංවර්ධන ඉලක්ක ලෙස හඳුනාගෙන ඇත.

5.1 හඳුනාගත් අදාල තිරසාර සංවර්ධන ඉලක්ක

අභිමතාර්ථය / අරමුණ	ඉලක්කය	කාර්ය සිද්ධි සාධනයේ දර්ශක	කාර්ය සිද්ධි සාධනයේ ප්‍රගතිය			
			0% - 49%	50% - 74%	75% - 100%	>100%
සංවර්ධනය,ආයෝජනය සහ කෘෂිකාර්මික අරමුණු සඳහා මැනුම් දත්ත පිළියෙළ කිරීම	සංවර්ධන අරමුණු සඳහා ඉඩම් මැනීම සහ දත්ත ගබඩාව පිළියෙළ කිරීම	මනින ලද ප්‍රදේශය සහ කැබලි ගණන				√
අවකාශීය දත්ත විශ්ලේෂණය සඳහා සිතියම් සකස් කිරීම	සංවර්ධනය සඳහා සිතියම් සකස් කිරීම	සිතියම්, දත්ත පද්ධති සංඛ්‍යාව		√		
කාර්ය මණ්ඩල නිසි ආකාරයෙන් යොදා ගැනීම සඳහා මැනුම් පුහුණුව	වෘත්තීය සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම	විභාග / පුහුණු වැඩ සටහන් ගණන		√		

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන උපාය මාර්ග හඳුනාගෙන ඇති අතර, මූලික අරමුණු තුනක් යටතේ ඒ සඳහා කටයුතු කර ඇත. ඒ අනුව, මැනුම් දත්ත සකස් කිරීම යටතේ 138% ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇති අතර සිතියම් සකස් කිරීම යටතේ 62% ක ප්‍රගතියක් සහ පුහුණු කිරීම් යටතේ 67% ක ප්‍රගතියක් ද ලබාගෙන ඇත.මෙහිදී දෙපාර්තමේන්තුව ඉදිරියේ ඇති මූලික අභියෝග වන්නේ භෞතික සම්පත් හිඟකම හා කාලීනව සිදුවන තාක්ෂණ වැඩිදියුණු කිරීම් ළඟා කරගැනීම සඳහා අවශ්‍ය සම්පත් ලබා ගත නොහැකි වීම සහ ආර්ථික අර්බුදකාරී තත්ත්වයන්ගේ බලපෑමයි.

6.0 මානව සම්පත් පැතිකඩ

දෙපාර්තමේන්තුවේ මානව සම්පත පිළිබඳ සංයුතිය, ආයතනයේ කාර්ය සාධනයට මානව සම්පත් හිඟය ඇති කරන බලපෑම සහ මානව සම්පත් සංවර්ධනය කිරීමට අදාළ වෙනත් ආයතනවලින් කෙරෙන පුහුණු පාඨමාලාවන්, පශ්චාත් උපාධි පාඨමාලාවන් සහ විදේශ පුහුණු හා වැඩමුළු තුළින් කාර්ය සාධනය වැඩි දියුණු කිරීම

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවා ගණය	අනුමත තනතුරු ගණන	වසර අවසානයේ සිටි සේවක සංඛ්‍යාව	හිඟ සේවක සංඛ්‍යාව	අතිරික්ත සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	1144	951	193	0
තෘතීයික	83	27	56	0
ද්විතියික	1172	995	177	0
ප්‍රාථමික	4890	3553	1537	0
තාවකාලික(බහුකාර්ය)	0	170	0	170
එකතුව	**7289**	**5696**	**1963**	**170**

6.2 ආයතනයේ කාර්ය සාධනයට බලපාන මානව සම්පත් හිඟය සහ අතිරික්තය

මෙම දෙපාර්තමේන්තුව තාක්ෂණික කටයුතු, සාමාන්‍ය කාර්යාලීය කටයුතු හා එම කාර්යයන් හා බැඳුනු පරිපාලන කටයුතු ඉටු කරන විවිධ මට්ටම් වල නිලධාරීන්ගෙන් සමන්විත වේ. ඒ අතරින් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ, දෙපාර්තමේන්තුගත සේවාවන්හි සහ ඒකාබද්ධ සේවයට අයත් සේවාවන්හි සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව තුළ පවතී. මෙසේ දෙපාර්තමේන්තුවට අනුමත තනතුරු සැලකිය යුතු ප්‍රමාණයක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඍණාත්මක බලපෑමක් ඇතිවී තිබේ.
දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළයුතු නිලධාරී සංඛ්‍යාවේ පුරප්පාඩු පැවතියද අදාල කාර්යයන් නිසිලෙස කළමනාකරණය කර ගැනීමෙන් රාජකාරී කටයුතු සිදුකර ඇති අතර දෙපාර්තමේන්තුවට අනුමත පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම තුළින් රාජකාරී කටයුතු වැඩි කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීමට හැකිවනු ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

6.3.1 වෙනත් ආයතන විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවන්

පාඨමාලාව	නිලධාරීන් ප්‍රමාණය	කාලසීමාව	ආයෝජනය (රු.)		පාඨමාලාවේ ස්වභාවය (විදේශීය / දේශීය)	ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
1. ආයතන සංග්‍රහය හ මුදල් රෙගුලාසි (නිපුණතා සංවර්ධන අරමුදල)	04	දින 02	28,000.00	_	දේශීය	මේ සඳහා සහභාගී වූ සියළුම නිලධාරීන් ආයතන සංග්‍රහය තුළ ඇතුළත් කරුණු සහ මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම ලබාගන්නා ලදී.
2. නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම (නිපුණතා සංවර්ධන අරමුදල)	01	දින 02	8,500.00	_	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරියා නිවාඩු ලිපිකරුවෙකු විසින් කළයුතු කාර්යයන් පිළිබඳ මූලික දැනුම ලබාගන්නා ලදී
3. රජයේ ප්‍රසම්පාදන පිළිබඳ ක්‍රියාවලිය සහතික පත්‍ර පාඨමාලාව (නිපුණතා සංවර්ධන අරමුදල)	01	දින 01	45,000.00	_	දේශීය	වැඩමුළුව සඳහා සහභාගි වූ නිලධාරියා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ දැනුම ලබාගන්නා ලදී.
4. ගබඩා කළමනාකරණ සහ ඉන්වෙන්ට්‍රි පාලනය පිළිබඳ වැඩමුළුව (නිපුණතා සංවර්ධන අරමුදල)	01	දින 02	7,000.00	_	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරියා ගබඩා කළමනාකරණය සිදුකරන ආකාරය හා ඉන්වෙන්ට්‍රි පාලන සිදුකිරීම සම්බන්ධව දැනුම ලබාගන්නා ලදී.
5. ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ මාර්ගගත වැඩමුළුව (නිපුණතා සංවර්ධන අරමුදල)	01	දින 02	7,000.00	_	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරියා ප්‍රවාහන කටයුතු කළමනාකරණය කිරීම පිළිබඳ මූලික අවබෝධය ලබාගන්නා ලදී.
6. රජයේ වාහන නඩත්තුව (ජාතික ශ්‍රම ආයතනය)	02	දින 01	5,000.00	_	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරීන් රජයේ වාහනයක් නඩත්තු කිරීම සම්බන්ධව දැනුවත් වන ලදී.
7. රියදුරු පුහුණු වැඩසටහන (කළමනාකරණ සංවර්ධන හා පුහුණු අංශය)	20	දින 02	3,720.00	_	දේශීය	වැඩමුළුව සඳහා සහභාගී වූ නිලධාරීන් මාර්ග නීති පිළිබඳව දැනුවත් වෙමින් වාහනයක් ධාවනය කිරීම කෙසේ කළයුතුද යන්න පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
8. ලිපිගොනුකරණය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන (නිපුණතා සංවර්ධන අරමුදල)	135	දින 01	33,405.00	–	දේශීය	මේ සඳහා සහභාගී වූ සියළුම නිලධාරීන් ලිපිගොනුවක් ගොනුකිරීම පිළිබඳ මූලික අවබෝධයක් ලබාගන්නා ලදී.
9. රියැදුරු කුසලතාව සහ මෝටර් කාර්මික දැනුම පිළිබඳ වැඩමුළුව (නිපුණතා සංවර්ධන අරමුදල)	01	දින 01	3,720.00	–	දේශීය	මේ සඳහා සහභාගී වූ සියළුම නිලධාරීන් රියදුරු පුහුණුව සහ ඒ හා සම්බන්ධ තාක්ෂණික දැනුම ලබාගන්නා ලදී.

10. වායුසමීකරණ හා ශීතකරණ ශිල්පය 3 - කෙටිකාලීන පාඨමාලාව (ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය)	01	පැය 120	32,000.00	–	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරියා වායුසමීකරණ හා ශීතකරණ අළුත්වැඩියාව සම්බන්ධ කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
11. මාණ්ඩලික නිලධාරීන් සඳහා ලිපිගොනුකරණය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන (කළමනාකරණ සංවර්ධන හා පුහුණු අංශය)	93	දින 01	24,390.00	–	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරීන් ලිපිගොනුවක් පවත්වාගෙන ආකාරය පිළිබඳ අවබෝධය ලබාගන්නා ලදී.
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම පිළියෙළ කිරීම (නිපුණතා සංවර්ධන අරමුදල)	02	දින 01	7,500.00	–	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරීන් බී ගිණුමක් පවත්වාගෙන යන ආකාරය පිළිබඳ මූලික අවබෝධය ලබාගන්නා ලදී.
13. පොදු ප්‍රසම්පාදනයේදී ලංසු ඇගයීම (දුරස්ථ අධ්‍යාපන ආයතනය)	03	දින 02	18,000.00	–	දේශීය	මේ සඳහා සහභාගී වූ නිලධාරීන් ප්‍රසම්පාදනය පිළිබඳ මූලික දැනුම ලබාගන්නා ලදී.
14. තෙදින සේවාරම්භක වැඩමුළුව (නිපුණතා සංවර්ධන අරමුදල)	01	දින 03	10,500.00	–	දේශීය	සේවාවක් තුළ ඉටුකළ යුතු කාර්යයන් සම්බන්ධ මූලික සහ පූර්ව කරුණු පිළිබඳ අවබෝධය ලබාගන්නා ලදී.
15. විගණන විමසුම සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ පාඨමාලාව (ජාතික ශ්‍රම ආයතනය)	01	දින 01	10,000.00	–	දේශීය	විගණනයක් සිදු කළයුතු ආකාරය පිළිබඳව මූලික කරුණු පිළිබඳ නිලධාරීන් දැනුවත් වන ලදී.
16. පැය 200 දෙවන භාෂා (දෙමළ) පාඨමාලාව (ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය)	02	පැය 200	30,000.00	–	දේශීය	දෙමළ භාෂාව පිළිබඳ මූලික කරුණු හදාරන ලදී.
17. ව්‍යාපෘති කළමනාකරණය (නිපුණතා සංවර්ධන අරමුදල)	03	දින 02	22,500.00	–	දේශීය	ව්‍යාපෘතියක් නිසි ලෙස ආරම්භ කිරීමේ සිට අවසානය දක්වා මූලික කරුණු පිළිබඳ හදාරන ලදී.
18. පැය 200 දෙවන භාෂා (දෙමළ) පාඨමාලාව (ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය)	01	පැය 200	7,500.00	–	දේශීය	දෙමළ භාෂාව පිළිබඳ මූලික කරුණු හදාරන ලදී.
19. දෙවන රාජ්‍ය භාෂා පාඨමාලාව (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)	115	පැය 150	36,000.00	–	දේශීය	දෙමළ භාෂාව පිළිබඳ මූලික කරුණු හදාරන ලදී.
20. ප්‍රසම්පාදන සහ ගිණුම්කරණය (කළමනාකරණ සංවර්ධන හා පුහුණු අංශය)	42	දින 01	8,760.00	–	දේශීය	ප්‍රසම්පාදනය හා ගිණුම්කරණය පිළිබඳ මූලික කරුණු මෙම නිලධාරීන් විසින් අවබෝධ කරගන්නා ලදී.
21. සිතියම් නිෂ්පාදනයේ යෙදී සිටින සහ ඒ සඳහා දත්ත රැස්කරන තාක්ෂණ නිලධාරීන් සඳහා වැඩමුළුව. (කළමනාකරණ සංවර්ධන හා පුහුණු අංශය)	100	දින 01	23,300.00	–	දේශීය	මෙම තාක්ෂණ නිලධාරීන් විසින් සිතියම්කරණය සහ ඒ සඳහා තොරතුරු රැස්කර ගැනීම සිදුකළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
22. MIG/FCAW & Gas Cutting welding course (ශ්‍රී ලංකා - කොරියා ජාතික වෘත්තීය පුහුණු ආයතනය)	01	පැය 120	44,100.00	–	දේශීය	මෙම නිලධාරියා විසින් Gas Cutting welding පාඨමාලා පිළිබඳ මූලික අවබෝධය ලබා ගන්නා ලදී.

6.3.2 වෙනත් ආයතන මගින් සංවිධානය කළ පශ්චාත් උපාධි පාඨමාලා

පාඨමාලාව	නිලධාරීන් ප්‍රමාණය	කාලසීමාව	ආයෝජනය (රු.)	පාඨමාලාවේ ස්වභාවය (විදේශීය / දේශීය)	නිමැවුම් /ලබාගත් දැනුම
භූගෝලීය තොරතුරු පද්ධති සහ දුරස්ථ සංවේදන පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව(ශ්‍රී ජයවර්ධනපුර,සබරගමුව සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයන්)	10	අවු. 02	500,000.00	දේශීය	භූගෝලීය තොරතුරු පද්ධතිකරණයට අදාල සියළුම කරුණු අධ්‍යයනය කිරීමට මෙමගින් හැකියාව ලැබේ.
මැනුම් විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව (සබරගමුව විශ්ව විද්‍යාලය)	02	අවු.02	280,000.00	දේශීය	මැනුම් විද්‍යාවට අදාල සියළුම කරුණු අධ්‍යයනය කිරීමට මෙමගින් හැකියාව ලැබේ.

6.3.3 විදේශීය පුහුණු හා වැඩමුළු

පාඨමාලාව	නිලධාරීන් ප්‍රමාණය	කාලසීමාව	ආයෝජනය (රු.)	ලබාගත් දැනුම
			විදේශීය	
දුරස්ථ සංවේද සහ භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ පශ්චාත් උපාධිය හැදෑරීම	01	මාස 09	-	1.දුරස්ථ සංවේදක භෞතික විද්‍යාව 2. ස්ථානීය මිනුම්වල වර්ණාවලි අත්සන සහ දෘශ්‍ය රූප අර්ථ නිරූපණය 3. දුරස්ථ සංවේදක දත්ත දෝෂ, දත්ත නිෂ්පාදන සහ ඒවායේ මූලාශ්‍ර 4. තාප සහ මයික්‍රෝවේව් දුරස්ථ සංවේදනයේ මූලධර්ම පිළිබඳ දැනුම ලබාගැනීම
ගොවි බිම් ඒකාබද්ධ කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	01	දින 05	-	ශ්‍රී ලංකාවේ වාරි යෝජනා ක්‍රම සකස් කිරීම පිළිබඳ අත්පොත සැකසීම
එක්සත් ජාතීන්ගේ ගෝලීය භූ අවකාශීය කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	01	දින 05	-	1. ඉඩම් පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ හතරවන රැස්වීම විශේෂඥ කණ්ඩායම. 2. ඵලදායී ඉඩම් පරිපාලනය පිළිබඳ සම්මන්ත්‍රණය. 3. ශ්‍රී ලංකාවේ ඵලදායි ඉඩම් පරිපාලන පද්ධතිය සඳහා වන රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සිතියම ඉදිරිපත් කිරීම
JJ-Fast භාවිතා කරමින් නිවර්තන වනාන්තර කළමනාකරණය, ALOS - 2 පදනම් වූ වනාන්තර නිරීක්ෂණ පද්ධතිය සහ අනෙකුත් චන්ද්‍රිකා තාක්ෂණයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	01	දින 10	-	අපේ රට සඳහා තිරසාර වන කළමනාකරණය සඳහා JJ-FAST ALOS-2 පදනම් වූ වනාන්තර අධීක්ෂණ පද්ධතියක් භාවිතා කරන්නේ කෙසේද

ගෝලීය නාවික චන්ද්‍රිකා පද්ධතිය පිළිබඳ 4 වන පශ්චාත් උපාධි පාඨමාලාව	01	මාස 09	-	
ජාතික සිතියම්කරණය සහ මැනුම් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම	01	මාස 03	-	
ආසියා පැසිෆික් කලාපය සඳහා ගංවතුර සහ නායයෑම් අවධාරණය කරමින් ආපදා අවදානම් කළමනාකරණය සඳහා අභ්‍යවකාශ තාක්ෂණය භාවිතා කිරීම	02	දින 12		01. ගංවතුර සහ නාය යෑම් උවදුරුවලදී සහාය දැක්වීම සඳහා චන්ද්‍රිකා පදනම් කරගත් සන්නිවේදනය සහ සංචාලනය. 02. අධික වර්ෂාපතන සිදුවීම් විශ්ලේෂණය සඳහා චන්ද්‍රිකා දත්ත කට්ටල යෙදීම 03. නාගරික ගංවතුර උවදුරු අවම කිරීම සහ ආර්එස් සහ ජීඅයිඑස් ශිල්පීය ක්‍රම භාවිතයෙන් කළමනාකරණය කිරීම
කුඩා චන්ද්‍රිකා මෙහෙයුම	01	දින 12		01. ජාතික සංවර්ධනය සඳහා අභ්‍යවකාශ තාක්ෂණය යොදා ගැනීම 02. චන්ද්‍රිකා මෙහෙයුමේ පද්ධති ඉංජිනේරු සහ ව්‍යාපෘති කළමනාකරණය. 03. යාන්ත්‍රණ සහ තාප පාලන පද්ධතිය 04. කුඩා චන්ද්‍රිකා වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත්
එක්සත් ජාතීන්ගේ දෙවන ලෝක භූගෝලීය තොරතුරු සම්මේලනය	01	දින 05		01. ලෝක ආර්ථිකයේ සහ සමාජය තුළ භූ අවකාශීය දැනුම යටිතල ව්‍යුහයේ භූමිකාව ඉදිරියට ගෙන යාම 02. දුරස්ථව සංවේදී පෘථිවි නිරීක්ෂණවල නවෝත්පාදන භාවිතය 03. නවෝත්පාදන ස්ථාන පදනම් කරගත් සේවා 04. තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා පදනම් දත්ත සංවර්ධනය කිරීම 05. තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ප්‍රමිතිය අවබෝධ කර ගැනීම සහ අගය කිරීම 06. ජාතික භූ අවකාශීය තොරතුරු සැකැස්ම නවීකරණය කිරීම සහ පරිවර්තනය කිරීම
භූ විද්‍යාත්මක යෙදුම් සඳහා දුරස්ථ සංවේද දත්ත විශ්ලේෂණ ශිල්පීය ක්‍රමවල දියුණුව	02	දින 04		

මෙම වැඩමුළු සඳහා සහභාගි වූ නිලධාරින් විසින් ලබාගන්නා ලද දැනුම තම ශාඛාවන් වල අනෙකුත් නිලධාරීන්ටද ලබා දෙන ලදී.

7.0 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනදී ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් සහ ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA-N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම් පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් පිළියෙල කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූලනොවේ	පළාත් කාර්යාල මගින් අදාල ක්ෂේත්‍ර කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමට අමතර කාලයක් වැය කිරීමට සිදුවීම	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මුදල් රෙගුලාසි 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	සමහර අවස්ථාවල ප්‍රායෝගික තත්වයන් මත කල්ගතවී ඇත.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මූදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන සහ කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් සහ අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කිරීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර කිබීම.	අනුකූල නොවේ	පියවර කිහිපයක් යටතේ කටයුතුකිරීමේදී(සමීක්ෂණ මණ්ඩල/තක්සේරුමණ්ඩල පත් කිරීම, අමාත්‍යාංශ අනුමැතියලබාගැනීම,වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීම,ලංසු කැඳවීම වැනි කරුණු) එම කටයුතු පියවරෙන් පියවර යනවිට අදාල මණ්ඩල තීරණ ලබාගැනීමට කාලය ගතවීම	මණ්ඩලවල තීරණ ඉක්මණින් ලබාදීමට උපදෙස් ලබාදීම මගින්
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	ඉන්ධන දහන පරීක්ෂාව සඳහා වාහනවලට අවශ්‍ය සම්පූර්ණ ඉන්ධන ධාරිතාවය (Full Tank) සපයා ගැනීමට දැනට එක් වාහනයකට ලබා දෙන කෝටාව ප්‍රමාණවත් නොවීම මත ධාවන තත්ත්වයේ ඇති වාහන 300ක පමණ ප්‍රමාණයක ඉන්ධන දහන පරීක්ෂාව නියමිත කාලවලට සිදු කිරීමට නොහැකි වී ඇත.	දැනට ලබාදී ඇති ඉන්ධන කෝටාව ඉන්ධන දහන පරීක්ෂාවට පමණක් හෝ වැඩිකර ලබාදීමට අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයෙන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල වේ		
12	**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	නිහඟිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල නොවේ	කටයුතු කරමින් පවතී.	

13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම්ට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 සහ 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	විශාල කාර්ය මණ්ඩලයක් පැවතීම සහ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම නිසා සිදුකළ නොහැකි විය.	වර්ෂයකට පවතින ප්‍රතිපාදන තත්වය මත නිලධාරීන් කොටස් වශයෙන් හෝ පුහුණු අවස්ථා ලබාදීමට කටයුතු සම්පාදනය කළ යුතුය.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

8.0 සමාප්තිය

මෙම වසරේ දෙවන කාර්තුවේදී සාමාන්‍ය ජන ජීවිතයට බලපෑම් කරමින් රට පුරා පැතිර ගිය නොසන්සුන්කාරී වාතාවරණය හා වසර පුරා පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් දෙපාර්තමේන්තු කාර්ය භාරය ඉටුකිරීමද අභියෝගයක් වූ අතර රජයේ සහ මහජන අවශ්‍යතා ඉටු කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වසර ආරම්භයේදී සැලසුම් කළ ඉලක්ක සංශෝධනය කිරීමට සිදුවිය. කෙසේ වුවත් මැනුම් කටයුතුවලදී මෙම සංශෝධිත ඉලක්කයන් අභිබවා යන ප්‍රගතියක් ලබා දීමට ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය දැක්වූ කැපවීමත් විවිධ අපහසුතා මැද කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය මැනවින් පවත්වාගෙන යාමට දායකවූ දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවලට හා විවිධ මට්ටම්වලට අයත් සේවක මණ්ඩල සාමාජිකයින්ගේ සේවයත් ඉහළින්ම අගය කරන බව මෙහිලා සනිටුහන් කළ යුතුය. එමෙන්ම, මෙම කාර්යයන් ඉටු කිරීමේ දී සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරීන් මෙන් ම සියලුම වෘත්තීය සමිතිවලින් ලබාදුන් සහයෝගය ද ඉතා අගය කොට සලකමි.

එස්. සිවානන්දරාජා
සර්වේයර් ජනරාල්

සර්වේයර් ජනරාල් කාර්යාලයේ ශාඛාවන් මගින් ඉටුකළ කාර්යයන්

1. මානව සම්පත් හා පාලන අංශය

කාර්යභාරය

දෙපාර්තමේන්තුවේ කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම ඇතුලු මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ආයතනික හා පාලන කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම.

කාර්යසාධනය

මානව සම්පත් කළමනාකරණය යටතේ පහත සඳහන් කාර්යයන් ඉටුකර ඇත.

	කාර්යය	කටයුතු කිරීමට නියමිත වූ සංඛ්‍යාව	කටයුතු කළ සංඛ්‍යාව
1	සේවයට බඳවා ගැනීම්	495	279
2	සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම්	8	8
3	සේවය ස්ථිර කිරීම්	420	375
4	උසස් කිරීම්	278	260
5	වැටුප් වර්ධක ගෙවීම්	2105	1846
6	බඳවා ගැනීමේ පරිපාටි සැකසීම්	-	-
7	සේවය හැරයාම්	21	21
8	විශ්‍රාම යාම්	221	213
9	ඉල්ලා අස්වීම	31	26
10	වැඩ තහනම් කිරීම	14	14
11	නැවත සේවය පිහිටුවීම්	4	4
12	විදේශ නිවාඩු අනුමත කිරීම්	54	46
13	අමාත්‍ය මණ්ඩල සංදේශ	-	-
14	ණය අනුමත කිරීම් (දේපළ)	12	12

1.1 විනය අංශය

කාර්යභාරය

දෙපාර්තමේන්තුවේ සේවය කරන මිනින්දෝරු සේවයේ නිලධාරීන්ගේ, ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ හා දෙපාර්තමේන්තුගත තනතුරු වල සේවය කරනු ලබන සියලුම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 2 වන කාණ්ඩය ප්‍රකාරව මූලික විමර්ශන පැවැත්වීම, චෝදනා පත්‍ර නිකුත් කිරීම, අවවාද කිරීම සිදුකිරීම, විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම, විනය නියෝග නිකුත් කිරීම ඇතුලු විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට අදාල සියලුම රාජකාරී කටයුතු සහ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

කාර්යසාධනය

2022.01.01 දිනට විනය අංශයේ ක්‍රියාත්මකව පැවති ගොනු සංඛ්‍යාව	**2022** වසර තුළ ආරම්භ කරන ලද ගොනු සංඛ්‍යාව	**2022** වසර තුළ අවසන් කළ ගොනු සංඛ්‍යාව	**2022.12.31** දිනට විනය අංශයේ ක්‍රියාත්මකව පවතින ගොනු සංඛ්‍යාව
47	23	21	49

1.2 ප්‍රවාහන අංශය

කාර්යභාරය

ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම, වාහන අළුත් වැඩියාව/නඩත්තුව/පරීක්ෂාව සම්බන්ධ සියලු කටයුතු මෙන්ම වාහන අනතුරු වලට අදාල වන සියළුම කටයුතු පිළිබඳ ක්‍රියාකිරීම.

කාර්යසාධනය

	විෂය	**2022** වසර තුල ලැබූ ඉල්ලීම්	**2022** වසර තුල ඉටුකල ප්‍රමාණය	**2022** වසර තුල ඉටුකල නොහැකි ප්‍රමාණය
1	ආදායම් බලපත්‍ර ලබා ගැනීම	255	255	-
2	වාහන අනතුරු සම්බන්ධ ලිපි ලැබීම්	125	124	1
3	දෛනික ධාවන සටහන් ලැබීම්	5556	5556	-
4	වාහන අළුත්වැඩියා කිරීම	5	5	-
5	වාහන සඳහා ඉන්ධන සපයාදීම	151	151	-
6	රාජකාරී ගමන් සඳහා වාහන ලබාදීම	365	318	47
7	වාහන අනුයුක්ත කිරීම	16	16	-
8	නිවාඩු විස්තර යැවීම	6	6	-
9	නිල වාහන අනුයුක්ත කිරීම	5	5	-
10	අනිකාල/ගමන් වියදම් වවුචරපත් ඉදිරිපත් කිරීම	43	43	-
11	වාහන රක්ෂණය කිරීම	308	308	-
12	විගණන විමසුම්	7	7	-
13	සුභ සාධන කටයුතු සඳහා වාහන ලබාදීම්	9	9	-
14	සහන රියදුරු	8	8	-
15	වෙනත් ලිපි ගනුදෙණු	22	21	1
16	වාහන පරීක්ෂා කිරීම සඳහා ඉල්ලීම	42	41	1
17	රියදුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම	7	6	1
	එකතුව	**6930**	**6879**	**51**

දෙපාර්තමේන්තු වාහන වල සිදුවූ අනතුරු සම්බන්ධව පහත පරිදි කටයුතු කර ඇත.

2022 වසර ආරම්භයේ පැවති අනතුරු ගොනු සංඛ්‍යාව	**2022** වසර තුළ දී සිදු වූ අනතුරු සංඛ්‍යාව	**2022** වසර තුළ ක්‍රියාත්මක වූ මුළු අනතුරු ගොනු සංඛ්‍යාව	**2022** වසර තුළ අවසන් කළ අනතුරු ගොනු සංඛ්‍යාව	**2022.12.31** දිනට ක්‍රියාත්මකව ඇති ඉතිරි අනතුරු ගොනු සංඛ්‍යාව
40	11	51	18	33

2. නීති අංශය

කාර්යභාරය

දෙපාර්තමේන්තුවට සම්බන්ධ නීතිමය කටයුතු මෙහෙයවීම, දිසා අධිකරණය / මහාධිකරණය / අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණයන්හි දෙපාර්තමේන්තුව විසින් නඩු පැවරීමේදී හා දෙපාර්තමේන්තුවට එරෙහිව නඩු පැවරීම් සිදුවන අවස්ථාවන්හිදී නීතිපතිවරයා වෙත සහයෝගය දැක්වීම, දෙපාර්තමේන්තු නිලධාරීන් රාජකාරී කටයුතුවලදී මුහුණපාන නීතිමය ගැටලු වලට විසඳුම් ලබාදීම, දෙපාර්තමේන්තුවට එරෙහිව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන පරීක්ෂණවලදී සර්වේයර් ජනරාල් වෙනුවෙන් පෙනී සිටීම.

කාර්යසාධනය

අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු සම්බන්ධව පහත සඳහන් පරිදි ක්‍රියා කර ඇත.

අධිකරණය	**2022.01.01** දිනට පැවති සංඛ්‍යාව	**2022.12.31** දක්වා කාලය තුළදී ලැබුණු සංඛ්‍යාව	**2022.12.31** දක්වා කාලය තුළදී අවසන්වූ සංඛ්‍යාව	**2022.12.31** දිනට පවතින සංඛ්‍යාව
ශ්‍රේෂ්ඨාධිකරණය	28	04	01	31
අභියාචනාධිකරණය	26	13	06	33
මහාධිකරණය	03	02	-	05
දිසා අධිකරණය	37	06	01	42

මූලික කටයුතු සිදුකරන ගොනු සම්බන්ධව පහත සඳහන් පරිදි ක්‍රියා කර ඇත.

2022.01.01 දිනට පැවති සංඛ්‍යාව	**2022.12.31**කාලය තුළදී ලැබුණු සංඛ්‍යාව	**2022.12.31** දක්වා කාලය තුළදී අවසන් වූ සංඛ්‍යාව (මුදල් අයකර හෝ කපාහැරීමට යොමුකර)	**2022.12.31** දක්වා කාලය තුළදී නීතිපති වෙත යොමු කරන ලද ගොනු සංඛ්‍යාව	**2022.12.31** දිනට කටයුතු සිදුකරන ගොනු සංඛ්‍යාව
28	06	10	-	24

නඩු පැවරීම සඳහා නීතිපති වෙත ගොනු යොමු කිරීම පහත සඳහන් පරිදි සිදුකර ඇත.

2022.01.01 දිනට යොමු කර පැවති ගොනු	**2022.12.31** දක්වා කාලය තුළදී යොමු කරන ලද ගොනු	**2022.12.31** දක්වා කාලය තුළදී නීතිපති උපදෙස් මත අවසන් කළ හෝ නඩුපවරන ලද ගොනු සංඛ්‍යාව	**2022.12.31** දිනට නඩු පැවරීමට අදාලව කටයුතු සිදුකරන ගොනු සංඛ්‍යාව
10	-	01	09

මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ගොනු සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියාකර ඇත.

2022.01.01 දිනට පැවති සංඛ්‍යාව	**2022.12.31**දක්වා කාලය තුළදී ලැබුනු සංඛ්‍යාව	**2022.12.13** දක්වා කාලය තුළදී අවසන්වූ සංඛ්‍යාව	**2022.12.31** දිනට පවතින සංඛ්‍යාව
09	02	-	11

3. ගිණුම් අංශය

කාර්යභාරය

ගෙවිම් කාර්යාල 35 කින් සමන්විත දෙපාර්තමේන්තු ගිණුම් පද්ධතිය නිසි පරිදි පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුවේ වාර්ෂික පුනරාවර්තන හා මූලධන වියදම් ඇස්තමේන්තු සකස් කර රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම හා ඒ අනුව ලැබෙන ප්‍රතිපාදන සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙතින් අක්මුදල් ලබාගෙන සියලු කාර්යාල වෙත නිකුත් කර රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති වලට අනුව ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කිරීම.

දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති ප්‍රතිපාදන සීමාවන් තුළ වියදම් දරමින් මූල්‍ය කළමනාකරණය පවත්වා ගැනීම.

දෙපාර්තමේන්තුවේ ආදායම් ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් එකතු කිරීමට කටයුතු කිරීම.

විගණන විමසුම් සඳහා පිළිතුරු නිසි පරිදි අදාල පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීම හා දෙපාර්තමේන්තුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නියමිත දිනට ඉදිරිපත් කිරීම.

කාර්යසාධනය

කරුණාකර ප්‍රධාන වාර්තාවේ පිටු අංක 09-15 (වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය), පිටු අංක 24-28 (අනුකූලතා වාර්තාව) බලන්න.

4. උපකරණ හා ගොඩනැගිලි අංශය

කාර්යභාරය

- සර්වේයර් ජනරාල් කාර්යාලය, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල, දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල සහ දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලාවල සිදු කල යුතු අළුත්වැඩියාවන් සහ නව ඉදිකිරීම් පිළිබඳව කටයුතු කිරීම.
- මැනුම් උපකරණ සහ එහි උපාංග අළුත්වැඩියාව සහ සේවා කිරීම.
- මැනුම් පාලන ලක්ෂ්‍ය සඳහා අවශ්‍ය බෝල්ට් නිෂ්පාදනය.
- දෙපාර්තමේන්තුව සතු පෙරසවි කඳවුරු සමීක්ෂණ කටයුතු මෙහෙයවීම, පෙරසවි කඳවුරු ගැලවීම සහ සවිකිරීම්.
- සර්වේයර් ජනරාල් කාර්යාලයේ ආරක්ෂාව සහ පවිත්‍රතාවය සම්බන්ධව ක්‍රියා කරන බාහිර ආයතන වල කටයුතු සම්බන්ධීකරණය.
- ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලී පදනම මත ලබා ගැනීමේ කටයුතු සඳහා අදාල ගැසට් නිවේදන සැකසීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා දෙපාර්තමේන්තු හැඳුනුම්පත් නිකුත් කිරීම

කාර්යසාධනය

සිදු කරන ලද රුපියල් 50,000.00 ඉක්මවූ නව ඉදිකිරීම් හා අළුත්වැඩියාවන්

අනු අංකය	ව්‍යාපෘතිය	වියදම (රු.)
01	ආරක්ෂක මුර කුටිය අළුත්වැඩියා කිරීම.	84,360.00
02	දෙවන මහලේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම.	1,692,000.00
03	සර්වේයර් ජනරාල් කාර්යාලයේ කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම.	104,750.00

- ගිනි නිවන උපකරණ නැවත පුරවා අදාල ස්ථානවල නිසි පරිදි සාර්ථකව සවි කරන ලදී.
- ගිරිතලේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ඉදිකිරීම් අවසන් කර භාර දී ඇත.
- වාර්ෂික පූර්ණමාන සේවා ලේඛනය අනුව පූර්ණමාන 222 ක් උපකරණ කාර්මික ශිල්පීන් විසින් සේවාකර ක්ෂේත්‍රයට නිකුත්කර ඇත.
- එක්දින සේවා කටයුතු සිදු කිරීම් යටතේ පූර්ණමාන 18 ක් සේවාකර ක්ෂේත්‍රය වෙත නිකුත්කර ඇත.
- සේවා අළුත්වැඩියාව හේතුවෙන් ලැබෙන පූර්ණමාන උපාංග 139 ක් අළුත්වැඩියා කර නිකුත්කර ඇත.
- මැනුම් පාලන ලක්ෂ්‍ය සඳහා C වර්ගයේ බෝල්ට් 3,900 ක් නිෂ්පාදනය කර ඇත.

ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු

- සමාලෝචනයට භාජනය වූ වසර පුරාම මෙම සේවය දෙපාර්තමේන්තුවේ උපකරණ හා ගොඩනැගිලි අංශයේ අධික්ෂණය යටතේ ඉටුකර ඇත. පයනියර් ආරක්ෂක සමාගම විසින් 2022 නොවැම්බර් මස අවසානය දක්වාත් 2022 දෙසැම්බර් මස මුල සිට නෙවර් බැක් ආරක්ෂක සමාගම ආරක්ෂක සේවය සැපයු අතර, නිපුනි පවිත්‍රතා සමාගම විසින් 2022 ජූලි මස දක්වාත් ගගන ආරක්ෂක හා පවිත්‍රතා සමාගම විසින් 2022 අගෝස්තු මස සිට දෙපාර්තමේන්තුව පිරිසිදුව, පවිත්‍රව සහ දර්ශනීය ලෙස පවත්වා ගැනීම සිදු කරන ලදී.

5. ප්‍රසම්පාදන හා සැපයීම් අංශය

කාර්යභාරය

දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ හා සේවා අවශ්‍යතා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට ලබාගැනීම සහ බෙදා හැරීම, සියලුම ගබඩා ලෙජර නිසි ලෙස යථාවත් කර පවත්වා ගෙන යාම සහ වාර්ෂික ගබඩා සමීක්ෂණය අධීක්ෂණය කර නිෂ්කාෂණ ලබා දීම

කාර්යසාධනය

2022 වසර තුළ දී රුපියල් මිලියන 2 කට අධික ප්‍රාග්ධන මිලදී ගැනීම් ද රුපියල් මිලියන 14 කට ආසන්න පුනරාවර්තන මිලදී ගැනීම්ද , බිම් සවිය ව්‍යාපෘතිය සඳහා රුපියල් ලක්ෂ 4 කට ආසන්න පුනරාවර්තන මිලදී ගැනීම් ද සිදු කර ඇත.

සර්වේයර් ජනරාල් කාර්යාලයේ විවිධ අංශ, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සහ රට පුරා විසිරී සිටින මිනින්දෝරු නිලධාරීන් විසින් නඩත්තු කර ගෙන යනු ලබන ගබඩා ලෙජර 787 කට අදාලව ගබඩා සමීක්ෂණ කටයුතු නිම කර ඇත.

ඒවායින් රජයේ මිනින්දෝරුවරුන් 584 දෙනෙකුට ද, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල සියල්ලටමද, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සියල්ලටමද, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සියල්ලටමද, දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ ඇති ගබඩා ඒකක සියල්ලටමද, සංචාරක බංගලා සහ නිවාඩු නිකේතන සියල්ලටම ද, සර්වේයර් ජනරාල් කාර්යාලයේ අංශ සියල්ලටම ද, 2021.12.31 දිනට නිෂ්කාෂණ සහතික ලබා දී ගොනු නිරවුල් කරන ලදී.

විශ්‍රාම ගිය හා ඉල්ලා අස් වී ගිය නිලධාරීන් 39 දෙනෙකු සඳහා ස්ථිර නිශ්කාෂණ ලබා දී ඇත.

6. තොරතුරු තාක්ෂණ අංශය

කාර්යභාරය

අන්තර්ජාල සම්බන්ධතා හා විද්‍යුත් තැපෑල වැනි දියුණු සන්නිවේදන ක්‍රමද භාවිතා කරමින් මහජනතාවට තොරතුරු අන්තර්ජාලය මඟින් ලබා ගැනීම, පරිපාලන කටයුතු වලට සහායක සේවාවක් ලෙස මානව සම්පත් කලමණාකරණය , දත්ත ගබඩා කිරීම , තොරතුරු ඉක්මනින් හා ක්‍රමවත්ව ලබා ගැනීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම.

කාර්යසාධනය

පහත සඳහන් දත්ත පද්ධතීන් සහ මෘදුකාංග 2022 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය මගින් පිළියෙල කර ඇත.

1. මැනුම් ඉල්ලීමට අදාල පිහිටීම සහ එහි ප්‍රගතිය අන්තර්ජාලය ඔස්සේ පරීක්ෂා කළ හැකි යෙදවුම (Requisition Location Searcher)



දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මැනුම් ඉල්ලීම්වල පිහිටීම සහ ඊට අදාල මැනුම් තොරතුරු යථාවත් කිරීමටත් එය මහජනතාවට බලා ගැනීමට හැකිවන ආකාරයටත් Web Services තුල Requisition Location Searcher නමින් මෙම සේවාව ඇතුලත් කර ඇත. මෙමගින් පහත පහසුකම් සපයනු ලැබේ.

- දෙපාර්තමේන්තුව විසින් පිහිටුවන ලද පාලන ලක්ෂ්‍යද, දෙපාර්තමේන්තු කාර්යාලවල පිහිටීම, මැනුම් ඉල්ලීම්වලට අදාල තොරතුරුවලට අමතරව මෙම සිතියමට ඇතුලත් කර ඇති අතර, එමගින් මැනුම් ඉල්ලීම්වලට අදාල ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම පහසු කර ඇත.

- භූමියට අදාලව සිතියමේ පිහිටි ඕනෑම ලක්ෂ්‍ය දෙකක් අතර දුර මැනීම, යම් නිශ්චිත භූමි ප්‍රමාණයක දළ වර්ගඵලය ගණනය කිරීම, භූමියේ පිහිටීමකට අදාල නිශ්චිත ලක්ෂ්‍යයක සිට අවශ්‍යතාවය පරිදි තීරණය කරන්නාවූ දුර ප්‍රමාණයකට ඇතුලත් මැනුම් ඉල්ලීම් හා ඒ පිළිබඳ විස්තර බලාගැනීමට හැකිවීම.



2. අස්ථානගතවීම් සහ අලාභහානිවීම් පිළිබඳ වාර්තා කිරීම් කළමනාකරණය කිරීම(LDRS - Losses and Damages Report System)



ගබඩා භාණ්ඩ, උපකරණ, ගොඩනැගිලි, ලේඛන සහ රථවාහන පිළිබඳව සිදුවන අලාභහානි සම්බන්ධව වාර්තා කිරීම අධීක්ෂණය කළ හැකිය. මෙමගින් වාර්තා ප්‍රමාදවීම් හා අතපසුවීම් අවම කිරීමට සහ වාර්තා හුවමාරුව කාර්යක්ෂමව සිදුවන්නේදැයි යන්න ඉහළ පරිපාලනයට අන්තර්ජාලය ඔස්සේ නිරීක්ෂණයට හැකි ආකාරයට මෙම යෙදවුම පිළියෙළ කර ඇත.

3. පරිගණක කළමනාකරණ දත්ත පද්ධතිය (Computer Management System)



සර්වේයර් ජනරාල් කාර්යාලයේ දෘඩාංග, මෘදුකාංග හා ජාලකරණය සම්බන්ධ අළුත්වැඩියාවන් හා අදාල සහයන් වාර්තා සහිතව කළමනාකරණය කිරීම සහ පරිගණක හා උපාංග වත්කම් කළමනාකරණය කිරීමට මෙම දත්ත පද්ධතිය නිර්මාණය කර ඇත.

සර්වේයර් ජනරාල් කාර්යාලය සතු පරිගණක උපාංග ප්‍රමාණය පිළිබඳවද එක් එක් පරිගණක හා උපාංගයන් අළුත්වැඩියාව පිළිබඳ තොරතුරු ලබාගැනීම සහ දිනයකදී කළයුතු අළුත්වැඩියාවන් ක්‍රමානුකූලව අනුපිළිවෙළින් කළහැකි වීම තුලින් කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට හැකිවී ඇත.

මෙම වසරේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් පහත සඳහන් සේවාවන් සපයන ලදී.

- ප්‍රධාන කාර්යාලයේ පරිගණක හා පරිගණක උපාංග සඳහා වන පරිගණක දෝෂ නිවැරදි කිරීම හා ඊට අවශ්‍ය උපදේශන සේවා සැපයීම.
- ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාල පද්ධතිය කළමනාකරණය හා පවත්වා ගෙන යාම.
- මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ අංශය මඟින් පිළියෙල කරන ලද අනෙකුත් දත්ත පද්ධතීන් පවත්වා ගෙන යාම හා වැඩි දියුණු කිරීම.
- දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා පවත්වා ගෙන යාම.
- ප්‍රධාන කාර්යාලයේ දෛනික පැමිණීම හා පිටවීම සටහන් කිරීම සහ දෙපාර්තමේන්තු දුරකථන අංක හා විද්‍යුත් ලිපින නාමාවලිය පිලිබඳ තොරතුරු දත්ත පද්ධති පවත්වා ගෙන යාම.

7. භූමිතික මැනුම් ශාඛාව

කාර්යභාරය

දිවයින ආවරණය වන පරිදි සිරස් හා තිරස් භූමිතික පාලන ජාලය පවත්වා ගැනීම හා භූමිතික මැනුම් කටයුතු වලට අදාල සම්මතයන් සැකසීම, දත්ත බැංකු නඩත්තු කිරීම හා අධීක්ෂණ කටයුතු කිරීම.

කාර්යසාධනය

වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු

අනු අංකය	කාර්යය
1	ගන්දර වරායේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම (N,E,Z ඛණ්ඩාංක)
2	JICA ආධාර මත හාලි ඇල අවට මාර්ග පිළිසකර කිරීම සඳහා පාලන ලක්ෂ්‍ය පිහිටුවීම (N,E,Z ඛණ්ඩාංක)
3	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අදාල පාලන ලක්ෂ්‍ය පිහිටුවීම.(අදියර-2) (N,E,Z ඛණ්ඩාංක)
4	කුඹුක්කන් ඔය වාරි ව්‍යාපෘතියෙහි පාලන ලක්ෂ්‍ය පිහිටුවීම (N,E,Z ඛණ්ඩාංක)
5	යෝජිත උතුරු මැද පලාත් ඇළ මාර්ග ව්‍යාපෘතියේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම (NCP Canal Project) (N,E,Z ඛණ්ඩාංක)
6	දිස්ත්‍රික්ක වලින් කරනු ලබන ඉල්ලීම් අනුව පාලන ලක්ෂ්‍යන් පිහිටුවීමේ මැනුම් කටයුතු (N,E,Z ඛණ්ඩාංක)
7	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ මැනුම් කටයුතු සිදු කිරීම (අදියර 2)
8	අලුපොල වතු මැනුම් කටයුතු සිදු කිරීම
9	කීරගල වතු මැනුම් කටයුතු සිදු කිරීම
10	බ්‍රාහ්මණගම යෝජනා ක්‍රමයේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම

වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ සේවා සැපයීම්

අනු අංකය	කාර්යය
1	බලයලත් මිනින්දෝරුවරුන් සහ වෙනත් ආයතන වෙත පාලන ලක්ෂ්‍ය වල සහ පිල් ලකුණු වල විස්තර සැපයීම
2	SLCORSnet තාක්ෂණය භාවිතයෙන් මැනුම් කටයුතු කිරීම සඳහා අවශ්‍ය සේවාවන්, රජයේ ආයතනවල භාවිතා කරන්නන් 18 කට සහ බලයලත් මිනින්දෝරුවරුන් වැනි පෞද්ගලික අංශයේ භාවිතා කරන්නන් 26 කට සැපයීම. (මෙමගින් උපයන ලද ආදායම රු. 1,454,740.00 කි)
3	පාලන ලක්ෂ්‍ය සහ පිල් ලකුණු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම

8. විශේෂ මැනුම් හා තත්ත්ව පාලන අංශය

කාර්යභාරය

නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන් හා හදිසි මැනුම් අවශ්‍යතා කාර්යක්ෂමව ඉටුකර දීම, භූමි තොරතුරු සම්බන්ධ අර්බුදකාරී ප්‍රශ්නවලදී නියමිත තත්ත්ව පාලනයන් සිදුකොට ගුණාත්මක භූමි තොරතුරු අදාල අංශයන් වෙත ඉදිරිපත්කිරීම, දිවයිනට බලපාන හදිසි ආපදා තත්වයන්හීදී ජනතාවට සහන සැපයීමට අවශ්‍යය මැනුම් හා සිතියම්කරණ කටයුතු කාර්යක්ෂමව ඉටුකර දෙමින් ජාතික සංවර්ධන වැඩපිළිවෙල සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරෝගාමී දායකත්වයක් සැපයීම.

කාර්යසාධනය

- කුරුණෑගල ආඩිගෙදර වත්ත මැනුම් කිරීම
- රත්මලාන ගුවන් තොටුපොළ මැනුම් කිරීම
- පලාලි අධි ආරක්ෂිත කලාප අත් කර ගැනීම සඳහා මැනුම් කිරීම
- පූජාභූමි මැනුම් යටතේ කොටහේන පරමානන්ද පුරාණ විහාරය, හුණුපිටිය ගංගාරාම විහාරය පැපිලියාන සුනේත්‍රා දේවි විහාරය සහ මුලතිවු කුරුන්දි විහාරය මැනුම් කිරීම
- කොළඹ නෙළුම් කුළුණ මැනුම් කිරීම
- කොළඹ අවට පාසැල් 8 ක මැනුම් කිරීම
- දිස්ත්‍රික් ධිවර කළමනාකරණ කලාප සීමා නිර්ණය කිරීමේ මැනුම් කිරීම
- උසාවි මැනුම් යටතේ මයිනාගෝගම, ගෝඨාගෝගම, ජනාධිපති මන්දිර පරිශ්‍රය, ජනාධිපති පෞද්ගලික නිවස අග්‍රාමාත්‍ය කාර්යාල පරිශ්‍රය මැනුම් කිරීම
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා මාලිමා යන්ත්‍රයක් ක්‍රමාංකනය කිරීම
- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ තැපැල් කර්යාල පරිශ්‍රය මැනුම් කිරීම
- පලාලි ගුවන් හමුදා කඳවුරේ අනුරේඛනය සැකසීම
- රත්මලාන ගුවන් තොටුපොළ II අදියර මැනුම් කිරීම
- උසාවියට විද්‍යාත්මක සාක්ෂි සඳහා උසාවි GPS උපකරණ විශ්ලේෂණය කිරීම
- වතු මැනුම් යටතේ හෙයර්පාර්ක් - හුන්නස්ගිරිය, පුස්සැල්ල-ඇහැලියගොඩ, ආගරපතන - හපුතලේ යන මැනුම් කිරීම
- පුත්තලම් කලපුව මැනුම් කිරීම
- ශ්‍රී ලංකා ඇමරිකානු තානාපති කර්යාලට අයත් ඉඩම මැනුම් කිරීම
- ආංකිත පිඹුරු සැකසීම මූලික පිඹුරු 161 (කොළඹ නගර සීමාව තුල)
- ගොඩගම හංවැල්ල මාර්ගය දෙපස අධිස්ථාපනය කර පැරණි මායිම් දත්ත පෙන්වීම

2022 වර්ෂයේ ඉහත නිම කර ඇති මැනුම් මඟින් රු.17,499,511.96 ක මුදලක් රජයට උපයා දී ඇත.

9. භූ විඥාපන අංශය

9.1 ගුවන් මැනුම් අංශය

කාර්යභාරය

- ගුවන් ඡායාරූප, චන්ද්‍රිකා ඡායාරූප, UAV සහ LiDAR දත්ත භාවිතයෙන් සිතියම්කරණය සහ අනෙකුත් සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය වන භූගෝලීය දත්ත රැස්කිරීම.
- LiDAR දත්ත මත පදනම් වූ ඉහළ නිරවද්‍යතාවයෙන් යුතු උසස් තත්වයේ හා විශ්වාසනීය භූගෝලීය දත්ත සැපයීම.
- සිතියම්කරණ අවශ්‍යතාවන් සඳහා වන ගුවන් ඡායාරූප ලබාදීම.
- ඉල්ලීම් මත ගුවන් ඡායාරූප අංකිත ආකෘතියෙන් ප්‍රති නිෂ්පාදනය කිරීම.
- ලේඛනාරක්ෂණය සඳහා ගුවන් ඡායාරූප පරිලෝකනය කිරීම.

කාර්යසාධනය

2022 වසර තුළ ඉටුකරන ලද කාර්යයන්

- චන්ද්‍රිකා ඡායාරූප මගින් උපුටා ගන්නා 2D දත්ත භාවිත කර 10K පත්‍ර 172 ක් යාවත්කාලීන කරන ලදී. (6888 ව.කි.මී.)
- පාරිභෝගික ඉල්ලීම් මත LiDAR point clouds සකස් කර DSM නිර්මාණය කිරීම (17 ව.කි.මී.)
- පාරිභෝගික ඉල්ලීම් මත point clouds ලෙස LiDAR දත්ත නිකුත් කිරීම-8863.97 ව.කි.මී. DEM-1785 ව.කි.මී., සමෝච්ච රේඛා-7874.5 ව.කි.මී., Rapid Ortho Images-1155 ව.කි.මී.
- පාරිභෝගික ඉල්ලීම් මත ගුවන් ඡායාරූප 180 ක් නැවත මුද්‍රණය කිරීම.
- පාරිභෝගික ඉල්ලීම් මත ගුවන් ඡායාරූප අංකිත දත්ත 447 ක් නිකුත් කිරීම.
- සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා ගුවන් ඡායාරූප 3023ක පටල පට (ඍණ ඵලක / ධන ඵලක) පරිලෝකනය (Scanning) කිරීම.

9.2 දුරස්ථ ග්‍රහණ අංශය

කාර්යභාරය

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ඉහළ විභේදනයෙන් යුත් චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් 1:50,000 අංකික භූලක්ෂණාත්මක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සහ 1:50,000 සිතියම්කරණයට අවශ්‍ය යාවත්කාලීන කරන ලද දත්ත සැපයීම.

ඉහළ විභේදනයෙන් යුත් චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් 1:10,000 අංකික භූ ලක්ෂණාත්මක දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සහ තවදුරටත් වැඩි දියුණු කිරීම් සිදුකිරීම සඳහා යාවත්කාලීන කරන ලද දත්ත භූගෝලීය තොරතුරු පද්ධති අංශය වෙත සැපයීම.

කාර්යසාධනය

- ශ්‍රී ලංකාවේ දකුණු කොටසේ වර්ග කිලෝමීටර 39017 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි ඉහළ විභේදනයෙන් යුත් චන්ද්‍රිකා ඡායාරූප භාවිත කරමින් මෙම වසරේදී 1:50,000 සිතියම් මාලාවේ පත්‍ර 46 ක් යාවත්කාලීන කිරීම සම්පූර්ණ කර ඇත.

- වර්ග කිලෝමීටර් 5223ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි ඉහළ විභේදනයෙන් යුත් චන්ද්‍රිකා ඡායාරූප භාවිත කරමින් මෙම වසරේදී 1:10,000 සිතියම් මාලාවේ පත්‍ර 144 ක් යාවත්කාලීන සම්පූර්ණ කර ඇත.

9.3 භූගෝලීය තොරතුරු පද්ධති අංශය

කාර්යභාරය

ජාතික අවශ්‍යතාවන් මෙන්ම විවිධ රාජ්‍ය ආයතන හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති නිර්මාණය කිරීම, දත්ත එක්රැස් කිරීම, පවත්වා ගැනීම, යාවත්කාලීන කිරීම සහ බෙදාහැරීම.

කාර්යසාධනය

1:10,000 පරිමාණයේ අඛණ්ඩ භූලක්ෂණාත්මක දත්ත පද්ධති නිර්මාණය කිරීම

- 1:10,000 පත්‍රවල වර්ග කිලෝමීටර් 7520 ක 3.2 පිටපතේ (version) භූ.තොර.ප. කාර්යයන් සම්පූර්ණ කිරීම.
- 1:10,000 දත්ත පද්ධතිය සඳහා අඛණ්ඩ දත්ත (seamless) සකස් කිරීම.
- 1:10,000 දත්ත පද්ධතිය භාවිත කර රටේ වර්ග ප්‍රමාණය නැවත ගණනය කිරීම සහ සම්පාදනය කිරීම.
- GN සහ DS දත්ත පද්ධතීන්ට ස්ථානීය කේත අංක ඇතුළත් කිරීම.

ඉල්ලීම් මත මාර්ගගත දත්ත සේවා සැපයීම

- SD දත්ත පද්ධතියෙන් දත්ත ස්ථර ලබාගැනීමට NSDI දත්ත ආදර්ශකය සඳහා Python පිටපත් නිර්මාණය කරන ලදී.
- වෙබ් සේවාවක් ලෙස දෙපාර්තමේන්තු ස්ථාන දත්ත පද්ධතිය සම්පූර්ණ කර පළකරන ලදී.
- වෙබ් සේවාවන් යාවත්කාලීන කිරීම සහ රෝහල් වෙබ් සේවාව, පාසල් වෙබ් සේවාව, GN වෙබ් සේවාව, වැව් වෙබ් සේවාව සම්බන්ධයෙන් වන වෙබ් යෙදුම් සහ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු පිහිටීම නිර්මාණය කිරීම.
- ශ්‍රී ලංකාවේ පරිපාලන මායිම් වල යාවත්කාලීන පිටපත (version) සකස් කිරීම.
- සමස්ත දිවයින ආවරණය කිරීම සඳහා 1:10,000 සහ 1:50,000 ජාල පද්ධතිය පළ කිරීම.

10. සිතියම්කරණ අංශය

කාර්යභාරය

දෙපාර්තමේන්තු කාර්යභාරයේ වැදගත් අංශයක් වන සිතියම්කරණය යටතේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය භූ ලක්ෂණාත්මක සිතියම් සහ විවිධ විෂයයන්ට අදාලව තේමා සිතියම් නිෂ්පාදනය, පාරිභෝගික ඉල්ලීම අනුව සිතියම් සකස් කිරීම, සිතියම් හා සම්බන්ධ සියලුම නිෂ්පාදන මුද්‍රිත හා අංකිත යන ආකාර වලින් මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම මෙම අංශයෙන් ඉටුකෙරේ.මීට අමතරව, දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයෙන් හා සියලු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වලින් සියලුම මුද්‍රිත සිතියම් ලබාගත හැක.තවද, කූරියර් සේවාවක් (Courier Service) මාර්ගයෙන් පාරිභෝගිකයන් සඳහා සිතියම් හා ආංකිත දත්ත නිවසටම ගෙන්වා ගැනීමේ පහසුකම් ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් හඳුන්වා දී ඇත.

කාර්යසාධනය

භූ ලක්ෂණාත්මක සිතියම් ඇඳීම් ඒකකය මගින් නිම කරන ලද කාර්යයන්

- 1:50,000 සිතියම් මාලාවේ දෙවන සංස්කරණය යටතේ සිතියම් පුනරීක්ෂණ 05 ක්
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සිතියම් 62 ක්
- මහජන අවශ්‍යතා මත 1:10,000 පරිමාණයේ සිතියම් 108 ක්

තේමා සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

- දෙවන සංස්කරණයෙහි දිස්ත්‍රික් සිතියම් 02 ක්
- මාර්ග හා නගර සිතියම් සංග්‍රහය – 2වන සංස්කරණය සිතියම් 18 ක්
- කාලානුරූප අවකාශීය දත්ත වෘත්ත මඟින් නිරූපිත සිතියම් 01 ක්
- වරාය නගර සිතියම් 01
- ත්‍රිමාණ ගණකයක් මඟින් අවකාශීය දත්ත කාලානුරූපීව නිරූපිත සිතියම් 01 ක්
- අවකාශීය දත්ත කාලානුරූපීව සමෝච්ච රේඛා මඟින් නිරූපිත සිතියම් 02 ක්

විශේෂ සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

- පාරිභෝගික ඉල්ලීම මත සකස් කරනු ලබන සිතියම් 1,467

තත්ත්ව පාලන අංශය මගින් නිම කරන ලද කාර්යයන්

- භූ ලක්ෂණාත්මක සිතියම් (ඇඳීම්), විශේෂ සිතියම්, තේමා සිතියම් යන අංශයන්හි සිතියම් තත්ත්ව පාලනය

2022 වසර තුළදී සිතියම් නිෂ්පාදනයේ ප්‍රගතිය පහත දක්වා ඇත.

සිතියම් වර්ගය	ඒකකය	වාර්ෂික ඉලක්ක	ලබාගත් ප්‍රගතිය
මහජන අවශ්‍යතා මත 1:10,000 සිතියම් සැකසීම	සිතියම් ගණන	36	108
1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම් (දෙවන සංස්කරණය-පුනරීක්ෂණ)		06	05
පාරිභෝගික සිතියම් **සිතියම් වර්ගය**		660	1,467
තේමා සිතියම්		24	33
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සිතියම්		60	62
1:50,000 සංතතික දත්ත පද්ධතියෙහි දෝෂ ඉවත්කිරීම	පත්‍ර ගණන	18	18



සිතියම් විකිණීම

මුද්‍රිත සිතියම්, අංකිත සිතියම් හා අංකිත දත්ත විකිණීමෙන් හා රාජ්‍ය භාගය අයකර ගැනීම් මගින් පහත සඳහන් පරිදි ආදායම උපයාගෙන ඇත.

මැනුම්පති කාර්යාලය

- මුද්‍රිත සිතියම් විකිණීම = රු. 2,552,547.50
- පාරිභෝගික අවශ්‍යතා සඳහා විශේෂ සිතියම් විකිණීම = රු. 1,681,980.60
- අංකිත දත්ත නිකුත් කිරීමෙන් ලද ආදායම = රු. 2,485,161.18

මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල

- මුද්‍රිත සිතියම් විකිණීම = රු. 1,664,675.00
- සිතියම්, අංකිත සිතියම් හා අංකිත දත්ත විකිණීමෙන් ලද මුළු ආදායම = රු. 8,384,364.28

සිතියම්කරණ අංශය මගින් සිදු කරන ලද විශේෂිත කාර්යයන්

- පිඹුරු වර්ණ මුද්‍රණ ඒකකය මගින් සිදුකරන කාර්යයන් වන Layout සෑදීම, නිර්මාණකරනය, අනෙකුත් දෙපාර්තමේන්තු අවශ්‍යතා 2022 වර්ෂයට අදාල සියල්ල නිමකර ඇත.
- පොත් බැඳීම් අංශය මගින් කරන කාර්යයන් අතුරින් ක්ෂේත්‍ර පොත් සහ PE ලෙජර බැඳීම් ප්‍රධාන කාර්යයක් වන අතර වැඩ තුණ්ඩු ප්‍රමාණය අනුව සියලුම වැඩ නිමකර ඇත.

2022 වසරේ සිදුකළ විශේෂ කාර්යයන් අතර පහත සඳහන් පොත් හා ලෙජර බැඳීම් ඇතුළත් වේ.

ක්ෂේත්‍ර පොත්	-	4850 (ක්ෂේත්‍ර පොත් ,මට්ටම් පොත්)
පොත් බැඳීම්	-	64
සිතියම් ඇලවීම්	-	3
PE ලෙජර	-	80

මෙම වසරේදී පහත ප්‍රමාණ වලින් සිතියම්, පොත් හා ආකෘති පත්‍ර මුද්‍රණ කටයුතු සිදුකර ඇත.

වර්ගය	පොත්, පත්‍ර හෝ සිතියම් ගණන ගණන	මුද්‍රණ ප්‍රමාණය
මාර්ග සිතියම (Travellers Map)	01	2,500
නගර සිතියම්	03	2,500
50K සිතියම් කොටස්	09	15,000
හමුදාව සඳහා ග්‍රිඩ් පත්‍ර	09	1,142
50K සිතියම් නැවත මුද්‍රණ	33	16,500
කාලේ පත්‍ර	01	15,600
ඉඩම් විස්තර ලැයිස්තු	01	46,000
පිඹුරු පත්‍ර	01	5,000
ලිපි ශීර්ෂ (සර්වේයර් ජනරාල් කාර්යාලය)	01	5,000
ලිපි ශීර්ෂ (ක්ෂේත්‍ර කාර්යාල)	01	8,000
EDM පිටු / ක්ෂේත්‍ර පොත් පිටු	4742	33,200
ක්ෂේත්‍ර පොත් ඇතුලත කවර	5000	5,000
දෙපාර්තමේන්තු පෝරම	31	120,630
ගබඩා ලෙජර	04	420
PE ලෙජර	80	4,000
වෙනත් පොත් සහ සඟරා	335	-
Outline සිතියම්	03	6,000
වෙනත් සිතියම්	04	1,500

11. භූගෝලීය නාම අංශය

කාර්යභාරය

ශ්‍රී ලාංකීය ජනතාවගේ සංස්කෘතික උරුමය හා බැඳුණු ජාතික සමගියට අනුබලයක් වන නිවැරදි වූත්, නිශ්චිත වූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතිකරණය තුළින් හඳුන්වා දීම.

කාර්යසාධනය

- භූගෝලීය නාම වෙබ් අඩවිය මගින් ලබා ගන්නා ලද මහජන අදහස් 531 ක් යාවත්කාලීන කිරීම.
- භූගෝලීය නාම දත්ත පද්ධතියේ භූගෝලීය නාම 127,875 ක් රෝමාණුකරණය කිරීම.
- භූගෝලීය නාම දත්ත පද්ධතියේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ගෙන් භූගෝලීය නාම 209 ක් සංශෝධනය කිරීම.

ක්‍රියාකාරකම	ඒකකය	වාර්ෂික ඉලක්කය	ලබාගත් ප්‍රගතිය
වෙබ් දත්ත පද්ධතිය මගින් ලබා ගන්නා මහජන අදහස් ඇතුළත් කිරීම	මහජන අදහස් ගණන	600	531
භූගෝලීය නාම දත්ත පද්ධතියේ භූගෝලීය නාම රෝමාණුකරණය කිරීම	භූගෝලීය නාම ගණන	96,000	127,875
සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ගෙන් භූගෝලීය නාම සංශෝධනය කිරීම	භූගෝලීය නාම ගණන	120	209

12. ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය

කාර්යභාරය

මෙම ශාඛාවේ සුරක්ෂිතව තබා ඇති බොහෝ පැරණි පිඹුරු වල උධෘත මහජනයා විසින් කරනු ලබන ඉල්ලීම් අනුව සැපයීම, මෙම ශාඛාවෙහි ගොනු කෙරෙන, ක්ෂේත්‍රයේ සිදු කරන මැනුම් වලින් පසු පිළියෙළ කරන සියලු ව්‍යවස්ථාපිත පිඹුරුවල සහතික පිටපත් පසුව කෙරෙන මැනුම්වලින් යාවත්කාලීන කර පවත්වාගෙන යාම, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා අවසාන ගම් පිඹුරු සැකසීම.

කාර්යසාධනය

12.1 හිමිකම් පිඹුරු පිටපත් නිකුත් කිරීම

හිමිකම් පිඹුරු හා වෙනත් පිඹුරුවල නිකුත් කරන ලද පිටපත් ගණන	1898

මෙම පිටපත් නිකුත් කිරීමෙන් රු. 2,540,950.00 ක මුදලක් උපයා ඇත.

12.2 දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් නිකුත් කරන ලද රේඛා චිත්‍ර විමර්ශන ලේඛනාගාරයේ ඇති ලේඛනයේ සටහන්කර අදාල ඉඩම් විස්තර ලැයිස්තු පිටු යාවත්කාලීන කිරීම

නිරවුල් නියෝග රේඛා සටහන් (S)	590
මුළුමනින් ම පැවරූ ඉඩම් සටහන් හා පැවරුම් නියෝග රේඛා සටහන් (O සහ V)	1233
බදු රේඛා චිත්‍ර (L)	590
මහජනයාට නිකුත් කරන ලද අනුරේඛන ගණන	3451
මහජනයාට නිකුත් කළ සත්‍ය ඡායා පිටපත් ගණන	41857
ඉ.සං.ආ. යටතේ නිකුත් කර ඇති රේඛා චිත්‍ර ගණන	1757

12.3 උසාවි කොමිෂන් මැනුම් සම්බන්ධීකරණය

පසුගිය වසරෙන් ඉදිරියට ගෙන ආ උසාවි කොමිෂන් සංඛ්‍යාව	715
වසර තුළ ලැබුණු උසාවි කොමිෂන් සංඛ්‍යාව	597
වැඩ නිමකර උසාවිවලට යැවූ සංඛ්‍යාව	420
වසර අගදී ඉතිරි සංඛ්‍යාව	892

12.4 ඉඩම් නිරවුල් කිරීමේ පනත යටතේ අවසාන ගම් පිඹුරු සහ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සැකසීම

පසුගිය වසර අවසානයට ඉතිරිය	19
2022 වසර තුළදී ලැබුණු ප්‍රමාණය	01
2022 දී සකසා නිකුත් කරන ලද අවසාන ගම් පිඹුරු හා අවසාන භූලක්ෂණාත්මක පිඹුරු සංඛ්‍යාව	15
2022 වසර අවසානයට ඉතිරිය	05

12.5 පැරණි ලේඛන අළුතින් පිළියෙල කරන ලද පිඹුරු අනුව යාවත්කාලීන කිරීම

පසුගිය වසර අවසානයේ යාවත්කාලීන කිරීමට ඉතිරිව තිබූ පිඹුරු ගණන	3,776
2022 වසර තුළදී ලැබුණු ප්‍රමාණය	10,473
යාවත්කාලීන කරන ලද පැරණි මූලික පිඹුරු ගණන	1,418
අවසාන ගම් පිඹුරු හා අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සංඛ්‍යාව	2,848
භූ ලක්ෂණාත්මක මූලික පිඹුරු හා ගම් පිඹුරු සංඛ්‍යාව	512
කැඩැස්තර සිතියම් ගණන	6,839
වසර අවසානයේ ඉතිරිය	2,662

12.6 පැරණි පිඹුරු සංරක්ෂණය

ලේඛණ කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වලින් පරිලෝකනය කරන ලද පිඹුරුවල පිළිබිඹු දත්ත එක්රැස්කර දත්ත ගබඩාවට ඇතුළත් කිරීම	138,992
අළුත්වැඩියා කරන ලද පිඹුරු සංඛ්‍යාව	5287
12.7 මැනුම් සඳහා අවශ්‍ය විස්තර සැපයීම (L 96A)	2,033

13. ඉඩම් තොරතුරු පද්ධති අංශය

කාර්යභාරය

මහජන අවශ්‍යතා සඳහා ඉඩම් තොරතුරු ලබාදිය හැකි යාවත්කාලීන වූ ඉඩම් තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාම.

කාර්යසාධනය

ප්‍රගතිය	කඩඉම් මැනුම්		විකිරණ මැනුම්		බිම් කැබලි වියමන		වතු සහ කැලෑ මැනුම්	
	කැබලි	පත්‍ර	කැබලි	පත්‍ර	කැබලි	පත්‍ර	කැබලි	පත්‍ර
2022 වසර දක්වා	1,755,501	26,392	246,045	14,090	103,668	27,082	16,046	7,064
2022 වසර තුළ	214,996	4,721	18,897	1,661	-	-	-	-
2022 වසර අවසානයේ	1,970,497	31,113	264,942	15,751	103,668	27,082	16,046	7,064

- ක්ෂේත්‍රයෙන් එවනු ලබන පිඹුරු ආශ්‍රිත දත්ත, ඉඩම් තොරතුරු දත්ත පද්ධති අංශය තුළ තත්ව පරීක්ෂාවෙන් පසු පෙර සැකසුම් සිදුකර එම දත්ත නැවත භාවිතය සඳහා අන්තර්ජාල යෙදුමක් (Web Application) මගින් පහසුකම් සැලසීම.
- ඉඩම් තොරතුරු දත්ත පද්ධතියට අදාල මෘදුකාංග අනාගත අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- විකිර්ණ මැනුම් සඳහා පිළියෙළ කළ පිඹුරු ආංකිතකරණයට ක්‍රමවේදයක් සැකසීම හා ඊට අදාල මෘදුකාංග සැකසීම.
- ඉඩම් තොරතුරු දත්ත පද්ධතිය සඳහා ආංකිත දත්ත කළමනාකරණය සහ දත්ත නිවැරදිව පිළියෙළ කර ගැනීම පිළිබඳ තාක්ෂණික නිලධාරීන් සඳහා සහ රජයේ මිනින්දෝරුවන්, මිනින්දෝරු අධිකාරිවරුන් සඳහා වැඩමුළු පැවැත්වීම.
- ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් සිදු කරනු ලබන ඉල්ලීම් වලට අදාලව කැඩැස්තර පිඹුරු ලබාදීමේ සේවාවක් සැපයීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ කැඩැස්තර දත්ත අනුසාරයෙන් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා අන්තර්ජාල මෙවලම් පිටුවක් (Web Application Page) නිර්මාණය කිරීම.



14. ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය ශාඛාව

කාර්යභාරය

අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිත කිරීම හා හුවමාරු කිරීම සඳහා විධිමත් ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කෙරෙන ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය සැකසීමේ වැඩසටහනෙහි ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ ප්‍රතිපත්ති සැකසීමේදී අවශ්‍ය සහාය ලබා දීම.

කාර්යසාධනය

- සංකල්පීය ආකෘතිය, තාර්කික ආකෘතිය සහ භෞතික ආකෘතිය සඳහා අධ්‍යයනය කිරීම සහ විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය වන වැදගත් පියවර ගැනීම.
- සියළුම ආකෘතීන් සඳහා ඉඩම් පරිහරණය ගොඩනැගිලි, භූමිය, රක්ෂිත වල විශේෂාංග යාවත්කාලීන කිරීම.
- 50K දත්ත කට්ටලයේ සිට NSDI දත්ත ආකෘතිය දක්වා දත්ත සංක්‍රමණය ස්වයංක්‍රීය කිරීම. (ප්‍රවාහන සහ ජලවිදුලි ස්වභාවයේ දත්ත කට්ටල සඳහා)

15. පර්යේෂණ හා සංවර්ධන අංශය

කාර්යභාරය

දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය කෙරෙහි බලපාන දුර්වල ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඒවා යථාවත් කර ගැනීම සඳහා අදාල යෝජනා ඉදිරිපත් කිරීම, දෙපාර්තමේන්තුවේ මැනුම් හා සිතියම්කරණය සඳහා අවශ්‍ය වන නව ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ ඒවා දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා හඳුන්වාදීම, නව තාක්ෂණික ක්‍රමවේදයන් පර්යේෂණ තුළින් හඳුන්වා දීම, නව තාක්ෂණය හැසිරවීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම, දෙපාර්තමේන්තු සිතියම්, පිඹුරු යනාදියේ තත්ත්ව පිරිවිතරයන් ආරක්ෂා කිරීම, දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හා නිත්‍ය නියෝග නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම.

කාර්යසාධනය

- 88 වන මැනුම් සභරාව අගෝස්තු මස ප්‍රකාශයට පත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ පවත්වා යනු ලබන TLDMS සහ SRIMS දත්ත පද්ධති වල දැනට පවතින යෙදුම් වැඩිදියුණු කිරීම, විශ්ලේෂණය සහ සංශෝධන සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.
- සර්වේයර් ජනරාල් කාර්යාලයේ අදාල ශාඛා මඟින් ලබා දී ඇති යෝජනා මත පදනම්ව දෙපාර්තමේන්තු වෙබ් අඩවි වල අන්තර්ගතයන් සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම.
- දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හි නව සංශෝධන පත්‍ර තුනක් (03) නිකුත් කිරීම.
- සර්වේයර් ජනරාල් කාර්යාලය, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය (ISM), අනෙකුත් සියලුම පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා නව ලිපි ශීර්ෂ නිර්මාණය කිරීම සහ සකස් කිරීම.

16. හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් අංශය

කාර්යභාරය

1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් කාර්යාලය,ඉඩම් හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය සමඟ සම්බන්ධවී "බිම්සවිය" ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු වැසියන්ගේ ඉඩම් සඳහා ඉඩමේ සාපේක්ෂ පිහිටීම, ප්‍රමාණය, සම්මත කැබලි අංකයක් හා අයිතිය පිළිබඳව රජයේ වගකීමක් සහිත හිමිකම් සහතික පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය කඩඉම් සිතියම් සකස් කිරීම සඳහා මැනුම් කටයුතු සංවිධානය.

ඒ යටතේ වාර්ෂික වැඩසටහන සකස් කිරීම, ප්‍රතිපාදන ඇස්තමේන්තු සකස් කිරීම, අමාත්‍යාංශය වෙතින් ලබා ගන්නා ප්‍රතිපාදන පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 9 මගින් බිම්සවිය මැනුම් ක්‍රියාත්මක සියළු දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල ආවරණය වන පරිදි කළමනාකරණය කිරීම, ප්‍රමාණවත් රජයේ මිනින්දෝරුවරුන් නොමැති අවස්ථාවල ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ සේවය ලබා ගැනීමට ලංසු කැඳවා තෝරා ගැනීම.

හිමිකම් සහතික නිකුත් කරන ලද ඉඩම්වල සිදුකරන පසුකාලීන මැනුම් අධීක්ෂණය කිරීම හා එම දත්ත භාවිතයෙන් පවතින දත්ත පද්ධති යාවත්කාලීන කිරීම.

මහජන හා විවිධ පළාත් පාලන ආයතන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා, මුහුණ දෙනු ලබන අත්දැකීම් හා ගැටළු අනුව, අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් යුතුව උක්ත පනතේ සංශෝධන කිරීමේ කටයුතු සඳහා සහභාගිත්වය, ඉඩම් අමාත්‍යාංශය සම්බන්ධ ප්‍රගති සමාලෝචන කටයුතු, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ, හිමිකම් රෙජිස්ට්‍රාර්, විගණන යන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන වල විමසීම් සම්බන්ධයෙන් ද කටයුතු කිරීම.

හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් සිදුකිරීම සඳහා රජයේ හෝ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් ලබාගත යුතු ප්‍රතිතන සහතික නිකුත් කිරීම.

2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ඉලක්ක

මානව සම්පත් විස්තර	අනුයුක්ත කිරීම්	ඉලක්ක - ඉඩම් කැබලි	මූල්‍ය
රජයේ මිනින්දෝරු වරුන්	165	52,830	රු.මිලියන 198.8
ප්‍රසම්පාදනය මගින් තෝරාගන්නා ලද ලියාපදිංචි බලයලත් මිනින්දෝරු වරුන්	108	16,200	
එකතුව	**273**	**69,030**	**රු.මිලියන 198.8**

කාර්යසාධනය

මානව සම්පත් විස්තර	හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ප්‍රකාශයට පත්කළ ප්‍රදේශ තුළ නිමකළ කැබලි ගණන	බිම්සවිය මැනුම් සිදුකළ ප්‍රදේශ තුළ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් මගින් ඉල්ලීම් කළ පසු කාලීන මැනුම් කැබලි ගණන	උප එකතුව	බිම්සවිය මැනුම් සිදුකළ ප්‍රදේශ තුළ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සිදුකරනු ලබන පසුකාලීන මැනුම් කැබලි ගණන	ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ මැනුම් ඉල්ලීම් මත කඩඉම් සිතියම් ලෙස සකස් කර ඇති කැබලි ගණන	මුළු එකතුව ඉඩම් කැබලි	මූල්‍ය රු. මිලියන
රජයේ මිනින්දෝරු වරුන්	44,783	784	45,567		22,478	68,045	182.1
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු මහතුන්	32,082	16	32,098	12,923	4,255	49,276	
එකතුව	**76,865**	**800**	**77,665**	**12,923**	**26,733**	**117,321**	**182.1**

ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස

	ඇස්තමේන්තුව	ප්‍රගතිය	ප්‍රතිශතය
භෞතික - ඉඩම් කැබලි		117,321	170.0%
මූල්‍ය - රු.මිලියන	198.8	182.1	91.6%

හිමිකම් ලියාපදිංචි මැනුම් හේතුවෙන් ඇති වූ ගැටළු සම්බන්ධයෙන් මහජනයා ඉදිරිපත් කර ඇති පැමිණිලි පිළිබඳව ක්‍රියා කිරීම - (දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් හා පළාත් කාර්යාල, හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් වරුන් හා හිමිකම් ලියා පදිංචි කිරීමේ කාර්යාල සම්බන්ධීකරණයෙන්)

පෙර වර්ෂයෙන් ඉතිරිය	වර්ෂය තුළ ලද	වර්ෂය තුළ නිම කළ	ඉතිරිය
130	26	98	58


බිම්සවිය වැඩසටහන 2022
(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව කැඩැස්තර මැනුම් කටයුතු)
N
යොමුව
පළාත් මායිම
දිස්ත්‍රික් මායිම
මැනුම් වැඩ ආරම්භ කිරීමට ඇති ප්‍රදේශ
මැනුම් වැඩ සිදු කරමින් පවතින ප්‍රදේශ
මැනුම් වැඩ සම්පූර්ණ කරන ලද ප්‍රදේශ
රජයේ ඉඩම් මැනුම් සිදුකරන ප්‍රදේශ
1 නල්ලූර්
2 යාපනය
3 කන්දවලාය
4 කරවේ
5 මුහුදුබඩ පත්තුව
6 කුඳාක්කායි
7 මූසලි
8 වඩුනියාව උතුර
9 වඩුනියාව දකුණ
10 නුවරගම් පළාත මධ්‍යම
11 රජාංගණය
12 තලාව
13 තඹුත්තේගම
14 නුවරගම්පලාත නැගෙනහිර
15 මැදිරිගිරිය
16 හිඟුරක්ගොඩ
17 වැලිකන්ද
18 ත්‍රිකුණාමලය නගරය හා කඩවත්
19 කින්නියා
20 කන්තලේ
21 වෙරුගල්/ඉව්වලම්පත්තු
22 එරාවුර්පත්තු
23 මෝමූනායි උතුර
24 කෝරලේ පත්තු දකුණ
25 සමන්තුරෙයි
26 අම්පාර
27 ගලේවල
28 දඹුල්ල
29 හාඩිස්පත්තුව
30 ගඟ එව කෝරළේ
31 උඩුනුවර
32 යටිනුවර
33 උඩපලාත
34 දොළුව
35 කොත්මලේ
36 වෙන්නප්පුව
37 කුරුණෑගල
38 පීදිගම
39 පත්තල
40 මල්ලවපිටිය
41 කටාන
42 දිවුලපිටිය
43 මීරිගම
44 අත්තනගල්ල
45 මීනුවන්ගොඩ
46 වත්තල
47 ජා ඇල
48 ගම්පහ
49 මහර
50 දොම්පේ
51 කැළණිය
52 හෝමාගම
53 මොරටුව
54 කැස්බාව
55 රත්මලාන
56 දෙහිවල
57 පානදුර
58 හොරණ
59 කළුතර
60 ගලිගමුව
61 කුරුවිට
62 රත්නාපුර
63 බලංගොඩ
64 වැලිගෙපොළ
65 මහියංගනය
66 පිදිමාලියද්ද
67 සියඹලඬුව
68 හික්කඩුව
69 ගාල්ල කඩවත් සහර
70 වැලිගම
71 මාතර කඩවත් සහර
72 හම්බන්තොට
73 ලුණුගම්වෙහෙර
74 තිස්සමහාරාම
75 කෙලිඅත්ත
76 අඩ්ඩාලච්චිය
77 අක්කරෙයිපත්තු
78 දමන
79 ලංකාපුර
80 මඟඔය
81 තිරුක්කෝවිල්
82 උහන
83 කෝරලේපත්තු උතුර
84 කෝරලේපත්තු බටහිර (ඔදමාවදි)
85 මෝමූනායි නිරිත
86 මෝමූනායි බටහිර
87 පෝරතිවිපත්තු
88 කුවිවවෙලි
89 මොරවැව
90 මුත්තූර්
91 ඡේරුවිල
92 ඉපලෝගම
93 පච්චිලෙයිපල්ලෙයි
94 නාහාඩාන්
95 මාත්තලෙ නැගෙනහිර
96 පුදුකුඩියිරිප්පු
97 වඩුනියා
98 වෙන්ගලවෙඩිකුලම්
99 අඹන්පොළ
100 ගල්ගමුව
101 ගනේවත්ත
102 ගිරිබාව
103 කොබෙයිගනේ
104 මඟව
105 පොල්පිතිගම
106 රාස්නායකපුර
107 වාරියපොළ
108 සුන්තලම
109 අයගම
110 නිවිතිගල
111 අගලවත්ත
112 බුලත්සිංහල
113 ඉංගිරිය
114 පාලින්ද නුවර
115 ජුනාකවි
116 මඩු
117 මන්නාරම් නගරය
118 මන්කායි බටහිර
119 මැදවච්චිය
120 නොච්චියාගම
121 පදවිය
122 පදවි ශ්‍රී පුර
123 හිංගුරිය
124 ඇනලියගොඩ
125 වරකාපොළ
126 ගඟ ඉඟල කෝරළේ
127 ඇල්පිටිය
128 හක්මණ
129 ලංකාපුර
130 හම්බන්තුඩුව
131 ඉඹුල්ගේ
132 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ
133 උඩුදුම්බර
134 හාත්තහන්ඩිය
135 කල්පිටිය
136 හිරප්පනේ
137 ගලෙවෙල්ලුවාව
138 කඟහවණ්දිගිලිය
139 මීගමුවේ
140 වල්ලල්ලාවිටි
141 අම්බලන්ගොඩ
142 ලන්ගල
143 හාගොඩ
144 බලපිටිය
145 කංගල්ල
146 අඟුණකොළපැලැස්ස
147 වීරකැටිය
148 ඔඩිසුද්දාන්
149 වැලිඔය
150 කෝරළයි පත්තු මධ්‍යම
151 ගෝමරන්කඩවල
152 නිකවැරටිය
153 ඇලහැර
154 මීගහකිවුල
155 උවපරණගම
156 හාලි-ඇල
157 වැලිමඩ
158 මොහාරාගල
159 කැකිරාව
160 කැබිතිගොල්ලෑව
161 දිඹුලාගල
162 බණ්ඩාරවෙල
163 හපුතලේ
164 බැදුල්ල
165 සොරණතොට
166 ලුණුගල
167 බිබිත්තල
168 වැල්ලවාය
169 තණමල්විල
170 සෙවණගල
171 කලවාන
172 ඇඹිලිපිටිය
පරිමාණය - 1:2,000,000
ජාතික ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන
ඉඩම් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ප්‍රතීතන සහතික නිකුත් කිරීම

2021.12.31 දිනට ප්‍රතීතන සහතික ලබාගෙන ඇති ප්‍රමාණය	1,822
2022 වසරේදී ලබාගෙන ඇති ප්‍රතීතන සහතික ප්‍රමාණ	38
2022.12.31 දිනට ප්‍රතීතන සහතික ලබාගෙන ඇති මුළු ප්‍රමාණය	1,860

17. අභ්‍යන්තර විගණන අංශය

සර්වේයර් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ පාලනය යටතේ ක්‍රියාත්මක වන අභ්‍යන්තර විගණන අංශයේ ස්වාධීනත්වය ජාතික විගණන පනතේ අංක 40 (3) වගන්තියෙන් හා මුදල් රෙගුලාසි 134(1) මගින් නිශ්චය කර ඇත.

කාර්යභාරය

මූල්‍ය සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, පොත්පත් හා ගිණුම් නිසි ලෙස පවත්වාගෙන යාම හා එය නිසිපරිදි සිදුවන බවට සහතික වීම, එම කටයුතු වල වැරදි සහ වංචා අනාවරණය කර ගැනීමට හා වැලැක්වීම සඳහා යොදාගනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව සහ ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තු කාර්යසාධනය සහ ඵලදායීතාව පිලිබඳ සමාලෝචනයන් සිදුකිරීම.

කාර්යසාධනය

සර්වේයර් ජනරාල්ගේ අනුමැතිය හා විගණකාධිපතිගේ එකඟතාවය මත හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ මග පෙන්වීම අනුව 2022 වසර සඳහා විගණන වැඩසටහන සැලසුම් කළද රට තුල පැවති වාතාවරණය යටතේ විගණන කටයුතු සීමා කිරීමට සිදුවිය.එසේ වුවද පළාත් කාර්යාල 01 ක්ද, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 03 ක්ද සහ විශේෂ පරීක්ෂණ 02 ක්ද අතුරු වාර්තාවක්ද බැංකු සැසඳුම් පරීක්ෂාව සහ වත්කම් පරීක්ෂාවද සිදුකරන ලදී. තවද, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් නිසි පරිදි පවත්වාගෙන යන ලදී.

18. විභාග අංශය

කාර්යභාරය

සියලුම දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාග, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අදාල කාර්යක්ෂමතා විභාග පැවැත්වීම.

කාර්යසාධනය

අනු අංකය	විභාගයේ නම	ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව	සුසුදුකම් ලත් අයදුම්පත් සංඛ්‍යාව	විභාගය පැවැත්වූ / නියමිත වූ දිනයන්	පැමිණ සිටි සංඛ්‍යාව	අයදුම්පත් භාරගන්නා අවසන් දිනය	ප්‍රතිඵල නිකුත් කළ දිනය	සමත් වූ සංඛ්‍යාව	ඌණ සාමර්ථ ලැබූ සංඛ්‍යාව	වියදම් වූ සම්පූර්ණ මුදල (රුපියල්)	අපේක්ෂකයෙක් සඳහා වැය වූ මුදල (රුපියල්)
1	ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2020(2022)	214	209	2022. 02.27	167	2020. 11.12	2020. 11.16	45	110	506,636.50	2,435.75
2	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021(2022) *(දිස්ත්‍රික් මට්ටමින්)*	05	05	2022. 02.14-18	05	2022. 01.21	2022. 03.09	05	-	-	-
3	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021(2022)	37	37	2022. 02.19	31	2022. 01.21	2022. 03.09	30	-	6,810.00	184.00

4	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021(2022) *(දිස්ත්‍රික් මට්ටමින්)*	11	11	2022. 02.14-18	11	2022. 01.21	2022. 03.09	11	-	-	-
5	මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ (විධායක සේවා ගණය) කාර්මික හා පරිපාලන නිලධාරි තනතුර සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය විභාගය - 2022	01	01	2022. 03.30	01	2022. 02.14	2022. 05.19	01	-	5,660.00	5,660.00
6	ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් තනතුරු සඳහා පවත්වනු ලබන දෙවන වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (දෙපාර්තමේන්තු සහයක) - 2022	02	01	2022. 03.14-18	01	2022. 02.03	2022. 03.29	01	-	-	-
7	ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් තනතුරු සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (දෙපාර්තමේන්තු සහයක) - 2022	11	11	2022. 03.14-18	11	2022. 02.03	2022. 03.29	11	-	-	-
8	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 *(දිස්ත්‍රික් මට්ටමින්)*	04	04	2022. 05.09-13	04	2022. 04.22	2022. 08.01	04	-	-	-
9	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022	41	41	2022. 05.14	28	2022. 04.22	2022. 06.21	26	-	7,980.00	194.63
10	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 *(දිස්ත්‍රික් මට්ටමින්)*	17	17	2022. 05.17-20	16	2022. 04.22	2022. 08.01	16	-	-	-
11	ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් තනතුරු සඳහා පවත්වනු ලබන දෙවන වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (දෙපාර්තමේන්තු සහයක) - 2022	02	02	2022. 09.12-16	02	2022. 07.29	2022. 09.30	02	-	-	-
12	ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් තනතුරු සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (දෙපාර්තමේන්තු සහයක) - 2022	07	05	2022. 09.12-16	05	2022. 07.29	2022. 09.30	05	-	-	-
13	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 *(දිස්ත්‍රික් මට්ටමින්)*	06	06	2022. 11.08-11	06	2022. 08.31	2022. 12.13	06	-	-	-
14	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022	33	33	2022. 11.12	24	2022. 08.31	2022. 12.14	21		-	-
15	මැනුම් ක්ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022 *(දිස්ත්‍රික් මට්ටමින්)*	05	05	2022. 11.14-18	05	2022. 08.31	2022. 12.13	05	-	-	-
16	ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ කාර්මික හා පරිපාලන නිලධාරී තනතුරු සඳහා වන සීමිත තරග විභාගය - 2020 (2022)	34	34	2022. 01.23	-	2021. 03.18	2022. 03.28	04	-	221,459.60	6,513.52

19. කළමනාකරණ සංවර්ධන හා පුහුණු අංශය

කාර්යභාරය

- නිලධාරීන්ගේ කාර්යසාධනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය සංවිධානය කිරීම
- දේශීය සහ විදේශීය ආයතන මගින් පවත්වනු ලබන පාඨමාලා සඳහා අදාල සුදුසුකම් සහිත නිලධාරීන් සහභාගී කරවීම

කාර්යසාධනය

ප්‍රධාන වාර්තාවේ පිටු අංක 20-24 (මානව සම්පත් සංවර්ධනය) බලන්න.

20. ප්‍රගති අංශය

කාර්යභාරය

සර්වේයර් ජනරාල් කාර්යාලයේ ශාඛාවන් මගින් යැවෙන ලිපි තැපැල් දෙපාර්තමේන්තුවට භාරදීම

සර්වේයර් ජනරාල් කාර්යාලයේ ශාඛාවන් වෙත ලැබෙන ලිපි පසුවිපරම් කිරීමේ දත්ත පද්ධතියට (Mail Tracking System) ඇතුළත්කර අදාල ශාඛාවන් වෙත බෙදා හැරීම

දෙපාර්තමේන්තුවේ සියලුම චක්‍රලේඛ දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කිරීම

දෙපාර්තමේන්තුවේ ලිපි භාෂා පරිවර්තන කටයුතු සිදුකිරීම

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතිකාල සහ නිවාඩු දින වැටුප් ගෙවීමේ පදනම මත රාජකාරිවල යෙදවීමට අවශ්‍ය අනුමැතියන් ලබාදීම

දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සහ විවිධ අංශ අධ්‍යයනය කිරීම සඳහා පැමිණෙන විශ්ව විද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරීන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

අය වැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව සහ පෙර වර්ෂය සඳහා සර්වේයර් ජනරාල්ගේ කාර්යසාධන වාර්තාව සැකසීම

සර්වේයර් ජනරාල් කාර්යාලයේ ශාඛාවල රෝනියෝ මුද්‍රණ අවශ්‍යතාවයන් ඉටුකර දීම

කාර්යසාධනය

- තැපැල් දෙපාර්තමේන්තුවට ලිපි 20,948 ක් භාරදී ඇත.
- දෙපාර්තමේන්තුවට ලැබුණු ලිපි 32,212 ක් පසුවිපරම් කිරීමේ දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත.
- චක්‍රලේඛ 92 ක් වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.
- සිංහල - ඉංග්‍රීසි පරිවර්තන කටයුතු යටතේ ලිපි 46 ක් (පිටු 188 ක්) පරිවර්තනය කර ඇති අතර දමිළ භාෂා පරිවර්තක නිලධාරියෙකු දෙපාර්තමේන්තුවෙහි නොවීම හේතුවෙන් එම කටයුතු වලට අදාලව ලිපි 83 ක් (පිටු 283 ක්) බාහිර පරිවර්තකයින් මගින් ඉටු කරවා ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කර ඇත. බාහිර පරිවර්තකයන් මගින් ඉටුකරවා ගන්නා ලද, චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපි වලට අදාල දමිළ පරිවර්තන පරීක්ෂා කිරීමේ කමිටුවක්ද මෙම වසරේදී පත්කර ගන්නා ලද අතර එමගින් දෙපාර්තමේන්තුවට විශේෂිත වූ තාක්ෂණික යෙදුම් වඩාත් නිරවද්‍ය ලෙස පරිවර්තනය කරගැනීමට හැකිවිය.
- අතිකාල සහ නිවාඩු දින වැටුප් ගෙවීමේ පදනම මත රාජකාරිවල යෙදවීමට අවශ්‍ය අනුමැතියන් 1168 ක් ලබාදී ඇත.
- 2023 අය වැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව සහ 2022 වර්ෂය සඳහා සර්වේයර් ජනරාල්ගේ කාර්යසාධන වාර්තාව සැකසීම සිදු කර ඇත.
- ලිපි සහ ආකෘති පත්‍ර 35ක් (පිටපත් 72,600ක්) රෝනියෝ මුද්‍රණය සිදු කර ඇත

ක්ෂේත්‍ර කාර්යාල මගින් සිදුකළ කාර්යයන්

1. ඉඩම් මැනුම්

2022 වර්ෂය තුළ සැලසුම් කළ ඉලක්කයන් සඳහා 138% ක ප්‍රගතියක් ලබා ගන්නා ලදී.

මැනුම් වර්ගය	භෞතික ප්‍රගතිය					
	වාර්ෂික ඉලක්කය		සමුච්චිත ප්‍රගතිය		ලබාගත් ප්‍රගතිය (%)	
	මිනින්දෝරු මාස	කැබලි	මිනින්දෝරු මාස	කැබලි	මිනින්දෝරු මාස	කැබලි
මායිම් ගල් දැමීමේ මැනුම්	2,247	44,930	1,753	35,066	78	78
විවිධ මැනුම්	1,118	33,540	1,217	36,515	109	109
ඉඩම් අත්කර ගැනීමේ මැනුම්	504	10,080	460	9,194	91	91
ඉංජිනේරු මැනුම්	141	2,820හෙක්.	412	8,247 හෙක්.	292	292
උසාවි කොමිෂන් මැනුම්	267	7,999	289	8,655	108	108
කැඩැස්තර මැනුම් (බිම්සවිය)	2,651	79,530	3,911	117,321	148	148
එකතුව	**6,010**		**7,304**		**138**	

2022 වසර තුළ සිදු කරන ලද මැනුම් සම්බන්ධ විස්තර

අත් කර ගැනීම සඳහා වූ මැනුම්

- මොරගහකන්ද - කළුගඟ ව්‍යාපෘතිය සඳහා වූ මැනුම්
- කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ග මැනුම්
- වයඹ ඇල ව්‍යාපෘතියේ මැනුම්
- ගැටඹේ ගුවන් පාලම සඳහා වූ මැනුම්
- ගාල්ල - දෙනියාය - මාදම්පේ (A017) මාර්ග මැනුම්
- රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 2 යටතේ මැනුම්
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 3 යටතේ මැනුම්
- ඉහළ ඇලහැර ව්‍යාපෘතිය යටතේ මැනුම්
- දක්ෂිණ අධිවේගී මාර්ගයේ මැනුම්
- නිට්ටඹුව - පස්යාල මාර්ගයේ මැනුම්

සංවර්ධන කටයුතු සඳහා ඉංජිනේරු මැනුම්

- දඹුවන්කන්ද රජයේ කළුගල ඉංජිනේරු මැනුම්

කාලීන අවශ්‍යතා අනුව ඉටුකරන ලද විවිධ මැනුම්

- මහවැලි වෙහෙරතැන්න තෘණභූමි මැනුම්
- යෝජිත කලාවැව ජාතික උද්‍යාන මැනුම්
- මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය - කන්තලේ 85 හන්දිය දක්වා මැනුම්
- දිඹුලාගල කර්මාන්තපුරය යටතේ මැනුම්
- වයඹ ඇළ ව්‍යාපෘතිය සඳහා මැනුම් (කොටස 6)
- සුළං බල මධ්‍යස්ථාන මැනුම්

- මාදැල් වරාය මැනුම්
- මුතුරාජවෙල අභය භූමියට අදාල මැනුම්
- යෝජිත දනවිකන්ද රක්ෂිතයේ මායිම් සලකුණු කිරීමේ මැනුම්
- මීගමුව අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මැනුම්
- වත්තල ගොල්ෆ් ක්‍රීඩාංගනය සඳහා ඉඩම් හඳුනාගැනීමේ මැනුම්
- ජා ඇල ඒකල මලනල පද්ධතිය (පොම්පාගාරය) සඳහා ඉඩම් අත්කර ගැනීමේ මැනුම්
- නාගරික සංවර්ධන අධිකාරියට සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවට ඉඩම් පවරා දීම සඳහා මැනුම්
- කෙරවලපිටිය වායු බලාගාරයේ පොම්පාගාරයට ඉඩම් අත්කර ගැනීමේ මැනුම්
- බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්කර ගැනීමේ මැනුම්
- සේවා පියස මැනුම්
- අළුතැපොල කර්මාන්තපුරයට අත්කර ගැනීමේ මැනුම්
- කටාන නගර සංවර්ධන ව්‍යාපෘතිය කළුදියවලවත්ත ඉඩම මැනුම්
- රාගම පුනරුත්ථාපන රෝහලේ ස්ථානීය උස පෙන්වීම සඳහා වූ මැනුම්
- ඒකල කුරුඳුවත්ත ග්‍රාමයෙහි ඉඩම් කොටස් රාජ්‍ය ආයතන වෙත ලබා දීමේ මැනුම්
- මීගමුව ‘‘වෝටර් වර්ල්ඩ්’’ පිහිටි භූමිය සංචාරක මණ්ඩලය වෙත බදු දීම සඳහා වූ මැනුම්
- අකුරල ගල්දුව වගවල යාය මැනුම්
- මුහුදු මහා විහාරය පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා වූ මැනුම්
- ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මැනුම් හා ඉංජිනේරු මැනුම්

වනාන්තර ආශ්‍රිත රක්ෂිත සඳහා ඉටුකරනලද මැනුම්

- සිංහරාජ වනාන්තර මැනුම්
- සෝමාවතිය වන උද්‍යානයේ මැනුම්
- දන්දෙණිය රක්ෂිතය

වෙනත් ආයතන සඳහා ඉටුකරන ලද මැනුම්

- උසාවි මැනුම්
- දඹුල්ල කර්මාන්තපුරයට අදාල නැවත මායිම් පෙන්වාදීමේ මැනුම්
- මාර්ග සංවර්ධන අධිකාරියේ මැනුම්
- කොටියාගල මැනුම්
- ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා වූ මැනුම්
- නාගරික සංවර්ධන අධිකාරිය සඳහා වූ මැනුම්
- නිවාස සංවර්ධන අධිකාරිය සඳහා වූ මැනුම්
- සීමා නීර්ණය කිරීමේ කටයුතු සඳහා වූ මැනුම්

භූමිතික මැනුම්

- මාරිවුකඩ්ඩි සිට කරුවැලිකුඩා දක්වා පිල් ලකුණු පිහිටුවීම සඳහා මැනුම්

වැව් මැනුම්

- කුඹුක්කන් ඔය මැනුම් (බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉංජිනේරු මැනුම, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විස්තර මැනුම, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉජිනේරු මැනුම් අයත් වේ.)
- මැණික් ගඟ මැනුම්
- උමා ඔය මැනුම්
- තල්පිටිගල ජලාශයේ මැනුම්
- වාරි සෞභාග්‍ය මැනුම්
- වීගොඩ හල්වත්තේ වැව සීමා ලකුණු කිරීමේ මැනුම්
- මාබෝදල වැව සීමා ලකුණු කිරීමේ මැනුම්
- පහළ මල්වතු ඔය මැනුම්
- මුන්දෙනි ආරු ගංඟා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහඔය ජලාශ පතුලේ සමෝච්ච රේඛා මැනුම්
- දන්දෙණිය වැව රක්ෂිතය සඳහා සිදු කරන ලද මැනුම්

වතු මැනුම්

- රිල්හේන වත්ත
- වැල්ලඳුර වත්ත
- මහවෙල වත්ත
- වෙනිවැල්ල වත්ත
- පඹේගම වත්ත
- මාලිබොඩ වත්ත
- දෙනියාය වත්ත
- හෝම දොල වතුයාය
- වලහන්දුව වත්ත

2. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මැනුම් කර දීමනා පත්‍ර ලබාදීම සඳහා රේඛා චිත්‍ර නිකුත් කිරීම්

දිස්ත්‍රික්කය	නිකුත් කරන ලද රේඛා චිත්‍ර ගණන
කොළඹ	0
ගම්පහ	17
කළුතර	0
මහනුවර	0
මාතලේ	295
නුවරඑළිය	0
ගාල්ල	29
මාතර	0
හම්බන්තොට	0
යාපනය	49
මන්නාරම	0
වවුනියාව	1
මුලතිව්	0
කිලිනොච්චිය	823
මඩකලපුව	0
අම්පාර	0
ත්‍රිකුණාමලය	0
කුරුණෑගල	4
පුත්තලම	0
අනුරාධපුරය	0
පොලොන්නරුව	150
බදුල්ල	0
මොනරාගල	1
රත්නපුර	413
කෑගල්ල	0
එකතුව	**1782**

3. නිශ්චල සහ චංචල සම්පත් සංවර්ධනය

3.1 රු. 50,000.00 ට වැඩි තැනීම් හා අලුත්වැඩියාවන්

	පළාත	විස්තරය	වියදම (රු.)
01	බස්නාහිර පළාත	ගම්පහ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ගරාජය අළුත්වැඩියා කිරීම	57,550.00
02		ගම්පහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ඉහළ මහලේ වැසිකිලිය අළුත්වැඩියා කිරීම	340,000.00
03	මධ්‍යම පළාත	පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ වහලය අළුත්වැඩියාව	300,686.20
04		පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ වේයන් මර්ධනය කිරීම	166,500.00
05		මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලීය අපජල පද්ධතිය අළුත්වැඩියාව	693,475.00
06		මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි නිල නිවාසයේ අළුත්වැඩියාව	90,000.00
07		මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ වැසිකිළි අළුත්වැඩියාව	283,248.00
08		මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගේට්ටු අළුත්වැඩියාව	120,000.00
09		මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ තීන්ත ආලේප කිරීම	103,212.00
10		මාතලේ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ විදුලි පද්ධතියේ අළුත්වැඩියාව	249,800.00
11		ලග්ගල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වටා වැටක් ඉදි කිරීම	157,780.00
12		නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලයේ විදුලි පද්ධතියේ අළුත්වැඩියාව	742,800.00
13		කටුමාන රියදුරු වැසිකිළිය අළුත්වැඩියාව හා අලුතින් වැසිකිළි වලක් සැකසීම	120,000.00
14		කටුමාන සංචාරක බංගලාවේ තාප්පය ඉදිකිරීම	864,977.96
15		කටුමාන සංචාරක බංගලාවේ ගරාජයේ අළුත්වැඩියාව	114,913.68
16	දකුණු පළාත	පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී කාමරය හා පරිගණක කාමරය බෙදා වෙන් කර සෑදීම (Soft front Partition)	97,020.00
17		මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ විදුලි පද්ධතියේ දෝෂ පරීක්ෂාව හා අළුත්වැඩියාව	98,000.00
18		මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නිල නිවසේ සිවිලිම අළුත්වැඩියාව	207,839.50
19		මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නිල නිවසේ ඉදිරිපස ආලින්දයේ වහලය අළුත්වැඩියාව	141,487.20
20		කතරගම සංචාරක බංගලාවේ අබලන් වී ඇති වැහිපීලි ඉවත් කර අමානෝ වැහිපීලි යොදා අළුත්වැඩියා කිරීම	56,800.00
21	උතුරු පළාත	යාපනය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ විදුලි පද්ධතියේ අළුත්වැඩියාවන්	70,795.00
22		කිලිනොච්චි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලේඛනාගාරයෙහි අල්මාරි සවි කිරීම	149,500.00
23		කිලිනොච්චි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ පෙරසවි කඳවුරේ සිවිලිමේ අළුත්වැඩියාවන්	168,400.00
24		කිලිනොච්චි 11 ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ තීන්ත ආලේප කිරීම	154,800.00
25		කිලිනොච්චි 1 ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ කොටස් වෙන් කිරීම	60,800.00
26		කිලිනොච්චි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ටයිල් ඇතිරීම	397,687.60
27		කිලිනොච්චි 11 ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ විදුලි පද්ධතියේ සහ පයිප්ප බට අළුත්වැඩියාවන්	199,300.00
28		කිලිනොච්චි 11 ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ වෙන් කිරීමේ කටයුතු	391,250.00
29		කිලිනොච්චි 11 ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ යතුරුපැදි සහ පාපැදි නැවතුම්පල සැකසීම	242,320.00
30		වව්නියාව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ වහලයේ සහ සිවිලිමේ අළුත්වැඩියාවන්	135,266.00

31	නැගෙනහිර පළාත	පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ පිටිසුමේ වහලය හා සිවිලිම අළුත්වැඩියාව	293,502.20
32		ප.ස.ජ.නිලනිවසේ සිවිලිම අළුත්වැඩියාව	76,850.00
33		මඩකලපුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ සිවිලිම් විදුලි පංකා	99,600.00
34		මඩකලපුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ මැනුම් ඒකකයේ අළුත්වැඩියාව	152,850.00
35		පාසිකුඩා සංචාරක බංගලාවේ සිවිලිම සවි කිරීම	1,470,000.00
36		ත්‍රිකුණාමලය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන්	226,451.87
37		ත්‍රිකුණාමලය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ තීන්ත ආලේප කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම	102,125.00
38		කුච්චවේලි සංචාරක බංගලාවේ අළුතින් ප්‍රධාන ලී ගේට්ටුවක් සවි කිරීම	68,325.00
39	වයඹ පළාත	පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ නව ලේඛනාගාරය සඳහා නව ස්ටීල් රාක්කයක් සෑදීම	330,000.00
40		මහව ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයේ වහලය අළුත්වැඩියාව	62,700.00
41		කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ සිවිලිම අළුත්වැඩියාව	81,374.00
42		මහව ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයේ මායිම් තාප්පය ඉදිකිරීම	585,751.25
43		මහව ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයේ ගොඩනැගිල්ල කොටස් කිරීම (Partition)	122,544.00
44		වාරියපොල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ගරාජයේ බිම කොන්ක්‍රීට් කිරීම	108,108.00
45		කුලියාපිටිය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ පෙරසවි කඳවුරු අළුත්වැඩියාව	107,250.00
46		පුත්තලම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ කාර්යාල කොටස සඳහා ජනෙල් රෙදි සපයා සවි කිරීම	334,150.00
47	උතුරු මැද පළාත	අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ගබඩා කාමරය අලුත්වැඩියාව	185,564.82
48		අනුරාධපුර - 1 ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ගබඩා රාක්ක සවි කිරීම	129,250.00
49		අනුරාධපුර - 1 ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ මුරකුටිය අළුත්වැඩියා කිරීම	64,500.00
50		අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ සිතියම් තාක්ෂණ නිලධාරී නිල නිවාසයේ තීන්ත ආලේප කිරීම	9,985.00
51		අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලේඛනාගාරයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව	385,840.00
52		පදවිය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ කැබිතිගොල්ලෑව පෙරසවි කඳවුර වටා වැට සකස් කිරීම	598,433.00
53		පොළොන්නරුව අංක 55 පෙරසවි කඳවුර අළුත්වැඩියාව	327,493.95
54		අනුරාධපුර සංචාරක බංගලාව සඳහා තෙකලා විදුලි සැපයුම ලබා ගැනීම	62,930.00
55		අනුරාධපුර සංචාරක බංගලාව අළුත්වැඩියාව	74,700.00
56		උතුරු මැද පළාත් සර්වේයර් ජනරාල් නිල නිවසේ නාන කාමරය අළුත්වැඩියාව	197,682.50
57	ඌව පළාත	බිබිල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ අබලන් වී ඇති දොරවල් 6ක් අළුත්වැඩියා කිරීම	75,000.00
58		මොණරාගල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ දොරවල් 6ක් අළුත්වැඩියා කිරීම	150,000.00
59		මොණරාගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ලේඛනාගාරය සඳහා සිතියම් රාක්ක 4ක් සකස් කිරීම	890,216.00
60		බදුල්ල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ජල අපවහන පද්ධතිය අළුත්වැඩියා කිරීම	179,542.28
61		බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ වැසිකිලිය අළුත්වැඩියා කිරීම	339,500.00
62		පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ වහලයේ කොටසක් අළුත්වැඩියා කිරීම	173,500.00
63		පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට අයත් අංක 41/1 දරණ නිල නිවසේ වහලයේ කොටසක් අළුත්වැඩියා කිරීම	447,750.00

64	සබරගමුව පළාත	රත්නපුර II ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ සිවිලිම අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම	225,475.00
65		රත්නපුර II ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ තිර රෙදි සවි කිරීම	118,182.50
66		රත්නපුර II ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ බිත්ති අළුත්වැඩියාව හා තීන්ත ආලේප කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම	85,025.00
67		රත්නපුර II ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ සිවිලිම සවි කිරීමට හා තීන්ත ආලේප කිරීම සඳහා වැඩ කුලිය	95,000.00

3.2 රු. 50,000.00 ඉක්මවූ වාහන අලුත්වැඩියාවන්

පළාත	නඩත්තු කටයුතු කළ වාහන ගණන	වැය වූ මුළු මුදල රු.
බස්නාහිර පළාත	06	947,226.26
මධ්‍යම පළාත	12	1,566,340.50
දකුණු පළාත	10	1,897,886.00
උතුරු පළාත	11	2,334,611.14
නැගෙනහිර	14	2,682,664.66
වයඹ පළාත	23	2,975,748.00
උතුරු මැද පළාත	15	1,413,698.41
ඌව පළාත	10	1,772,306.87
සබරගමුව පළාත	05	614,240.00
එකතුව	**106**	**16,204,721.84**

4. සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන්

පළාත	පුහුණු වැඩසටහන	සහභාගීවූ නිලධාරී කාණ්ඩය	සංඛ්‍යාව
බස්නාහිර පළාත	ප්‍රසම්පාදන හා කාර්යාල කටයුතු සම්බන්ධයෙන් පවත්වනු ලැබූ වැඩසටහන	පළාතට අනුයුක්ත කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්	50
	රාජකාරී කුසලතා වර්ධනය කිරීම සම්බන්ධයෙන් පවත්වනු ලැබූ වැඩසටහන	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්	35
	ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පවත්වනු ලැබූ වැඩසටහන	පළාතට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකරීවරුන්, මිනින්දෝරු අධිකාරීවරුන්, කාර්මික හා පරිපාලන නිලධාරීන්,	40
	නවීන මැනුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව	කළුතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ඕවර්සියර්වරුන්, මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	59
	ආයතනික හා ගිණුම් කටයුතු සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන	කළුතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත හා ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්	12
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන	ගම්පහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්, රජයේ මිනින්දෝරුවරුන්, මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	79

මධ්‍යම පළාත	විනය කටයුතු හා මූලික විමර්ශන පැවැත්වීම පිළිබඳ වැඩමුළුව	පළාතට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන්, මිනින්දෝරු අධිකාරීවරුන්, කාර්මික හා පරිපාලන නිලධාරීවරුන්	45
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්	22
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්	
	පුහුණු වැඩමුළුව	රීපළාතට අනුයුක්ත සිතියම් තාක්ෂණ නිලධාන්	
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන්	72
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත රියැදුරුවරුන්	39
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	
දකුණු පළාත	ප්‍රසම්පාදන විෂය හා සම්බන්ධ සියලු ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව සිදු කිරීමට අදාළ වැඩමුළුව	මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත නිලධාරීන්	21
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව	මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	65
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව	හම්බන්තොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	40
	ඵලදායිතා ප්‍රවර්ධන වැඩමුළුව	හම්බන්තොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත නිලධාරීන්	35
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩමුළුව	ගාල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	54
උතුරු පළාත	පුහුණු වැඩමුළුව	යාපනය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	70
	අංකිත දත්ත පිළිබඳ වැඩමුළුව	කිලිනොච්චි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්	18
	ප්‍රසම්පාදන කමිටු පිළිබඳ පුහුණු වැඩසටහන	පළාතට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන්, මිනින්දෝරු අධිකාරීවරුන්, කාර්මික හා පරිපාලන නිලධාරීවරුන්, විෂය භාර නිලධාරීන්	27
	පුහුණු වැඩමුළුව	කිලිනොච්චි දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	56
	පුහුණු වැඩමුළුව	වව්නියාව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්	25
	පුහුණු වැඩමුළුව	වව්නියාව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	47
	පුහුණු වැඩමුළුව	මුලතිව් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකයින්	48

වයඹ පළාත	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්	32
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්	88
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත සිතියම් තාක්ෂණ නිලධාරීන්	32
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්	30
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්	56
	ප්‍රසම්පාදන වැඩමුළුව	පළාතට අනුයුක්ත කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්	35
	පුහුණු වැඩමුළුව	මහව සහ ගල්ගමුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	47
	පුහුණු වැඩමුළුව	කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත සහ භූමිතික මැනුම්	59
	පුහුණු වැඩමුළුව	නිකවැරටිය සහ වාරියපොල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	54
	පුහුණු වැඩමුළුව	ආණමඩුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	27
	පුහුණු වැඩමුළුව	මාදම්පේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	32
	පුහුණු වැඩමුළුව	පුත්තලම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	31
උතුරු මැද පළාත	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්	29
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත රියැදුරන්	50
	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුව	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්, මිනින්දෝරු අධිකාරී කාර්ය මණ්ඩලය	41
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳව වූ වැඩමුළුව	පළාතට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	
ඌව පළාත	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුව	පළාතට අනුයුක්ත සහ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්(පුහුණු), නියෝජ්‍ය සර්වේයර් ජනරාල්(අධ්‍යයන), පළාත් සර්වේයර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන්, මිනින්දෝරු අධිකාරීවරුන්, සහකාර අධ්‍යක්ෂ(මුදල්), කාර්මික හා පරිපාලන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන්	37

ඌව පළාත	පිඹුරු අංකිත දත්ත සම්බන්ධ වැඩමුළුව	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරී, සිතියම් තාක්ෂණ නිලධාරීන්, බදුල්ල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මිනින්දෝරුවරුන්	11
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳ වැඩසටහන	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්, මැනුම් ඕවර්සියර් සහ මැනුම් සහායකවරුන්	120
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳ වැඩසටහන	පළාතට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්, මැනුම් ඕවර්සියර් සහ මැනුම් සහායකවරුන්	107
සබරගමුව පළාත	GNSS පුහුණු වැඩමුළුව	රත්නපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්	54
	රියැදුරන් දැනුවත් කිරීම හා වාහන පරීක්ෂාව පිළිබඳ වැඩමුළුව	රත්නපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත රියැදුරන්	15
	6/2022 චක්‍රලේඛ හා හඳුනාගත් ගැටළු සාකච්ඡා කිරීම	රත්නපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මිනින්දෝරුවරුන්, මිනින්දෝරු	46
	පුහුණු වැඩමුළුව	බලංගොඩ, රත්නපුර 1, රත්නපුර 2, පැල්මඩුල්ල, ඇඹිලිපිටිය සහ කලවාන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	238
	GNSS පුහුණු වැඩමුළුව	කෑගල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්	10
	රියැදුරන් දැනුවත් කිරීම හා වාහන පරීක්ෂාව පිළිබඳ වැඩමුළුව	කෑගල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත රියැදුරන්	13
	6/2022 චක්‍රලේඛ හා හඳුනාගත් ගැටළු සාකච්ඡා කිරීම	කෑගල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මිනින්දෝරුවරුන්, මිනින්දෝරු	37
	පුහුණු වැඩමුළුව	ගලිගමුව, කෑගල්ල සහ රුවන්වැල්ල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	93
	පුහුණු වැඩමුළුව	පළාතට අනුයුක්ත කළමනාකරණ සේවා නිලධාරීවරුන්, සංවර්ධන නිලධාරීවරුන්	60
නැගෙනහිර පළාත	GNSS නිරීක්ෂණ ගැනීමේ පුහුණු වැඩමුළුව	අම්පාර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මිනින්දෝරු අධිකාරීවරුන්, රජයේ මිනින්දෝරුවරුන්	
	මැනුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන	මහඔය, අක්කරෛපත්තුව, සමන්තුරෙයි, අම්පාර ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර	
	පුහුණු වැඩමුළුව	මඩකලපුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	
	පුහුණු වැඩමුළුව	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට අනුයුක්ත රජයේ මිනින්දෝරුවරුන්, මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්	95

මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් ඉටුකළ කාර්යයන්

කාර්යසාධනය

1. පවත්වන ලද පාඨමාලා

1.1 නිශ්චිත පාඨමාලා

අනු අංකය	පාඨමාලාවේ නම	කාලය	ආරම්භ කළ දිනය	අවසන් කළ දිනය / අවසන් කිරීමට නියමිත දිනය	සහභාගී වූ සංඛ්‍යාව
1	මැනුම් විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව (BDC-15)	වසර 4 (අධ්‍යයන)	2018.01.08	2022.01.07	13
2	මැනුම් විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව (BDC-15)	වසර4 (අධ්‍යයන)	2022.02.01	2026.01.31	23
3	දිශානුගත කිරීමේ පාඨමාලාව (OC-11)	මාස 06	2022.02.01	2022.07.29	89
4	වාරි සෞභාග්‍ය පාඨමාලාව	මාස 03	2022.02.01	2022.05.13	34

1.2 ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පැවැත් වූ කෙටි කාලීන පාඨමාලා

අනු අංකය	පාඨමාලාවේ නම	දින ගණන	පැවැත්වූ දින	සහභාගී වූ සංඛ්‍යාව
1	2023 වර්ෂයේ උසස්වීම් ලැබීමට නියමිත නව ජෝ.මි.අ. වරුන් සඳහා දිශානුගත කිරීමේ වැඩසටහන	3	2022.10.12- 2022.10.14	20
2	ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පළමු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පැවැත්වෙන අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධන පුහුණු වැඩසටහන සම්පත් දායකත්වය - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (මාර්ගගතව පවත්වන ලදී.)	5	2022.10.27 2022.11.02 2022.11.09 2022.11.22 2022.11.24	142
3	මිනින්දෝරු අධිකාරි වරුන් (ක්ෂේත්‍රයේ සිටින) සඳහා පැවැත්වෙන අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධන පුහුණු වැඩසටහන (මාර්ගගතව පවත්වන ලදී.)	3	2022.12.08 2022.12.14 2022.12.21	27

1.3 වෙනත් ආයතන සඳහා පැවැත් වූ කෙටි කාලීන පාඨමාලා

අනු අංකය	පාඨමාලාවේ නම	දින ගණන	සහභාගී වූ සංඛ්‍යාව	පැවැත්වූ දින	ආයතනය
1	මැනුම් කටයුතු පිළිබඳ මූලික පාඨමාලාව	5	28	2022.01.24 2022.01.28	බටංගල විශ්ව විද්‍යාලය
2	GNSS පිළිබඳ පුහුණු පාඨමාලා	5	17	2022.07.04 2022.07.08	නාවික හා සාගරික විද්‍යාපීඨය
3	අතෙහි ගෙන යා හැකි GPS උපකරණ දත්ත භාවිතයෙන් අනුරේඛණයක් පිළියෙළ කිරීම	2	35	2022.09.15- 2022.09.16	දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (දකුණු පළාත් සහකාර ප්‍රදේශීය ලේකම් වරුන් සඳහා)
4	GPS හා ඩ්‍රෝන තාක්ෂණය	2	39	2022.10.31- 2022.11.01	කැළණිය විශ්ව විද්‍යාලය

5	මූලික මැනුම් ක්‍රම	2	30	2022.11.17 2022.11.18	කාලතුවක්කු හමුදා පුහුණු පාසල
6	සිවිල් ඉංජිනේරු සිසුන් සඳහා මැනුම් කඳවුර	6	80	2022.11.21 - 2022.11.26	ඉංජිනේරු තාක්ෂණ ආයතනය-කටුනායක (පළමු කණ්ඩායම)
7	අතෙහි ගෙන යා හැකි GPS උපකරණ දත්ත භාවිතයෙන් අනුරේඛණයක් පිළියෙළ කිරීම	2	47	2022.12.07- 2022.12.08	දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (දකුණු පළාත් ඉඩම් නිලධාරීන් හා ජනපද නිලධාරීන් සඳහා)
8	සිවිල් ඉංජිනේරු සිසුන් සඳහා මැනුම් කඳවුර	6	79	2022.12.12 2022.12.17	ඉංජිනේරු තාක්ෂණ ආයතනය-කටුනායක (දෙවන කණ්ඩායම)

1.4 මැනුම් ක්ෂෙත්‍ර සහයක තනතුර සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් - 2 මට්ටම පාඨමාලා

අනු අංකය	පාඨමාලාවේ අංකය	දින ගණන	කැඳවූ සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	පැවැත්වූ දින
1	2022/01	10	158	97	2022.01.04 – 2022.01.13
2	2022/02	10	134	77	2022.01.19 – 2022.01.28
3	2022/03	10	105	73	2022.03.23 – 2022.04.01
4	2022/04	10	129	67	2022.04.27 – 2022.05.06
5	2022/05	10	129	62	2022.05.18 – 2022.05.27
6	2022/06	10	132	46	2022.06.08 – 2022.06.17
7	2022/07	10	83	35	2022.06.21 – 2022.06.30
8	2022/08	10	137	61	2022.07.19 – 2022.07.28
9	2022/09	10	190	61	2022.08.16 – 2022.08.25
10	2022/10	10	161	47	2022.09.06 – 2022.09.15
11	2022/11	10	190	84	2022.10.11 – 2022.10.20

සිදු කරන ලද කෙටි කාලීන පාඨමාලාවල සාරාංශය			
එක් දින	දෙදින	තෙදින	පස් දින හෝ ඊට වැඩි
28	4	2	16

2. සිදු කරන ලද රු. 50,000.00 ට වැඩි ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියාවන්

විස්තරය	වියදම (රු.)
තට්ටු නිවාස වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම	625,138.18
ගල් හට් නිවාස සඳහා කොමොඩ් 5 ක් මිලදී ගැනීම	125,000.00
69 කාර්යාලයේ වැසිකිලි වල අලුත්වැඩියා කිරීම	268,182.15
ආපන ශාලාව අසලින් ගලා බැස යන කානුව අලුත්වැඩියා කිරීම	162,750.00
දෛනික නඩත්තු කටයුතු සඳහා ජලනල හා විදුලි උපකරණ මිලදී ගැනීම	304,180.00
ඡායාරේඛණමිතික කාමරයේ බිම අලුත්වැඩියා කිරීම	480,426.72

3. වසර තුළ දී රු.375,675.41 ක මුදලක් වැය කර වාහන 5 ක රු. 50,000.00 ඉක්ම වූ අලුත්වැඩියාවන් සිදුකර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ඒආර්අයි/එෆ්/එස්ඩී/2/22/12

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 07 JUN 2023 දින

ගණන්දීමේ නිලධාරී

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මු.රෙ 135 සහ මු.රෙ. 143 ප්‍රකාරව ආදායම් තක්සේරු කිරීම, එකතු කිරීම සහ ප්‍රතිග්‍රහණය කිරීම සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.

(ආ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 (කාර්ය සාධනය වාර්තා කිරීම) ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අර්ධ වාර්ෂික ආදායම් වාර්තා නියමිත කාල සීමාව අවසන් වූ දින සිට දින 15 ක් තුළදී අදාල චක්‍රලේඛයෙහි ආකෘති පත්‍ර අංක 02 භාවිතා කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2003.02.04 ආදායම් සංකේතාංකයට අදාළ ආදායම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ප්‍රථම සහ දෙවන අර්ධ වර්ෂයේ ආදායම් පිළිවෙළින් රු. 155,689,759 ක් සහ රු. 163,878,332 ක් වී තිබුණි.

(ඇ) මු.රෙ. 128(2)(ඇ) ප්‍රකාරව තමා වගකීමට බැඳී සිටින විවිධ ආදායම් ශීර්ෂ, උප ශීර්ෂ විෂයයන් යටතේ එක් එක් මුදල් වර්ෂයේ ජූනි 30 වැනි දිනට හා දෙසැම්බර් 31 වැනි දිනට හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා (හිඟ මුදල් නොමැතිනම් " හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය ") පිළියෙළ කොට පිළිවෙළින් ජූලි 31 සහ ඊළඟ මුදල් වර්ෂයේ ජනවාරි 31 වැනි දාට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර පිටපතක් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවට ද යොමුකල යුතු වුවත් 2023 අප්‍රෙල් 30 දින වන විටත් අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 වන වගන්තිය අනුව බැඳීම් යනු භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අරමුණින් හෝ වැඩ කොන්ත්‍රාත් ඉටුකරවා ගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන් සමඟ එළඹෙන ලද භාණ්ඩ, සේවා හා වැඩ සම්බන්ධ ගිවිසුම්/ඇණවුම්වල වටිනාකම ලෙසත්, බැරකම් යනු විධිමත් පරිදි ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා සහ සම්පූර්ණ කර ඇති බවට සහතික කර ඇති කොන්ත්‍රාත් සඳහා තවදුරටත් ගෙවිය යුතු වටිනාකම ලෙසත් නිර්වචනය කර ඇත. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට අනුව මුළු එකතුව රු. 45,917,091.97 ක් වූ මෙහෙයුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇති සියලුම වටිනාකම් බැඳීම් ලෙස හඳුනාගෙන තිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	රජයේ මායිම් ගල් ආඥා පනත IV ඡේදය	
	(i). 4.13 හා 4.14 වගන්ති	මැනුම් සහයකයින් යොදා මායිම් ගල් සැකසීමේදී එක් අවස්ථාවක මායිම් ගල් 1000 කට වඩා තැනීමේදී අදාළ පළාත් මැනුම්පතිගේ අනුමැතිය ලබා ගත යුතු වුවද එසේ අවසර ගෙන නොතිබුණි.
	(ii). 4.15 වගන්තිය	මායිම් ගල් තැනීම මිනින්දෝරු අධිකාරිගේ අධීක්ෂණය යටතේ මැනුම් ඕවසියර් වෙත භාර දිය යුතු අතර, සිමෙන්ති, වැලි හා මි.මී.13 ප්‍රමාණයේ චිප් ගල් 1:2:3 යන අනුපාතයට යොදා කොන්ක්‍රීට් මිශ්‍රණය සකස් කරන්නේද යන්න පිළිබඳව නිතර පරීක්ෂා කළ යුතු වේ.මැනුම් ඕවර්සියර් විසින් එක් එක් දිනයේ තනන ලද මායිම් ගල් ගණන්, ඉතිරිව තිබෙන ද්‍රව්‍ය සමග පරීක්ෂා කර බලා ඒ පිළිබඳව ගිණුම් තබා ගත යුතු වුවද, කදුරුවෙල, ගිරිතලේ හා හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ)	අංක 01/2020 හා 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් සංශෝධිත මු.රෙ. 113 (6) (ආ) සහ එහි දැක්වෙන මාර්ගෝපදේශය	ලබාගත් ණය මුදල ගෙවා අවසන්වීමට පෙර සේවය අතහැරයාම සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය මැතිවරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා පදිංචිය සහ ඔවුන්ගේ වත්කම් පිළිබඳ තහවුරුවක් ලබාගෙන නීතිපති මඟින් ණය මුදල් අයකරගැනීමට කටයුතු කල යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වැඩ තහනම් කර ඇති නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 456,861 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර ඉන් රු. 330,963 ක් හෙවත් සියයට 72.44 ක් වර්ෂ 05 කට වැඩි කාල පරාසයකට අයත් ඒවා බව නිරීක්ෂණය විය. තවද සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 102 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,546,630 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර ඉන් රු.2,809,654හෙවත් සියයට 61.8 ක් වර්ෂ 05 වැඩි කාල පරාසයකට අයත් ඒවා විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

"ඉඩම් තොරතුරු සැපයීමේ සඳා ප්‍රමුඛයා" වන දැක්ම පෙරදැරි කර ගෙන"ව්‍යක්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම" මෙහෙවර කර ගත්, දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කරන අතර එනම් මායිම් ගල් දමා ව්‍යවස්ථාපිත හේතූන් මත සිදු කරන මැනුම් සඳහා මාසික ඉලක්කය ඉඩම් කවිටි 20ක් (දීමනා පත්‍ර ලබා දිය හැකි ඉඩම්) වන අතර ඉඩම් කැබලි නම් 30 ක් ලෙස වර්ෂ 16 කටත් පෙර පිහිටුවාගත් සම්මතය (Norms), මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර පරිදි ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම යාවත්කාලීන වී නොතිබුණු නමුත්, 2018 සිට 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් යටතේ නවීන

මැනුම් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 430 ඉක්මවූ මුදලක් වැය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

වර්ෂය	වියදම
	රු. මිලියන
2021	248
2020	73
2019	24
2018	85
එකතුව	**430**

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මැනුම් වර්ග 09ක් යටතේ ලැබී ඇති මුළු මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව 98,818 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කල සංඛ්‍යාව 76,142 ක් විය. ඒ අනුව එදිනට නිම නොකල සංඛ්‍යාව 22,676 ක් හෙවත් සියයට 22.95ක් විය.

3.2 විදේශ ආධාර ව්‍යාපෘති

සමෝධානික ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා (Land Information Services System in Sri Lanka) දේශීය අරමුදල් වලින් රු.20,000,000 ක්ද, විදේශීය අරමුදල් වලින් රු. 174,800,000 ක්ද වශයෙන් එකතුව රු.194,800,000 ක් වෙන්කලද විදේශ ණය අරමුදල් නොලැබීම මත සමාලෝචිත වර්ෂය තුලදි අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්හැර තිබුණි.

3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

සමෝධානික ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා වූ කාර්යාල කාමරයට රු. 785,400 ක් වැයකර වායු සමීකරණ යන්ත්‍ර 4 ක් සවිකර , එහි ජනෙල් තිර රෙදි යෙදීමට රු. 121,900 ක් ලෙස එකතුව රු. 907,300 ක වියදමක් දරා ඇතත් එම කාමරය භාවිතයට නොගෙන 2022 මාර්තු 30 දින සිට මෙම වාර්තාවේ දිනය තෙක් නිෂ්ක්‍රියව පැවැතිණි.

3.4 ප්‍රසම්පාදනයන්

(අ) දෙපාර්තමේන්තුව විසින් GNSS RECEIVER (8C) උපකරණ 30 ක් සුලෙකෝ පුද්ගලික සමාගමෙන් මිලදී ගැනීමට 2021 සැප්තැම්බර් 15 දින ගිවිසුම් ගත වී ඒ සඳහා ගෙවිය යුතු රු. 66,000,000 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන එම උපකරණ තොගය සැපයීමට අපොහොසත් වීම මත ඇණවුම අවලංගු කිරීම නිසා මෙම තැන්පතු මුදල 2022 සැප්තැම්බර් 14 දින නැවත රජයේ ආදායමට බැර කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මැනුම් උපකරණ මිලදී ගැනීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 පරිදි ඇස්තමේන්තුවක් හා 4.2.2 වගන්තිය පරිදි කාලසටහනක් පිළියෙල කර, 2.5.1 (ඇ) වගන්තියට අනුව ප්‍රසම්පාදන කමිටු පළමු රැස්වීමේදීම ප්‍රසම්පාදනය පිළිබඳව ප්‍රචාරක දැන්වීම් පලකිරීම, ලංසු කැඳවීම් ලේඛන විකිණීම, ලංසු කැඳවීම අවසන් කිරීම හා විවෘත කිරීම සිදු කළ යුතු ආකාරය සහ දිනයන් නීර්ණය කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකළ යුතු වුවත්, 2021 මාර්තු 10 දින රැස්වීමේදි ලංසු කැඳවන ආකාරය පමණක් අනුමත කර තිබුණද, දිනයන් තීරණය කර නොතිබුණි.

(ii)

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 වගන්තිය අනුව ලංසු විවෘත කිරීම නියමිත ආකෘති පත්‍රයට අනුව වාර්තා කළයුතු වුවද, නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේදී Yes /No ලෙස සටහන් කළ යුතු අවස්ථා පැහැදිලිව හඳුනාගත හැකි පරිදි සටහන් කර නොතිබුණි.එනම් එක උඩ එක ලියා තිබීම, Y /N වෙනුවට - /+ සලකුනු යොදා තිබීම හා කාබන් පෑනෙන් කුරුටු ගා තිබීම හේතුවෙන් ලංසු විවෘත කරන අවස්ථාවේදි නොසැලකිලිමත් ලෙස කටයුතු කර තිබුණි.

(iv) 2021 සැප්තැම්බර් 10 දින ඇණවුම ලබාදී ඇති අතර එය ලද වහාම නියමිත දිනට පෙර සැපයීමට සැපයුම්කරු කටයුතු කල යුතු වුවද, සුලේකෝ සමාගම 2021 නොවැම්බර් 03 දින සිට දෙසැම්බර් 03 දින දක්වා අවස්ථා 5 කදී ණයවර ලිපි විවෘත කිරීමට ඇණවුම් ලබා දී තිබූ අතර , මිලදී ගැනීම් ඇණවුම ලබාදුන් දින සිට ණයවර ලිපි විවෘත කිරීම, දින 53 සිට 82 දක්වා කාල පමාවකින් පසුව සිදුකර තිබුණි. ණයවර ලිපි 5 ම විවෘත කරන අවස්ථාවේදී ඇ.ඩො. අගය රු. 203 ක් වී තිබූ අතර, එය 2022 මාර්තු 07 වන දින දක්වාම එනම් ගිවිසුම අත්සන් කල දින සිට මාස 6 කට ආසන්න කාලයක් එකම අනුපාතයක් පැවති බව නිරීක්ෂණය විය.

(v) ඉහත සැපයුම නිසි පරිදි සිදු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් හෝ ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් සැපයුම් කරුගෙන් අලාභයන් අයකර නොතිබුණි.

(ආ) උඩුගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ඇති අංක LE – 3696 දරන වාහනය සඳහා 2021 මාර්තු 19 දින ලද මිල ගණන් මත පදනම්ව පලාත් ප්‍රසම්පාදන කමිටුව විසින් ලබාගත් තීරණ අනුව, අවම මිල ඉදිරිපත් කර තිබුණු ආයතනය වෙත අලුත්වැඩියාව යොමු කර ඒ සඳහා රු. 818,600 ට අමතරව රු.85,490 ක අමතර වියදමක්ද සමග එහි මුළු පිරිවැය රු. 904,090 ක් වී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1. (ආ) සංශෝධිත වගන්තිය (Supplement 38) ප්‍රකාරව රු.500,000 ඉක්මවා ඇති විටෙක ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන සිදු කළ යුතු අලුත්වැඩියාවක් වුවද එවැනි අනුමැතියක් ගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

(අ) මැනුම් කටයුතු සඳහා 2021 දෙසැම්බර් 30 දින ඒකකයක් රුපියල් 915,000 බැගින් පූර්ණමාන (Total Station) ඒකක 30 ක් රුපියල් 27,450,000 ක් වැයකර භූමිටෙක් ආයතනයෙන් මිලදී ගෙන ඒකක 18 ක් 2022 මැයි හා ජුනි අතර කාලය තුලදීද , ඒකක 03 ක් 2022 නොවැම්බර් මසය තුළදී බෙදාහැර ඉතිරි ඒකක 09 වර්ෂයකට අධික කාලයක් නිෂ්ක්‍රියව තබා ඉන් උපකරණ 08 ක් 2023 ජනවාරි හා මැයි 26 කාලය තුලදී බෙදා හැර රු. 915,000 ක් විටිනා පූර්ණමාන 01 ක් 2023 මැයි 26 දිනවන විටත් ගබඩාවේ නිෂ්ක්‍රියව පැවති බව විගණනයේදි නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවේ, ගිරිතලේ කාර්යාලය හා නිල නිවාසය ඉදිකිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.42,343,300 ක කොන්ත්‍රාත් වටිනාකමට පවරා එය 2017 වසරේ වැඩ ආරම්භකර 2022 මැයි 05 දින එහි සම්පූර්ණ කර අඩුපාඩු සහිතව දෙපාර්තමේන්තුව වෙත බාරදී තිබුණි. 2022 ජුනි 08 දින එම ගොඩනැගිල්ලේ තවදුරටත් පැවති අඩුපාඩු පිළිබඳව එම කාර්යාලයේ මිනින්දෝරු අධිකාරි විසින් දන්වා තිබුණද 2022 සැප්තැම්බර් 16 දින දක්වාද එම අඩුපාඩු සකස් කර නොතිබුණි. එහෙත් නිල නිවස ඉදිකිරීම සම්බන්ධ අත්සන් කර තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුවට පෙර, සහ පසු නඩත්තු කාලය තුළ සිදු කළ යුතු කටයුතු සඳහන් කර තිබුණත් ඒවාට අනුගතවී කටයුතු කර තිබුණු බවක් හා එම කටයුතු නිසියාකාරයෙන් සිදුවූවාද යන්න පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණයක්, පසු විපරමක්, සෝදිසි කිරීමක් හා නිසියාකාරයෙන් යාවත්කාලීන විසඳුම් ලබා ගැනීමක් සිදු කර නොතිබුණි. රැඳවුම් මුදල් නිදහස් කිරීමට පෙර සියලු අඩුපාඩු සකස් කරගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 ජූනි 26 දින විවෘත කර තිබූ කුඩ්ඩවෙලි සංචාරක නිවාසය සඳහා රු. 12,030,000 ක් සහ ඊට අමතරව උද්‍යාන අලංකාරයට හා එහි විදුලිය සැපයීමට රු. 106,296 ක මුදලක් වැය කර තිබුණි.එම ඉදිකිරීම සම්බන්ධයෙන් පවතින පහත දුර්වලතා හා අඩුපාඩු මේ දක්වා නිවැරදි කර නොතිබුණි.

(i). A හා B ගොඩනැගිලිවලට ඇතුළුවීමේ ප්‍රධාන දොරවල් දෙක හා කාමර 04හි ප්‍රධාන දොරවල් ශක්තිමත් උපකරණ යොදා සවිකර නොතිබුණු අතර ඒවා විදුරුවලින් සකස් කර තිබූ අතර , A ගොඩනැගිල්ලෙහි ප්‍රධාන දොර විගණන දිනය වන 2022 සැප්තැම්බර් 14 වන විටත් සම්පූර්ණයෙන් ගැලවී තිබුණි. එහි කාමර වල දොරවල් විදුරුව යොදා තිබීම හේතුවෙන් අභ්‍යන්තරය එළියට නිරාවරණය වන බැවින් තිරරෙදි යෙදීමට රු. 443,800 ක මුදලක් වැය කර ඇතත් එම දොරවල් සඳහා Door arm යොදා තිබීම නිසා එම තිරරෙදි නිවැරදිව සවි කිරීමට නොහැකිව පැවතුන බවද නිරීක්ෂණය විය.

(ii). ගොඩනැගිලි දෙකෙහිම ඉහළ මහලේ ඇති කාමරවල වෙරළ දෙසට ඇති පැත්තේ කොරිඩෝවක් හෝ බිත්තියක්ද නොතිබුණි. එම පැත්තේ ඉහළ කොටසට විදුරු සහ පහළ කොටසට බිත්තිය වෙනුවට Color MDF board එකක් සහිතව ජනෙල් සවි කර තිබුණි.

(iii). ගොඩනැගිලි දෙකෙහිම විද්‍යුත් පරිපථ නිසි පරිදි නොවූ අතර කාමරවල වායු සමන යන්ත්‍ර පැවතියද ඒවා ක්‍රියා කාරී තත්ත්වයේ නොපැවතුණි.

(iv). නාන කාමරවල වතුර මල් හා කරාම තුළින් ප්‍රමාණවත් ජල සැපයුමක් නොතිබුණි.

(ඇ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022 ඔක්තෝබර් 05 වන දින නිකුත් කල අංක: SA/GFS/01/01/08-volume iii සමාංක යටතේ එවන ලද ලිපිය ප්‍රකාරව බදුල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල ගොඩනැගිල්ල රු. 9,878,550 කට තක්සේරු කොට ගිණුම් තබාගන්නා ලෙස දන්වා තිබුණද, එම අගය වත්කම් පිරිවැයට ඇතුළත් කර නොතිබුණි.

3.6 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

කන්තලේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ අංක LE – 3702 දරන වාහනයේ බ්‍රේක් හෝස් එකක් පුපුරා යාම හේතුවෙන් 2022 මාර්තු 08 වන දින PF-7176 දරන වාහනය මගින් ඇදගෙන ගරාජය වෙත රැගෙන ගිය බව ධාවන සටහන්වල සඳහන් කර තිබුණද 2022 මාර්තු 30 දින ඒ සඳහා වූ බිල්පත්‍රයේ රු. 218,800 ඇස්තමේන්තුවට අදාළ ටින්කරින් සහ පේන්ටින් වැඩ කටයුතු සිදු කළ බවට 2022 මාර්තු 30 දිනැති බිල්පත් මිනින්දෝරු අධිකාරීගේ සහතික කිරීම මත මාර්තු 31 දින දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ගෙවීම් කර ඇතත් , වාහනය ගරාජයේ සිට ප්‍රාදේශීය කාර්යාලය වෙත 2022 අප්‍රේල් 30 දින රැගෙන ගොස් තිබුණු බව එහි දෛනික ධාවන සටහන් අනුව නිරීක්ෂණය විය. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි (ත්‍රිකුනාමලය) විසින් දෙන ලද පිලිතුර අනුව 2022 මාර්තු 30 දින වනවිට අලුත්වැඩියා කටයුතු අවසන් වී නොමැති හෙයින් එදිනෙන් පසු පලමු කාර්තුවේ ප්‍රතිපාදන අවසන් වන බැවින් ඒ සඳහා චෙක්පත ලියා තබාගෙන වාහනය අලුත්වැඩියාව අවසන් වූ 2022 අප්‍රේල් 25 දින චෙක්පත ලබා දුන් බවත් සඳහන් කර තිබුණි. ඒ අනුව අලුත්වැඩියා කටයුතු අවසන් වීමට මසකට පමණ පෙර ගෙවීම් ක්‍රියාවලිය සම්පූර්ණ කර මුදල් රැඳවා ගෙන තිබීමත් , තවද මෙම වාහනයේ බ්‍රේක් හෝස් අලුත්වැඩියා වෙනුවෙන් 2022 මැයි 17 දින නැවත ගෙවන ලද රු. 10,650 වියදම මුල් ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබීමත් විගණනයේදී පිළිගැනීමට සාක්ෂි නොමැති ගනුදෙනුවත් බව නිරීක්ෂණය විය.

3.7 පාඩු හා හානි

(අ) සමාලෝචිත වර්ෂයේ දී සිදු වූ වාහන අනතුරු 08 ක අලාභවල එකතුව රු.480,675 ක්ද, 1998 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සිදු වී ඇති වාහන අනතුරු 17 කට අදාළව එකතුව රු.3,992,991 ක්ද, හා 1989 සිට 2022 වර්ෂය දක්වා මැනුම් උපකරණ හා වෙනත් හානිවීම් සම්බන්ධ සිද්ධීන් 13 කට අදාළව එකතුව රු.2,285,369 ක්ද වශයෙන් එකතුව රු.6,759,035ක කපා නොහළ හා අයකරගත යුතු ඉදිරියට ගෙන යන ශේෂ පැවතියද එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම එම වටිනාකම් ශේෂය තුළ වසර 03 ත් 09 අතර පරාසයක වූ රු. 2,161,107 ක්ද, වසර 10 ත් 30 ත් අතර පරාසයක වූ රු.1,322,930ක් විය.

(ආ) මායිම් ගල් ආඥා පනතේ 4.19 වගන්තිය ප්‍රකාරව හරි වැරදි බැලීමේ පහසුව සඳහා එක් එක් මධ්‍යම මායිම් ගල් ගබඩාවක තිබෙන මායිම් ගල්, සියයේ (100) ඒකක වශයෙන් ගොඩ ගැසිය යුතු අතර එසේම මායිම් ගල් ආඥා පනතේ 4.43, 4.44 සහ 4.45 වගන්ති ප්‍රකාරව ඒවා කැඩී යාම සම්බන්ධයෙන් සිදු වන අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. නමුත් ත්‍රිකුණාමලය ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයේ මායිම් ගල් පිළිබඳව භෞතික පරීක්ෂා කිරීමේ දී ඒවා නිසි පරිදි ගබඩා කර නොතිබුණු අතර ඒ හේතුවෙන් සැලකිය යුතු මායිම් ගල් ප්‍රමාණයක් කැඩී යාම සම්බන්ධ විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් සිදුව ඇති බවක්ද නිරීක්ෂණය නොවීය.

3.8 අනාර්ථික ගනුදෙනු

(අ) ගුවන් මැනුම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් 31 දින රු. 8,868,900 ක් ගෙවා දේශීය නියෝජිත ආයතනයක් වන සීමාසහිත භූමි ටෙක් (පෞද්ගලික) සමාගමෙන් මිනිසුන් රහිත ගුවන් යානයක් (Unmanned Aerial Vehicle) මිළදි ගෙන තිබුණි. 2017 අගෝස්තු 03 දින හබරණ ප්‍රදේශයේදී යාන්ත්‍රික දෝෂයකට ලක්ව තිබුණි. එය අලුත්වැඩියා කිරීමෙන් පසු නැවත වරක් 2019 අප්‍රේල් 18 දින එහි විදුලි කෝෂය අක්‍රියවීමත්, 2019 ජූලි 17 දින වන විට හයිපර් එස්. ආර්. (Hipper SR) ටොප් කොන් (Top con) වර්ගයේ ජී.එස්.පී.(GSP) උපකරණය ක්‍රියා විරහිත වීමත්, 2021 මාර්තු 04 දින වන විට යානය සඳහා ලබාදී තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍ර තිරයේ දෝෂයක් පවතින බවද වාර්තා කර තිබුණි. ඉන් පසු 2022 අප්‍රේල් 26 දින යානයේ අවර පෙත්ත සවි කර තිබූ රබර් පටිය කැඩී යාම හෝ ගැලවී යාම නිසා එය හානි සිදු වී තිබුණි. මෙම යානය මිලදී ගෙන වර්ෂ 07 ක් ඉක්මවා තිබීම හා වසර දෙක හමාරක පමණ කාලයක් මෙය ගුවන් ගත කර නොමැති වීම නිසා යානය ගර්හිත කිරීමට සුදුසු බවට 2023 මැයි 08 දිනැති ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු (විශේෂ මැනුම් හා තත්ත්ව පාලන) විසින් දන්වා තිබුණි. මෙම යානය 2016 වර්ෂයේ සහ 2017 අගෝස්තු දක්වා එනම් වසර 2 ½ ක කාලයක් පමනක් මිනුම් කටයුතු සඳහා භාවිතා කර තිබුණද එ තුලින් ඵලදායී සේවාවක් අත්කර ගෙන නොතිබූ අතර ඒ අනුව මෙය ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

(ආ) ත්‍රිකුණාමලය ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයේ භාවිතයක් නොමැතිව පවතින පෙරසවි කඳවුරු 07 ක් වෙනුවෙන් එක් කඳවුරක් සඳහා මාසිකව රු. 50 බැගින් වර්ෂයක් සඳහා වූ රු. 4,200 ක්ද, අංක 162 දරන පෙරසවි කඳවුරේ 2019 වර්ෂයේ සිටි නිලධාරියා විසින් එහි ජල බිල්පත ගෙවා නොතිබීම හේතුවෙන් ජල සැපයුම විසන්ධි කර තිබීම නිසා .ඒවා නැවත යාවත්කාලීන කිරීම වෙනුවෙන් 2020 නොවැම්බර් 27 දින දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවලින් ඒ සඳහා රු.10,362 ක් ගෙවා තිබූ අතර මෙය ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

3.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහ ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු බවද, මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලබන වෙනත් ඕනෑම නිලධාරියකු විසින් තමන් වෙත අමතනු ලබනු ලිඛිත හා විමසීම් පිළිබඳව අප්‍රමාදව ක්‍රියා කොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ හා ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම බව සඳහන් වුවද 2022 වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද විගණන විමසුම් 01 ක් සඳහා මෙම වාර්තාව නිකුත් කරන දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණු අතර, පිළිතුරු ලබා දීමේදී ද දින 74 සිට 103 දක්වා වූ පරාසයක කාල පමාවක් සිදුව තිබුණි.

3.10 කළමනාකරණ දුර්වලතා

(අ) සුලු මුදල් ලේඛණය, ඉන්ධන අත්තිකාරම් ලේඛණය සහ මායිම්ගල් ලේඛණය යන ලේඛන සඳහා පොදුවේ භාවිතා කළ හැකි ආකෘතීන් පැවතුණද, එක් එක් කාර්යාල ඔවුන්ට ආවේණික වූ ආකෘතීන් සකස් කර භාවිතා කර තිබුණි. උදාහරණ ලෙස ගිරිතලේ,ත්‍රිකුණාමලය, කන්තලේ,පොළොන්නරුව හා කදුරුවෙල යන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය විගණනයේදී පෙන්වා දිය හැකිය.

(ආ) පොලොන්නරුව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ නිළ නිවස වෙනුවෙන් වූ විදුලි හා ජල බිල්පත් එම නිවස ලිපිනයන් වෙත නිකුත් නොකර ඒවායේ පදිංචි නොවූ වෙනත් පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන්ට නිකුත්වන අතර ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු නොකල අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.උදාහරණ ලෙස විදුලි බිල්පත ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ නිළ නිවසේ විදුලි බිල්පත අයි.ඩබ්ලිව්.ඒ.එස් වික්‍රමාරච්චි, නො 07, මහවැලි නිවාස සංකීර්ණය, නව නගරය, පොළොන්නරුව යන පුද්ගලයකුගේ නමටද, ජල බිල්පත ආර්.එම්.එස්.බී. රත්නායක, නො 07, මහවැලි නිවාස සංකීර්ණය,නව නගරය, පොළොන්නරුව යන පුද්ගලයකුගේ නමටද ලැබී තිබෙන අතර, තාක්ෂණික හා පරිපාලන නිලධාරීගේ නිළ නිවසේ විදුලි බිල්පත අයි.ආර්.පී.එස්. ධර්මදාස යන පුද්ගලයකුගේ නමටද, ජල බිල්පත මිනින්දෝරු අධිකාරී, නො 13, පොලිස් නිල නිවාස, පොළොන්නරුව යන ලිපිනයටත් ලැබී තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවා වර්ගය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	1,144	951	267	0
තෘතීයික මට්ටම	83	27	12	0
ද්විතීයික මට්ටම	1,172	995	120	0
ප්‍රාථමික මට්ටම	4,890	3,553	1,339	0
තාවකාලික(බහුකාර්ය)	0	170	-	170
එකතුව	7,289	5,696	1,738	170

(අ) අනුමත කාර්යය මණ්ඩලයට සාපේක්ෂව ජ්‍යෙෂ්ඨ මට්ටමේ සියයට 23 ක්, තෘතීයික මට්ටමේ සියයට 14 ක්, ද්විතීයික මට්ටමේ සියයට 10 ක් හා ප්‍රාථමික මට්ටමේ සියයට 27ක් වශයෙන් සමස්ත කාර්යය මණ්ඩල පුරප්පාඩු සියයට 24 ක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් මිනින්දෝරු කාර්යාලයේ ගණකාධිකාරි හා තාක්ෂණ නිලධාරී යන තනතුරු දෙකම පුරප්පාඩු වී තිබුණි.

(ඇ) ත්‍රිකුණාමල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ තාක්ෂණ සහ පරිපාලන නිලධාරී යන තනතුරු වලට අදාළ රාජකාරී කටයුතු සියල්ලම සිතියම් තාක්ෂණ නිලධාරී විසින් ඉටු කර තිබුණි.

පී.කේ.එම්.පී.නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය